**සංවර්ධන ලොතරැයි මණ්ඩලය**

වාර්ෂික වාර්තාව 2023



## අභියෝගතා තුළින්

# සාර්ථකත්වයට

අභියෝගතා තුළින්

# සාර්ථකත්වයට

පෙර නොවූ විරූ ගෝලීය අභියෝග හමුවේ, අභියෝග ජය ගනිමින් ශ්‍රී ලාංකික ජන ජීවිතය නඟා සිටුවීමට දායක වූ ශක්තිමත් පවුරක් ලෙස නැගී සිටින්නට සමත් වූවා. පැහැදිලි දැක්මක් සහ ක්‍රියාශීලි නායකත්වයෙන් යුත් කණ්ඩායමක් සමඟින්, පාරිභෝගික කේන්ද්‍රීය ප්‍රවේශයක් ද සමඟ නව සංවර්ධන මාවත් විවෘත කරමින් සංවර්ධන ලොතරැයි මණ්ඩලය සිය පරිවර්තනීය ගමන ආරම්භ කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස නූතන වෙළඳපොළ තුළ තම ප්‍රගමනය එකසේ පවත්වා ගනිමින් විශිෂ්ඨ සාර්ථකත්වයක් අත්කරගත් වසරක් සනිටුහන් කිරීමට සමත් විය.

# අන්තර්ගතය


ආයතනික තොරතුරු | 4

අපගේ දැක්ම සහ මෙහෙවර | 5

අපගේ ඉතිහාසය සැකෙවින් | 6

වැදගත් සන්ධිස්ථාන | 8

මූල්‍යමය වැදගත් සිදුවීම් | 10

සභාපතිතුමාගේ පණිවුඩය සහ ප්‍රගති වාර්තාව 2023 | 12

අධ්‍යක්ෂ මණ්ඩලයේ සමාලෝචනය | 15

අධ්‍යක්ෂ මණ්ඩලය 2023 | 16

වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය | 17

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ විස්තර 2023 | 18

කළමනාකරණ කණ්ඩායම | 19

කණිෂ්ඨ කළමනාකරුවන් | 21

මෙහෙයුම් සමාලෝචනය | 24

නිෂ්පාදන කළඹ විශ්ලේෂණය | 29

තිරසාරභාවය පිළිබඳ වාර්තාව | 35

දේශීය පුහුණු වැඩසටහන් | 37

2023.12.31 දිනට අනුමත සේවක සංඛ්‍යාව | 40

ආයතනික පාලනය | 42

අවදානම් කළමනාකරණ වාර්තාව | 45

විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව | 46

**මූල්‍ය වාර්තාව**

ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව | 48

විගණක වාර්තාව 2023 සහ කළමනාකාරිත්වය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග | 58

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය | 69

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය | 70

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | 71

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය | 72

ගිණුම්කරණ ප්‍රතිපත්ති | 73

අංශමය වාර්තාව | 78

අවසන් ගිණුම් පිළිබඳ සටහන් | 79

දස වසරක සාරාංශය | 89

සටහන් | 90


අපගේ වෙබ් අඩවිය තුළින් මෙම වාර්ෂික වාර්තාව කරා පිවිසැයි හැකිය

# ආයතනික තොරතුරු

**මණ්ඩලයේ නම**

සංවර්ධන ලොතරැයි මණ්ඩලය

**නීතිමය ස්වරූපය**

මෙම මණ්ඩලය 1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත නැමති පාර්ලිමේන්තු පනත යටතේ සංස්ථාගත කර ඇත

**ආරම්භ කළ දිනය**

1983 ජනවාරි 19 දින

**ලියාපදිංචි කාර්යාලය**

අංක 356, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත, යුනියන් පෙදෙස, කොළඹ 02

**දුරකථනය**

0112 333 546-8, 0114 824 824

**ෆැක්ස්**

0112 333 545

**විද්‍යුත් තැපෑල**

info@dlb.lk

**වෙබ් අඩවිය**

www.dlb.lk

**බදු හඳුනාගැනීමේ අංකය**

409089844

**වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය**

**අජිත් ගුණරත්න නාරගල මහතා**
සභාපති/ප්‍රධාන විධායක නිලධාරී

**ඒ එම් පී එම් බී අතපත්තු මහතා**
ලේකම්, වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යංශය
අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය

**ඩබ්ලිව් ඒ සරත් කුමාර මහතා**
භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්,
මුදල් අමාත්‍යංශය.
ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්,
ජනාධිපති ලේකම් කාර්යාලය.
ලේකම්, ජනාධිපති අරමුදල.
අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය.

**කේ ඒ එච් සී පුබුදුසිරි මෙනවිය**
අධ්‍යක්ෂ, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව,
මුදල් අමාත්‍යංශය
අධ්‍යක්ෂ සංවර්ධන ලොතරැයි මණ්ඩලය

**ජෙනට් ජයවර්ධන මහත්මිය**
නීතිඥ - අධ්‍යක්ෂ
සංවර්ධන ලොතරැයි මණ්ඩලය

**විගණක**

විගණකාධිපති

**බැංකුකරුවන්**

මහජන බැංකුව
ලංකා බැංකුව
සම්පත් බැංකුව පීඑල්සී
හැටන් නැෂනල් බැංකුව

# අපගේ දැක්ම සහ මෙහෙවර

## දැක්ම

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම වාසනාව උදා කිරීමේ රාජ්‍ය ආයතනයක් බවට පත්වීම.

## මෙහෙවර

නවීන තාක්ෂණය යොදා ගනිමින්, නව්‍යතාවයෙන් යුතු ආකර්ශනීය ලොතරැයිපත් ඉදිරිපත් කරමින් විශ්වාසය තහවුරු කරන අතරතුර සෑම කල්හිම පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් සපුරාලීම.

## ඉලක්ක

- වෙළෙඳපොළ කොටස වැඩි කර ගැනීම.
- ජනාධිපති අරමුදලට ලබා දෙනු ලබන දායකත්වය උපරිම කිරීම.
- නවීන තාක්ෂණය අත්කර ගැනීම සහ ඵලදායී ලෙස උපයෝගී කර ගැනීම.
- පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් ඉටු කිරීම.

## අපගේ මූලික සාරධර්ම

| | |
|---|---|
| **සුපිලිපන්බව** | අප විසින් ඉදිරිපත් කරන ලොතරැයි හා අප ව්‍යාපාරික කටයුතුවල නිරත වන ආකාරය සාධාරණ, අවංක සහ විශ්වාසනීය වේ. |
| **සුභවාදී ආකල්පය** | ලොතරැයි ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී ඔවුන් හට මුහුණපෑමට සිදුවන සෑම අභියෝගයකටම සුභවාදී එළඹුමක් සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සේවකයින් තුළ පවතී. |
| **ප්‍රතිඵලදායක බව** | ස්වකීය කාර්යභාරයන් පිළිබඳව සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සේවකයින් තුළ මනා විශ්වාසයක් පවතින අතර ඔවුන් දෙන ලද ඉලක්ක කාර්යක්ෂමව අත්පත් කර ගැනීම සඳහා නිසි අවධානයකින් යුතුව කටයුතු කරති. |
| **නව්‍යතාවය** | සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සේවකයින් ව්‍යාපාරික සංවර්ධනය සඳහා වන අදහස් සොයා යමින් තරගකාරී වෙළඳපොළ වෙනස්වීම් හමුවේ කඩිනමින් ප්‍රතිචාර දක්වති. |
| **කණ්ඩායම් හැඟීම** | සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සේවකයින් විවෘතභාවය, එකිනෙකා කෙරෙහි ගෞරවය සහ පුද්ගල සංවර්ධනය ඔස්සේ ආයතනික ඉලක්ක සපුරාගැනීමෙහි ලා එකාවන්ව කටයුතු කරති. |
| **විශිෂ්ඨත්වය කරා නැඹුරුවීම** | සංවර්ධන ලොතරැයි මණ්ඩල සේවකයන් අඛණ්ඩවම සිය සේවා තත්ත්වයන් උපරිම මට්ටම කරා රැගෙන ඒම සඳහා කැපවීමෙන් ක්‍රියා කරති. |

# අපගේ ඉතිහාසය සැකෙවින්

අද දැයක ජීවිත එලිය කරන සංවර්ධන ලොතරැයි මණ්ඩලය එදා 1983 වර්ෂයේදී ස්ථාපිත කරනු ලබන්නේ සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානය ලෙසයි. විවිධ අභියෝග මධ්‍යයේ උසස් අධ්‍යාපනයට යොමුවන සිසු දරුදැරියන්ට අත්වැසිල්ලක් පිරිනමන ජනාධිපති අරමුදල සහ මහපොළ ශිෂ්‍යත්ව අරමුදල සඳහා අරමුදල් සැපයීම එය පිහිටුවීමේ මුඛ්‍ය අරමුණු විය.

මෙම පරමාර්ථය අනුව යමින්, ආචාර්ය වික්‍රම වීරසූරිය මහතා ක්ෂණික ලොතරැයි යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම සඳහා පෞද්ගලික හා රාජ්‍ය ආයතන ගණනාවක සහාය ඉල්ලා සිටියේය. මෙම වැඩසටහන මගින් විවිධ මූල්‍ය හා සමාජ සංවර්ධන වැඩසටහන්වලට අරමුදල් ලබාදීමේ ස්ථිර ආදායම් මාර්ගයක් නිර්මාණය කිරීම අරමුණු කරන ලදී. එම ඉල්ලීම වෙත යහපත් ප්‍රතිචාර දක්වමින් එවකට ශ්‍රී ලංකාවේ ජනාධිපතිව සිටි ගරු. ජේ.ආර්.ජයවර්ධන මහතා විසින් මෙම අරමුණ සඳහා රුපියල් මිලියන 2.2 ක මුදලක් වෙන් කරන ලදි. ඒ සමඟම, ගරු ලලිත් ඇතුලත්මුදලි මහතා විසින්ද ඒ හා සමාන මුදලක් මහපොළ උසස් අධ්‍යාපන අරමුදලෙන් දායක කිරීමට එකඟ විය.

එහි ප්‍රතිඵලයක් ලෙස, අරමුදලෙහි ස්ථිරසාරභාවය උදෙසා සංවර්ධන ලොතරැයි යනුවෙන් නම් කරන ලද මුල්ම ලොතරැයිය නිකුත් කරන ලදී. එම උත්සාහයන් සියල්ල අවසානයේ ජනාධිපති අරමුදලටත්, මහපොළ ශිෂ්‍යත්ව අරමුදලටත්, අරමුදල් සැපයීම අරමුණු කර ගනිමින් සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානය ස්ථාපනය කිරීමට හේතු විය. සංවර්ධන ලොතරැයි මණ්ඩලය පසු කාලසීමාවන් පුරා සැලකියයුතු ජයග්‍රහන ලබාගනිමින් සිය පළමු වසර තුළ ආර්ථික ඉලක්ක සාක්ෂාත් කරගනිමින් එහි කර්මාන්ත ගමන ආරම්භ කරන ලදී. මණ්ඩලයේ ශුද්ධ ලාභ ජනාධිපති අරමුදල සමඟ මහපොළ ශිෂ්‍යත්ව අරමුදලට මෙම දායකත්වයෙන් 50% ක් වෙන් කරමින් සිය පදනම් ආයතන වන, ජනාධිපති අරමුදල සහ මහපොළ ශිෂ්‍යත්ව අරමුදල වෙත නිත්‍ය වශයෙන් ප්‍රේෂණය කර ඇත.

1993 වර්ෂයේදී සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානය සංවර්ධන ලොතරැයි භාරය ලෙස නාමකරණය කළ අතර පසුව 1997 අගෝස්තු 12 වැනි දින පාර්ලිමේන්තු පනතක් මගින් සංවර්ධන ලොතරැයි මණ්ඩලය ලෙස යලි ස්ථාපනය කරන ලදී. සංවර්ධන ලොතරැයිය නමින් හැදින්වූ පළමු ක්ෂණික ලොතරැයිපත රු.10/= බැගින් වූ මුදලකට දිවයින පුරා අලෙවි කරන ලද අතර, පැය 24ක් ඇතුළත, සුපිරි ජයමළු ජයග්‍රාහකයින් දෙදෙනෙකු බිහිකරන්නට සමත්විය. මෙම සාර්ථකත්වය ක්ෂණික ලොතරැයිපත් කරා පාරිභෝගිකයින් ආකර්ෂණය කර ගැනීමට පමණක් නොව නව ලොතරැයි ක්‍රමයේ ජනප්‍රියත්වය වැඩි කිරීමට මග පෑදුවේය.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය පළමුවරට ශනිදා වාසනාව නමින් සෙනසුරාදා දිනවල පමණක් පවත්වන ලද ලොතරැයි වැඩසටහනක් රූපවාහිනිය ඔස්සේ විකාශනය කිරීමට පුරෝගාමී විය. එහි ජනප්‍රියතාවය වර්ධනය වීමෙන් පසු, එය සතියේ දින හතේ දිම ලොතරැයි ඇදීමකට හේතු විය. ඊට අමතරව, ක්ෂණික ලොතරැයි වලින් ජයග්‍රහණය හිමි නොවූ ටිකට්පත් සඳහාම සහන ලබාදීමේ අරමුණ ඇතිව 1998 ජනවාරි 25 වන දින ආරම්භ කරන ලද "වාසනා චක්‍රය" ලොතරැයි වැඩසටහන ඉරිදා දිනවල රූපවාහිනිය ඔස්සේ විකාශනය කරන ලදී.

මෙම වැඩසටහන සදහා ඉතා ඉහළ ප්‍රතිචාරයක් ලැබීම හේතුවෙන් සංවර්ධන ලොතරැයි මණ්ඩලය 1998 වසරේදී " සංවර්ධන වාසනාව" නමින් රූපවාහිනිය ඔස්සේ දිනුම් අදින දෙවන ලොතරැයිය හදුන්වා දුන් අතර එය අඟහරුවාදා හා සිකුරාදා දිනවල විකාශය කරන ලදී. එහි අලෙවිය සැලකිල්ලට ගනිමින්, 2015 වර්ෂයේදී ලග්න 12 (රාශි සංඥා) පදනම් කර ගනිමින් එය "ලග්න වාසනා" නමින් නැවත නම් කරන ලදී. මේ වන විට එම ලොතරැයිය සතියේ දින හතේම දිනුම් අදිනු ලබන ආකර්ෂණීය ලොතරැයියකි.

එමෙන්ම, සංවර්ධන ලොතරැයි මණ්ඩලය රුපියල් මිලියන 10ක ආරම්භක සුපිරි ජයමල්ලක් සමඟ ආරම්භව සඳුදා සහ බ්‍රහස්පතින්දා දිනවල දිනුම් ඇදීම් සහිතව 2004 ජනවාරි 26 වන දින "ජයෝදා" නමින් ලොතරැයියක් හඳුන්වා දෙන ලදී. ශ්‍රී ලංකා ලොතරැයි ඉතිහාසයේ සුවිශේෂී පියවරක් තබමින් ජයග්‍රාහකයින්ට රුපියල් මිලියන 10ක ත්‍යාගය හෝ රුපියල් මිලියන 10කට අධික වටිනාකමකින් යුතු නිවසක් තෝරා ගැනීමට මින් අවස්ථා හිමිකර දුන්නේය.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය 2009 අප්‍රේල් 10 වැනි දින බ්‍රහස්පතින්දා සහ ඉරිදා දිනවල දිනුම් අදින "ජන ජය" ලොතරැයිය හඳුන්වා දෙන ලදී. වාසනාවන්තයින් සුපිරි ත්‍යාගය දිනා ගැනීම සඳහා අංක 64 අතරින් තෝරා ගනු ලබන ජයග්‍රාහී අංක 04 සමග තවත් යන්ත්‍රයකින් තෝරා ගනු ලබන සුපිරි අංකය ගැලපිය යුතුය. මෙහි මූලික සුපිරි ත්‍යාග මුදල රුපියල් මිලියන 2.5 කි.

2012 ජූලි 11 වන දින රුපියල් කෝටි 03ක සුපිරි ජයමල්ලකින් ආරම්භ වන "සුපර් බෝල්" ලොතරැයිය හදුන්වා දීම එම කාල සීමාවේ මෙරට විශාලතම සුපිරි ත්‍යාග මුදල තිළිණ කළ ලොතරැයිය විය. අද එය දිනපතාම දිනුම් අදින ලොතරැයියක් ලෙස වෙළෙඳපොල තුළ ඉතා ජනප්‍රිය වී ඇත.

2016 වර්ෂයේදී සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් නව ලොතරැයි වර්ග ගණනාවක් වෙළෙඳපොලට හදුන්වා දුන්නේය. එයට 2016 මැයි 14 වැනි දින දියත් කළ මිලියන 5.6 ක ලොතරැයි අලෙවියක් වාර්තා කළ ලක්ෂපති ලොතරැයිය සහ 2016 අප්‍රේල් 8 දින දියත් කළ මිලියන 4.4 ක ලොතරැයි අලෙවියක් වාර්තාකළ "කෝටිපති ශනිදා" ලොතරැයිය ඇතුළත් වේ.

නව බලාපොරොත්තු සහ මුදල් ත්‍යාග තුනක් සමඟින් හදුන්වා දෙන ලද "සංවර්ධන වාසනාව" රූපවාහිනී ලොතරැයි දිනුම් ඇදීම 2016 දෙසැම්බර් 12 වැනි දින නැවත දියත් කරන ලදී. ඊට අමතරව, ශ්‍රී ලාංකික ලොතරැයි ඉතිහාසයේ සතියේ දින හතේදීම දිනුම් අදිනු ලබන පළමු ලොතරැයිය ලෙස 2017 අගෝස්තු 31 වැනි දින "අද කෝටිපති" ලොතරැයිය හදුන්වා දෙන ලදී.

තවද සංවර්ධන ලොතරැයි මණ්ඩලය එහි කාර්යයන් යාවත් කාලින කරමින් ලොතරැයි ව්‍යාපාරයේ උන්නතිය උදෙසා නව තාක්ෂණය භාවිතා කර ඇත. 2020 වර්ෂයේදී තම පාරිභෝගිකයින් වෙත ඔවුන්ගේ ස්මාර්ට් දුරකථනය හරහා ලොතරැයි පතක් මිලදී ගැනීමේ ඉඩ හසර විවෘත කර දී ඇත. මෙම අරමුණ සඳහා, "DLB Sweep App" යෙදුම හඳුන්වා දී ඇත. එම හදුන්වා දීමත් සමග සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් මෙරට නව වෙළෙඳ පොලක් ඉලක්ක කර ගනිමින් දකුණු ආසියාවේ ප්‍රථම ඩිජිටල් ලොතරැයිය වන "සසිරි" ලොතරැයිය හඳුන්වා දීම සිදුකරන ලදී.

ලොතරැයි නව්‍යකරණයේ තවත් මානයන් සොයා යන්නට යුහුසුළු වූ සංවර්ධන ලොතරැයි මණ්ඩලය 2021 වර්ෂයේදී ලොතරැයි දිනුම් ඇදීමේ වැඩසටහනටද නව මුහුණුවරක් හා රිද්මයක් එකතු කරන්නේ පැරණි දිනුම් ඇදීමේ

වැඩසටහන් ආකෘතියට නිමා තබමිනි. 2021 මාර්තු 21 දින මෙම පරිණාමයේ කොටසක් ලෙස ඉතා කෙටි කාලසීමාවක් තුළ එක පෙළට දිනුම් ඇදීමේ වැඩසටහන් සියල්ලම විකාශනය වන පරිදි 'DLB Lottery Show' වැඩසටහන හඳුන්වාදෙන ලදි. මෙම වෙනසට සමගාමීව DLB Lottery Show නමින් Youtube නාලිකාවක් ද ආරම්භ කරන ලදි. තවද කෝටිපති කප්රුක ලොතරැයිය රුපියල් මිලියන 120 ක ආරම්භක සුපිරි ජයමල්ලක් සහ අතිශය ආකර්ශනීය නව ත්‍යාග රටාවක් සමඟ 'කප්රුක' ලෙස නව මුහුණුවරකින් සතියේ දින හතේම සිදු කරන ලද අතර ඒ අනුව දිනකට දිනු මි අඳිනු ලැබූ ලොතරැයිපත් සංඛ්‍යාව හයක් විය. එමෙන්ම උතුරු හා නැගෙනහිර පළාත්වල පාරිභෝගිකයින් ඉල්කක කරමින් 2022 සැප්තැම්බර් 9 (සිකුරාදා) දින වාසනාවේ සංකේතයක් වන "වාලම්පුරි" නාමය යටතේ නව ලොතරැයිපතක් වෙළෙඳපොලට හඳුන්වා දෙන ලදී. කෙසේවෙතත්, එහි ජනප්‍රියතාව හේතුවෙන් සමස්ත දිවයිනටම කළමනාකාරීත්වය විසින් පසුකාලීනය තීරණාය කරන ලදී.

ශ්‍රී ලංකා සමාජය තුළ බොහෝ දශලක්ෂපතියන් බිහිකිරීමේ සහ වාසනාවේ නිම්වළලු තවදුරටත් පුළුල් කිරීමේ අරමුණ ඇතිව, 2023 නොවැම්බර් 9 (බ්‍රහස්පතින්දා) දින "සුපිරි ධන සම්පත" නමින් සතියේ දින හතේම දිනුම් අදින ලොතරැයිය හඳුන්වා දෙන ලදී. එහි පළමු දිනුම් ඇදීමේදී මිලියන 1.6ක අලෙවියක් දැකගන්නට ලද අතර, මණ්ඩලයේ දෛනික ලොතරැයි අලෙවිය මිලියන 1.9 සිට මිලියන 2.2 දක්වා වැඩිවීමකට එය හේතු විය.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය පිහිටුවනු ලබන්නේ උත්තරීතර අරමුණු ද්විත්වයක් පෙරදැරි කර ගනිමිනි. ඒ ජනාධිපති අරමුදලටත්, මහපොළ භාරකාර අරමුදලටත් අරමුදල් සැපයීම අරමුණු කර ගනිමිනි. එබැවින් සංවර්ධන ලොතරැයි මණ්ඩලය තම සියලූ ලාභයන් බැර කරන්නේ ජනාධිපති අරමුදල වෙතයි. මෙරට ජනතාව ලොතරැයියක් වෙනුවෙන් වැය කරනු ලබන රුපියල් 20 නැවතත් වාසනාවක් බවට පත් කරමින් දිනුම් අවස්ථාද, රට වෙනුවෙන් යුතුකමද ඉටුකරන සංවර්ධන ලොතරැයි මණ්ඩලය පසුකළ අවුරුදු 40ක කාලය තුළ ජනධිපති අරමුදලට රුපියල් බිලියන 40.6කට අධික මුදලක් ප්‍රේෂණය කර ඇත.

# වැදගත් සන්ධිස්ථාන

## 1983

ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට ක්ෂණික දිනුම් ලොතරැයියක් හඳුන්වා දෙන ලදී

## 1987

පළමු රූපවාහිනි දිණුම් ඇදීම වන 'ශනිදා වාසනාව' ලොතරැයිය හඳුන්වාදිම

## 1993

සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානය 'සංවර්ධන ලොතරැයි භාරය' බවට පරිවර්තනය වීම.

## 1997

'සංවර්ධන ලොතරැයි භාරය' 1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත යටතේ රජයට හිමි සංස්ථාපිත ආයතනයක් වන 'සංවර්ධන ලොතරැයි මණ්ඩලය' නමින් ස්ථාපනය කිරීම.

- රුපියල් බිලියන 2 ක සමස්ත පිරිවැටුම් මට්ටමක් ලඟා කර ගන්නා ලදී

## 1998/04

ජයග්‍රහණ හිමි නොවූ ක්ෂණික/සූරන ලොතරැයිපත් සඳහා 'වාසනා චක්‍රය' රූපවාහිනී දිනුම් ඇදීම නැවත දියත් කිරීම

- ප්‍රථම ත්‍යාගය ලෙස සුපිරි සුඛෝපභෝගී මෝටර් රථයක් පිරිනමමින් රු. 10 ක මුදලකට අලෙවි කරන 'වින්ඩෝස්' සහ රු. 100 ක මුදලකට 'යුරේකා' ක්ෂණික ලොතරැයි සමග 'සංවර්ධන වාසනා ලොතරැයිය' හඳුන්වා දෙන ලදී.

1999 - වර්ෂ 2000 දී එල්ල වන තාක්ෂණික අභියෝගයන්ට මුහුණ දීම පිණිස ලෝක බැංකුවේ සහාය ඇතිව පරිගණක පද්ධතිය යාවත්කාලීන කරන ලදී.

2004 - සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් හඳුන්වා දෙන ලද පුරෝගාමී අංගයක් වන මුදල් ත්‍යාගයක් හෝ නිවසක් යන විකල්ප සහිතව 'ජයෝදා' ලොතරැයිය දියත් කරන ලදී

- රුපියල් බිලියන 3ක සමස්ත පිරිවැටුමක් අත් කරගන්නා ලදී

## 2008

2008 - අංක 356, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත, කොළඹ 02 හි පිහිටි සංවර්ධන ලොතරැයි මණ්ඩලයට ම අයත් ගොඩනැගිල්ල වෙත මණ්ඩලය රැගෙන යන ලදී

- රුපියල් බිලියන 5 ක සමස්ත පිරිවැටුමක් අත්කර ගන්නා ලදී

## 2010/12

2010 - සුපිරි ජයමල්ලක් සමග 'ජන ජය' දිනුම් අදින ලොතරැයිය හඳුන්වාදීම

2011 - 'නියත ජය' දිනුම් අදින ලොතරැයිය ආරම්භ කිරීම

2012 - රුපියල් මිලියන 30 ක සුපිරි ජයමල්ලක් සමග 'සුපර් බෝල්' දිනුම් අදින ලොතරැයිය හඳුන්වා දීම

**2013**

ඉහළම වටිනාකම සහිත ජයමල්ලක් සමග 'හයිවේ ඩ්‍රීම්' ලොතරැයිය හඳුන්වා දීම

**2014**

කෙටි පණිවුඩ සේවාව ඔස්සේ ලොතරැයි අලෙවි කිරීමේ ක්‍රමය දියත් කරන ලදි

**2016**

'සංවර්ධන ලක්ෂපති', 'කෝටිපති ශනිදා' සහ 'සංවර්ධන වාසනාව' යන ලොතරැයි ආරම්භ කිරීම

**2017/18**

2017 - 'අද කෝටිපති' ලොතරැයිය හඳුන්වා දීම

2018 - **IVR** සහ කෙටි පණිවුඩ සේවාව ඔස්සේ ප්‍රතිඵල දැනුම්දීමේ ක්‍රමවේදය දියත් කරන ලදි සසිරි ඊ ලොතරැයිය හඳුන්වාදීම

**2019**

**DLB Sweep App** යෙදවුම දියත් කිරීම

**2020**

සසිරි ඊ ලොතරැයිය හඳුන්වාදීම

**2020/23**

2021 - ශ්‍රී ලංකාවේ ලොතරැයි ව්‍යාපාරයේ රු.මි. 120ක් වූ ඉහළම වටිනාකම සහිත සුපිරි ජයමල්ල පිරිනමමින් 'කප්රුක' ලොතරැයිය නැවත හඳුන්වා දීම

2022 - වාලම්පුරි ලොතරැයිය හඳුන්වා දීම


2023 සුපිරි ධන සම්පත ලොතරැයිය හඳුන්වා දීම

ලොතරැයියක මිල රු. 20 සිට 40 දක්වා වැඩිවිය




# මූල්‍යමය වැදගත් සිදුවීම්


ආදායම (රු.මි.)





බදු පෙර ලාභය (රු.මි.)





ජනාධිපති අරමුදලට ලබාදුන් දායකත්වය (රු.මි.)





ආදායම් බදු (රු.මි.)




රජය වෙත ලබාදුන් මුළු ප්‍රේෂණ රු.මි.)




මුළු වත්කම් (රු.මි.)



| | 2023<br>රු. '000 | 2022<br>රු. '000 |
|---|---|---|
| **මෙහෙයුම් ප්‍රතිඵල** | | |
| ආදායම | 25,442,131,713 | 19,071,456,751 |
| දළ ලාභය | 10,017,436,178 | 7,591,995,984 |
| බදු පෙර ලාභය | 3,516,296,477 | 3,266,591,501 |
| බදු වියදම් | (106,210,247) | 55,904,459 |
| ශුද්ධ ලාභය | 5,265,256,062 | 3,225,653,361 |
| ජනාධිපති අරමුදලට ලබාදුන් දායකත්වය | 3,622,506,725 | 3,210,687,041 |
| | | |
| **මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය** | | |
| **වත්කම්** | | |
| දේපල, පිරියත හා උපකරණ | 2,718,047,956 | 1,095,292,917 |
| ස්ථාවර තැන්පතු | 1,710,213,172 | 1,742,324,887 |
| තොග | 56,720,455 | 45,970,611 |
| වෙළෙඳ ණයගැතියෝ සහ ලැබියයුතු වෙනත් | 207,964,715 | 163,480,972 |
| පෙර ගෙවීම් සහ තැන්පතු | 4,748,286 | 6,223,428 |
| අතැති සහ බැංකුවේ ඇති මුදල් | 767,981,019 | 557,240,367 |
| **මුළු වත්කම්** | 5,465,675,603 | 3,610,533,182 |
| | | |
| **වගකීම්** | | |
| සේවක ප්‍රතිලාභ වගකීම් | 9,081,293 | (4,438,730) |
| අලෙවි නියෝජිත සහ බෙදාහැරීමේ අලෙවි නියෝජිත ගෙවිය යුතු තැන්පතු | 39,875,881 | 38,718,881 |
| ගෙවිය යුතු ණය වවුචර් | 167,800,730 | 123,353,560 |
| වෙළෙඳ සහ වෙනත් ගෙවියයුතු | 690,726,582 | 771,026,177 |
| ජනාධිපති අරමුදලට ගෙවිය යුතු | 682,730,725 | 315,791,041 |
| ගෙවිය යුතු ත්‍යාග | 1,456,785,350 | 1,003,306,515 |
| | | |
| **හිමිකම්** | | |
| ජනාධිපති අරමුදල | 2,200,000 | 2,200,000 |
| මහපොල භාරකාර අරමුදල | 2,200,000 | 2,200,000 |
| ත්‍යාග සංචිත ගිණුම | 139,106,256 | 725,956,289 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | 2,268,909,427 | 620,583,095 |
| සේවක ප්‍රතිලාභ සැලැස්ම නැවත මිනුම් කිරීමේ ලාභය/අලාභය | 6,259,359 | 11,836,354 |
| **මුළු හිමිකම් සහ වගකීම්** | 5,465,675,603 | 3,610,533,182 |
| | | |
| **ලාභදායිත්ව අනුපාතය** | | |
| ශුද්ධ ලාභ අනුපාතය | 14% | 17% |
| දළ ලාභ අනුපාතය | 39% | 40% |
| | | |
| **ද්‍රවශීලතා අනුපාතය** | | |
| ජංගම වත්කම් අනුපාතය | 1 : 1.19 | 1 : 1.33 |
| ක්ෂණික (ද්‍රවශීලීතාවයෙන් යුත්) වත්කම් අනුපාතය | 1 : 1.16 | 1 : 1.30 |

# සභාපතිතුමාගේ පණිවුඩය සහ ප්‍රගති වාර්තාව 2023



**පෙර නොවූ විරූ ආර්ථික අර්බුදයක් හමුවේ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය (DLB) සිය උපායමාර්ගික අරමුණු කරා ශක්තිමත්ව ප්‍රගමනය වෙමින් ඔරොත්තුදීමේ හැකියාව සහ අධිෂ්ඨානය පෙන්වා ඇත. ගතික පද්ධතියක් මඟින් සහය ලබමින්, සංවර්ධන ලොතරැයි මණ්ඩලය විශිෂ්ඨත්වය සහ තිරසාර සංවර්ධනය කරා එහි කැපවීම ශක්තිමත් කරමින් දක්ෂ අයුරින් අභියෝග පසුකර ඇත. 2023 මූල්‍ය වසරේ ජයග්‍රහනයන් පිළිබිඹු කරමින්, අපගේ ඔරොත්තුදීමේ හැකියාව, නව්‍යකරණය සහ උන්නතිය පිළිබඳ කථාව අපි සාඩම්බරයෙන් හුවමාරු කර ගනිමු.**

## මූල්‍ය සමාලෝචනය

| | 2023 (රු.මි.) | 2022 (රු.මි.) | % |
|---|---|---|---|
| ආදායම | 25,442 | 19,071 | 33% |
| ත්‍යාග මුදල් ගෙවීම | 13,451 | 9,884 | 36% |
| දළ ලාභය | 10,017 | 7,592 | 32% |
| බදු පෙර ලාභය | 3,516 | 3,267 | 8% |
| බදු පසු ලාභය | 3,623 | 3,211 | 13% |

2023 මූල්‍ය වසර තුළ,සංවර්ධන ලොතරැයි මණ්ඩලය ශක්තිමත් මූල්‍ය කාර්යසාධනයක් පෙන්වා ඇති අතර, ප්‍රධාන ප්‍රමිතික අනුව සැලකියයුතු වර්ධනයක් සලකුණු කර ඇත. අපගේ මූල්‍යමය වැදගත් සිදුවීම්වල සාරාංශය පහත දැක්වේ.

**ආදායම් වර්ධනය:** පසුගිය වසරේ රු.මිලියන 19,071ට සාපේක්ෂව 2023 වසරේදී රු. මිලියන 25,442ක් කරා ලඟා වෙමින් සැලකියයුතු ආදායමක් සාක්ෂාත් කරගෙන ඇත. 33%ක් වන මෙම සැලකියයුතු වර්ධනය තුළින් අපගේ ආදායම් උත්පාදන උපායමාර්ගවල ඵලදායිත්වය පිළිබිඹු කරයි.

**ත්‍යාග මුදල් ගෙවීම:** ආකර්ෂණීය ත්‍යාග පිරිනැමීම කරා අපගේ බැඳීම 2023 වසරේදී රු.මිලියන 13,451ක මුළු ත්‍යාග ගෙවීමකට හේතු වී ඇති අතර, එය 2022 වර්ෂයේ පැවති රු.මිලියන 9884ට වඩා 36% ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කරයි. පාරිභෝගික සහභාගිත්වය සහ තෘප්තිය වැඩි කිරීම සඳහා අපගේ කැපවීම මින් පෙන්නුම් කරයි.

**දළ ලාභය:** සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ දළ ලාභය 32%ක ශක්තිමත් වර්ධනයක් පිළිබිඹු කරමින් පසුගිය වසරේ පැවති රු. මිලියන 7,592 සිට 2023 වසරේදී රු. මිලියන 10,017 දක්වා වැඩි වී ඇත. මෙම වර්ධනය මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ පිරිවැය ඵලදායීව කළමනාකරණය කිරීමට අපට ඇති හැකියාව ඉස්මතු කර පෙන්වයි.

**බදු පෙර ලාභය:** විවිධ වෙළෙඳපොල අභියෝග මධ්‍යයේ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය 2022 වසරේදී රු.මිලියන 3267ක්ව පැවති බදු පෙර ලාභය 2023 වසරේදී රු. මිලියන 3516ක් දක්වා වර්ධනය කරගනිමින් 2022 වසරට සාපේක්ෂව 2023 වසරේදී 8% ක ප්‍රශංසනීය වර්ධනයක් පෙන්නුම් කර ඇත. මේ තුළින් අපගේ ශක්තිමත් සහ ඵලදායී මූල්‍ය කළමනාකරණ ව්‍යවහාර පිළිබිඹු කරයි.

**බදු පසු ලාභය:** සංවර්ධන ලොතරැයි මණ්ඩලය 2023 වසරේදී රු.මිලියන 3,623ක බදු පසු ලාභයක් වාර්තා කර ඇති අතර, එය 13%ක සැලකියයුතු වර්ධනයක් පිළිබිඹු කරමින් පසුගිය වසරේ දි පැවති රු.මිලියන 3,211 සිට වැඩි වීමක් වාර්ථා කර ඇත. මෙම වර්ධනය තුළින් අපගේ පාර්ශවකරුවන් සඳහා තිරසාර වටිනාකම නිර්මාණය කිරීමට අපට ඇති හැකියාව ඉස්මතු කර පෙන්වයි.

සමස්ථයක් වශයෙන් 2023 මූල්‍ය වසර අඛණ්ඩ වර්ධනය හා සාර්ථකත්වය කරා සංවර්ධන ලොතරැයි මණ්ඩලය ස්ථානගත කරමින් ශක්තිමත් මූල්‍ය කාර්යසාධනය සහ උපායමාර්ගික ක්‍රියාත්මකවීම පෙන්නුම් කරයි. අපගේ පාර්ශවකරුවන් සඳහා වටිනාකම ලබාදීමට සහ අප සේවය කරන ප්‍රජාවන් කෙරෙහි ධනාත්මක බලපෑමක් සිදු කිරීමට අපි කැපවී සිටිමු.

## අපගේ ජයග්‍රහන

සංවර්ධන ලොතරැයි මණ්ඩලය වන, අපගේ මූලික අරමුණ වන්නේ ජනාධිපති අරමුදල සහ මහපොල ශිෂ්‍යත්ව අරමුදල සඳහා ආදායම් ඉපයීමයි. 2023 මූල්‍ය වසර තුළ, මෙම වටිනා අරමුණ සඳහා රු. මිලියන 3,622ක් උත්පාදනය කරමින් මෙම උත්සාහය තුළ සැලකියයුතු ප්‍රගතියක් වාර්තා කිරීමට ලැබීම පිළිබඳ අපි ආඩම්බර වන අතර මෙය පසුගිය වසරේ දායකත්වය වන රු. මිලියන 3,210ට සාපේක්ෂව 13%ක වැඩිවීමකි. මෙම ජයග්‍රහනය තුළින් අත්‍යවශ්‍ය වැඩසටහන්වලට සහයදීම සඳහා අපගේ බැඳීම පෙන්වන අතර, සමාජීය අභිවෘද්ධිය කරා අපගේ කැපවීම ඉස්මතු කර පෙන්වයි.

## මෙහෙයුම් සමාලෝචනය

2023 වසරේදී සංවර්ධන ලොතරැයි මණ්ඩලය කාර්යක්ෂමතාව සහ නව්‍යකරණය ශක්තිමත් කිරීම අරමුණු කළ මෙහෙයුම් ව්‍යාපෘති සමඟින් සැලකියයුතු සන්ධිස්ථාන අත්කර ගෙන ඇත. සම්පූර්ණ කල මූලික ව්‍යාපෘතිවලට පහත දෑ ඇතුළත්ය.

**ස්වයංක්‍රියකළ උපස්ථ මෘදුකාංගය ක්‍රියාත්මක කිරීම:** දත්තවල සුපිළිපන්බව සහතික කිරීමට සහ මානව දෝෂවල අවදානම අවම කිරීමට අපි ස්වයංක්‍රියකළ උපස්ථ මෘදුකාංගය ක්‍රියාත්මක කළෙමු.

**දත්ත මධ්‍යස්ථානය සඳහා යථාතථ්‍ය වායුසමීකරණ පද්ධතිය:** ප්‍රශස්ථ ශීතකිරීම සහ ආර්ද්‍රතාවය හා නියමිත උෂ්ණත්ව මට්ටම් පවත්වා ගැනීමට සර්වර් කාමරය තුළ යථාතථ්‍ය වායු සමීකරන පද්ධතියක් ස්ථාපනය කළෙමු.

**UPS පද්ධතිය පුළුල් කිරීම සහ UPS කාමරය ක්‍රියාත්මක කිරීම:** අපගේ බලශක්ති උපස්ථ හැකියාවන් ශක්තිමත් කරමින් සහ විදුලිබලය සැපයීමේ තත්ත්වය ප්‍රසාරණය කරමින් යල්පැනගිය උපාංග වෙනස් කිරීම සඳහා කිලෝවොට් 20ක UPS ඒකක 2ක් මිලදී ගන්නා ලදී.

**නව දිනුම් ඇදීමේ සජීවිකරණ (Draw Animation) හඳුන්වාදීම:** අප ජනාධිපති අරමුදලට සහය වෙමින් සාම්ප්‍රදායික ලොතරැයි ඇදීම අන්තර් ක්‍රියාකාරී අරමුණු පදනම් කාර්යයකට පරිවර්තනය කරමින් ශ්‍රී ලංකාවේ පළමු ඩිපිටල් දිනුම් ඇදීමේ අත්දැකිම අපි දියත් කළෙමු.

මෙවැනි ව්‍යාපෘතිවලින් ලොතරැයි කර්මාන්තය තුළ සිය තත්ත්වය ශක්තිමත් කරගනිමින් සහ සමාජීය අභිවෘද්ධිය කරා දායක වෙමින් නව්‍යකරණය හා කාර්යක්ෂමතාව කරා සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ බැඳීම පිළිබිඹු කරයි.

## වෙළෙඳපොල සිදුවීම්

2023 දි, සංවර්ධන ලොතරැයි මණ්ඩලය (DLB) සැලකියයුතු වෙනස්වීම්වලට මුහුණ දුන් අතර, සිය වෙළෙඳපොල උත්සාහයන් හිදී වෙලෙඳපොල ගතිකතාවන්ට මුහුණ දිමේදී උපයෝජ්‍යතාව සහ නව්‍යකරණය පෙන්වමින් සැලකියයුතු සාර්ථකත්වයක් අත් කර ගන්නා ලදී. වෙළෙඳපොල තුළ මිල ගැලපීම් සහ උච්චාවචන විසින් ගෙනෙන ලද අභියෝග හමුවේ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය සිය අරමුණු සපුරාලීමේදී ඔරොත්තුදීම සහ උපායමාර්ගික දැනුම පෙන්වන ලදි.

**මිල ගැලපීම සහ විකුණුම් බලපෑම:** මුදල් අමාත්‍යංශයේ මඟපෙන්වීම යටතේ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය 2023 ජූලි 6 දිනසිට සියලුම ලොතරැයිපත්වල මිල රු. 20 සිට රු. 40 දක්වා වැඩි කරන ලදී. මෙම තීරණය දෛනික ලොතරැයි අලෙවියෙහි තාවකාලික අඩුවීමකට හේතු වූ නමුත් අවසානයේදී ආර්ථික පීඩනයන්ට මණ්ඩලයේ උපායමාර්ගික ප්‍රතිචාරය පෙන්වමින් පිරිවැටුම තුළ සමස්ථ වැඩිවීමකට හේතු විය.

**නව ලොතරැයි හඳුන්වාදීම:** වැඩිපුර දශලක්ෂපතියන් බිහිකිරීම අරමුණු කළ දෛනික දිනුම් ඇදීමක් සහිත සුපිරි ධන සම්පත දියත් කිරීම වෙළෙඳපොල තුළ බලවත් උනන්දුවක් ඇති කරන ලදී. මෙම නව ලොතරැයිය වැඩිකළ විකුණුම්වලට දායක වූ අතර, පාරිභෝගිකයින් ආකර්ෂණය කිරීමට නව්‍යකරණ නිෂ්පාදන පිරිනැමීමේ විභවතාව ඉස්මතු කරමින් මණ්ඩලයේ ආදායම් වර්ධනය තුළ සැලකියයුතු කාර්යභාරයක් ඉටු කළේය.

**අලෙවි ප්‍රවර්ධන සහ දිරිගැන්වීම්:** වසර පුරා, සංවර්ධන ලොතරැයි මණ්ඩලය විවිධ ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කළ අතර, විකුණුම් උත්තේජනය කිරීමට තැගි ව්‍යූහ ගැලපීම් සිදුකරන ලදී. දෙවැනි දිනුම් ඇදීම් (Second Chance) සහ mini draw වැනි විශේෂිත දිනුම් ඇදීම් වැනි කටයුතු පාරිභෝගික සහභාගිත්වය වැඩි කිරීමට හේතු වූ අතර, වඩා ඉහළ පරිමාවක ලොතරැයි මිලදී ගැනීම්වලින් ඉලක්කගත වෙළෙඳපොල වැඩසටහන්වල ඵලදායිත්වය පිළිබිඹු කරයි.

**වෙළඳපොල පුළුල් කිරීම සහ සහය වැඩටහන්:** සංවර්ධන ලොතරැයි මණ්ඩලය වෙළෙඳපොල විනිවිදයාම සහ ප්‍රවේශ්‍යතාව ඉහළ නැංවීම අරමුණු කරමින් විවිධ දිස්ත්‍රික්ක පුරා නව බෙදාහරින්නන් සහ අලෙවි නියෝජිතයින් පත්කරමින් සිය අලෙවි ජාලය පුළුල් කිරීමේ උත්සාහයක නිරත විය. ඊට අමතරව, සංවර්ධන ලොතරැයි මණ්ඩලය අලෙවි නියෝජිතයින්ට සහයවීම පිණිස විශේෂ වැඩසටහන් ආරම්භ කල අතර, එයට සිය ශ්‍රම බලකායට ආයතනයේ බැඳීම ශක්තිමත් කරමින් ස්වභාවික ආපදාවන්ගෙන් පීඩාවට පත් අය සඳහා මූල්‍යමය ආධාර සැපයීම, නව අලෙවිකුටි ස්ථාපිත කිරීම, සහ අලෙවි නියෝජිතයින්ගේ ළමුන් සඳහා අධ්‍යාපනික ශිෂ්‍යත්ව ලබා දීම ඇතුළත් විය.

**සමාජ ආරක්ෂාව සහ ප්‍රජා සහභාගිත්වය:** සමාජ ආරක්ෂක වැඩසටහන්වල සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සහභාගිත්වය සහ සංස්කෘතික හා අධ්‍යාපනික උත්සවවලට අනුග්‍රහකත්වය ප්‍රජා සංවර්ධනය සහ සහභාගිත්වය සඳහා සිය බැඳිම ඉස්මතු කර දක්වයි. පුන්‍ය කටයුතු සංවිධානය කිරීම, රෝහල්වලට පරිත්‍යාග කිරීම, සහ සම්ප්‍රදායික උත්සවවලට අනුග්‍රාහකත්වය දැක්වීම තුළින්, සංවර්ධන ලොතරැයි මණ්ඩලය සිය ආයතනික සමාජීය වගකීම සඳහා බැඳිම පෙන්වා දී ඇත.

**නව්‍යකරණ වැඩසටහන් සහ පිළිගැනීම:** සංවර්ධන ලොතරැයි මණ්ඩලය පාරිභෝගික පහසුව වැඩිකරමින් සහ අලෙවි නියෝජිතයින්ගේ දුෂ්කර කාර්යයන් අවබෝධ කර ගනිමින් දුරකථන පදනම් ලොතරැයි ඇණවුම් සහ අලෙවි කවුළු සඳහා ප්‍රදාන වැනි නව්‍යකරණ ක්‍රියාමාර්ග හඳුන්වා දී ඇත. විශ්‍රාමික කාර්ය මණ්ඩලය පිළිගැනීම සහ සේවා සන්ධිස්ථාන සැමරීම ආයතනයේ සාර්ථකත්වය කරා එහි සේවකයින්ගේ දායකත්වය සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් අගය කිරීම තවදුරටත් ඉස්මතු කරන ලදි,

සාරාංශයක් ලෙස, 2023 සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ වෙළෙඳපොල මෙහෙයුම් සඳහා උපායමාර්ගික අනුවර්තනය, නව්‍යකරණය සහ ප්‍රජා සහභාගිත්වය පිළිබඳ වසරක් විය. වෙළෙඳපොල අභියෝගවලට මුහණ දෙමින්, සංවර්ධන ලොතරැයි මණ්ඩලය අඛණ්ඩ වර්ධනය සහ අනාගතය තුළ බලපෑම සඳහා අදියර සකසමින් සිය පාර්ශවකරුවන්ට ඔරොත්තුදීම, නිර්මාණශීලතාව සහ ශක්තිමත් බැඳිමක් පෙන්වන ලදී.

## අප කණ්ඩායම

සංවර්ධන ලොතරැයි මණ්ඩලය තුළ, අපගේ සාර්ථකත්වය අපගේ ගතික කණ්ඩායමේ කැපවීම සහ ප්‍රවීනතාව සමඟ තියුණු ලෙස එකට බැඳී පවතී. අලෙවි, මූල්‍ය, තොරතුරු තාක්ෂණ, ප්‍රසම්පාදන, විකුණුම්, පරිපාලන සහ අභ්‍යන්තර විගණනය යන දෙපාර්තමේන්තුවල විහිදී සිටින, අපගේ දක්ෂ වෘත්තිකයින් අපගේ ජයග්‍රහනයන්ගේ ප්‍රධාන ප්‍රතිෂ්ඨාව ලෙස පෙනී සිටී. ඔවුන්ගේ ඉදිරිය දකින සහ දැඩි බැඳිම අපගේ නිෂ්පාදන පිරිනැමීම් පරිවර්තනය කරමින් සහ අපගේ සේවාදායකයින් සඳහා ලොතරැයි අත්දැකීම වැඩි කරමින් නව උච්චස්ථාන කරා සංවර්ධන ලොතරැයි මණ්ඩලය උසස් බවට පත්කර ඇත.

## අනාගත දැක්ම

අප අනාගතය දෙස බැලීමේදී, අපගේ අරමුණ වන්නේ අඛණ්ඩ වර්ධනය සහ වැඩිකළ පාරිභෝගික තෘප්තිය සහතික කිරීමට අපගේ මෙහෙයුම්වල විවිධ පැතිකඩ ආරක්ෂා කිරීමයි. අපගේ මාර්ගගත ලොතරැයි අලෙවිය වැඩි කිරීමට සහ අපගේ පාරිභෝගික පදනම පුළුල් කිරීමට ඩිජිටල් ලොතරැයි ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට සූදානම් වෙමු. වර්ධිත කාර්යක්ෂමතාව සඳහා අපගේ බෙදාහැරීම් ජාලය ප්‍රශස්ත කිරීමට සහ වඩා පහසු මෙහෙයුම් සඳහා ලොතරැයි කළමනාකරණ මෘදුකාංගය ඒකාබද්ධ කිරීමට උත්සාහයන් ක්‍රියාත්මකව පවති.

# සභාපතිතුමාගේ පණිවුඩය සහ ප්‍රගති වාර්තාව 2023

නව ගිණුම්කරණ යෝජනාවලියක් සහ අංක උත්පාදන ක්‍රමයක් යොදා ගනිමින් තොරතුරු තාක්ෂණ මෙහෙයුම් සඳහා ආපදා ප්‍රතිසාධන පද්ධතියක් ස්ථාපිත කිරීමට සැලසුම් ක්‍රියාත්මකව පවති. ලොතරැයි මිලදීගැනීමේ අවස්ථාවක් ඇතුළත් කරමින් නව වෙබ් අඩවියක් දියත් කිරීම මගින් සහය ලබන දිවයින පුරා අලෙවිකුටි සහ නවීන ලොතරැයි අලෙවිසැල් ව්‍යාපෘතිය සඳහා අපගේ සන්නාමකරණ වැඩසටහන ප්‍රගතිය අත්කර ගනු ඇත. අපගේ තොරතුරු තාක්ෂණ මෙහෙයුම්වල සහයෙන්, අපි නැවත සකස් කිරීමේ ක්‍රියාවලියක නිරතව සිටින අතර අවශ්‍ය පරිදි අපගේ කණ්ඩායම පුළුල් කරමු.

නව ලොතරැයි ඇදිමේ යන්ත්‍ර තුළ ආයෝජන සැලසුම් කරන අතර, තෘප්තිය සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි කිරීමට සංවර්ධන ලොතරැයි මණ්ඩලය තුළ පාරිභෝගික වෙනස්වීම් ක්ෂේත්‍ර හඳුනා ගැනීමට අපි අරමුණු කරන්නෙමු. මෙවැනි වැඩසටහන් තුළින් අනාගත අභියෝග සපුරාලීමට සහ පාරිභෝගික අපේක්ෂාවන් පසුකරයාමට සියලුම අංශ නව්‍යකරණය කිරීමට අපගේ කැපවීම ඉස්මතු කර දක්වයි.

## සමාප්ති සටහන

අපගේ ගමන් මාර්ගය පුරාවට අප වෙත ලබා දුන් සහයෝගය සහ මාහැඟි මගපෙන්වීම වෙනුවෙන් අතිගරු ජනාධිපතිතුමාටත්, ගරු අග්‍රාමාත්‍යතුමාටත්, ගරු මුදල් අමාත්‍යතුමාටත්, ගරු මුදල් රාජ්‍ය ඇමතිවරුන්ටත්, භාණ්ඩාගාර ලේකම්තුමාට මෙන්ම අධ්‍යක්ෂ මණ්ඩලයට මාගේ කෘතඥතාවය පුද කර සිටිමි. අපගේ කැපවූ සුවිශේෂී වෘත්තීමය කාර්ය මණ්ඩලයේ සහාය ඇතිව, දැනුම ලබා ගනිමින් සහ බෙදා ගනිමින් අපගේ විවිධ පාර්ශ්වකරුවන් සමග එක්ව කටයුතු කිරීමට ලැබීම මහඟු අත්දැකීමක් විය.




අපගේ සාර්ථකත්වයට අත්‍යවශ්‍ය වූ සියලු දිනුම් ඇදීම් අධීක්ෂණ මණ්ඩල සාමාජිකයන්ට, ජනාධිපති අරමුදලේ කාර්ය මණ්ඩලයට, මහපොළ උසස් අධ්‍යාපන භාර අරමුදලේ කාර්ය මණ්ඩලයට, බෙදාහැරීම් අලෙවි නියෝජිතවරුන්ට අලෙවි නියෝජිතයින්ට, අලෙවි සහායකයින්ට, ජනමාධ්‍ය හවුල්කරුවන්ට, බැංකුකරුවන්ට සහ සියලුම සේවා සපයන්නන්ට මම මාගේ විශේෂ ස්තූතිය පුද කරමි. එමෙන්ම සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් සහ සහකාර සාමාන්‍යාධිකාරීවරුන් ඇතුළු අපගේ විධායක කාර්ය මණ්ඩලයේ සියලු දෙනා වෙත මාගේ බලවත් ප්‍රශංසාව ප්‍රකාශ කර සිටින අතර ඔවුන්ගේ නායකත්වය නියුතු අපගේ ප්‍රගතියට සැලකියයුතු ලෙස දායක වී ඇත.

විවිධ කාර්යභාරයන්හී අපගේ සියලූම කාර්ය මණ්ඩලයටද ස්තූතිය පුදකර සිටින අතර, විශිෂ්ඨත්වය කරා ඔබගේ  අපූර්ව කැපවීම සහ බැඳීම සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ බලපෑම්සහගත ජයග්‍රහන සඳහා තීරණාත්මක වී ඇත. තවද, අපගේ ජයග්‍රහනයන් සඳහා මූලික වූ අපගේ පක්ෂපාති පාරිභෝගිකයින්ගේ අඛණ්ඩ සහයෝගය වෙනුවෙන්ද අපගේ ස්තූතිය පිරිනමමු.

එමෙන්ම, අපගේ මෙහෙයුම්වලදී තීරණාත්මක දායකත්වයන් වෙනුවෙන් විගණන අධිකාරීවරයාට සහ විගණකාධිපති දෙපාර්තමේන්තුවට ද අපගේ ස්තූතිය එලෙසම පිරිනමන්නෙමු.

අවසාන වශයෙන්, මෙම ආයතනය කෙරෙහි තබා ඇති විශ්වාසය හා බලාපොරොත්තුව වෙනුවෙන් අපගේ සියලුම පාර්ශවකරුවන්ට මම ස්තූතිවන්ත වෙමි. විශිෂ්ඨත්වය ලබාදීමට සහ චිරස්ථායී වටිනාකම නිර්මාණය කිරීමට කැපවූ ඔබගේ සහයෝගය අපගේ ගමන්මඟ ඉදිරියට ගෙන යාමට අපව ප්‍රබෝධමත් කරනු ඇත.

**අජිත් ගුණරත්න නාරගල**
සභාපති / ප්‍රධාන විධායක නිලධාරී

# අධ්‍යක්ෂ මණ්ඩලයේ සමාලෝචනය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා විගණනය කළ මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳ සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය සතුටට පත් වේ.

### ප්‍රධාන කාර්යයන්

මණ්ඩලයේ ප්‍රධාන කාර්යය වන්නේ ජනාධිපති අරමුදලට සහ මහපොල උසස් අධ්‍යාපන භාරකාර අරමුදලට ආදායම් උත්පාදනය කිරීමයි.

### වසරේ කාර්යසාධනය පිළිබඳ සමාලෝචනය

පෙර නොවූ විරූ ආර්ථික අර්බුදයක් මධ්‍යයෙහි වුවද සංවර්ධන ලොතරැයි මණ්ඩලය ජනාධිපති අරමුදලට රු.මිලියන 3,623ක සැලකියයුතු දායකවයක් සිදු කළ අතර මෙය 2022 වසර තුළ සිදුකළ දායකත්වයට වඩා 13%ක ප්‍රශංසනීය වැඩිවීමකි. තවද, සංවර්ධන ලොතරැයි මණ්ඩලය රු.බිලියන 25.4ක ආකර්ෂණීය පිරිවැටුමක් අත්කරගෙන ඇති අතර එය පසුගිය වසරේ රු. මිලියන 19.0 ට සාපේක්ෂව 33%ක වැඩිවීමක් පිළිබිඹු කරයි.

### ආයතනික සමාජ වගකීම (CSR)

අපගේ ආයතනික සමාජීය වගකීම් කටයුතු පිළිබඳ විස්තර මෙම වාර්ෂික වාර්තාවේ මෙහෙයුම් සමාලෝචන කොටස යටතේ දැක්වේ.

### මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

මණ්ඩලයේ කටයුතුවල තත්ත්වය පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබාදෙන පරිදි මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටියි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල අවශ්‍යතාවන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති බව අධ්‍යක්ෂවරුන්ගේ මතය වේ.

### විගණකවරයාගේ වාර්තාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව සහ 1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 14 (3) වගන්තිය අනුව විගණකාධිපතිවරයා සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ විගණකවරයා වන්නේය. 2023 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ 48 පිටුවේ දැක්වේ.

### ගිණුම්කරණ ප්‍රතිපත්ති

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (LKASs) අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇත. මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී යොදා ගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති 73 සිට 77 දක්වා පිටුවල දක්වා ඇත. සමාලෝචිත වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල කිසිදු සැලකියයුතු වෙනස්වීම් සිදු වී නොමැත.

### අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයින් මණ්ඩලයේ කොන්ත්‍රාත් සමඟ බැඳීම

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා අධ්‍යක්ෂවරුන්ට මණ්ඩලයේ කිසිදු කොන්ත්‍රාත්තුවක් හෝ යෝජිත කොන්ත්‍රාත්තුවක් සමඟ සෘජු හෝ වක්‍ර බැඳියාවක් නොමැත.

### විගණන සහ කළමනාකරණ කමිටුව

පාලන පද්ධතියේ උප කමිටුව ලෙස විගණන සහ කළමනාකරණ කමිටුවට ආයතනයේ පාලන සහ අවදානම් කළමනාකරණ පද්ධති සමාලෝචනය, අභ්‍යන්තර පාලන ක්‍රියාවලි නියාමනය සහ අභ්‍යන්තර විගණන සහ ව්‍යවස්ථාපිත විගණන කාර්යන් අධීක්ෂණය කිරීමේ සමස්ත වගකීම ඇත. එයට අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය නියාමනය කිරීම සහ අභ්‍යන්තර විගණනය සහ ව්‍යවස්ථාපිත විගණනය පාලනය කිරීම පවරා ඇත. විගණන සහ කළමනාකරණ කමිටුවේ වාර්තාව 46 පිටුවේ දක්වා ඇත.

### නීති සහ රෙගුලාසිවලට අනුකූලතාව

අධ්‍යක්ෂවරු ඔවුන්ගේ උපරිම දැනුම සහ විශ්වාසයට අනුව, මණ්ඩලය නීති සහ රෙගුලාසි උල්ලංඝනය කරනු ලබන කිසිදු කාර්යයක නියලී නොමැති බව තහවුරු කර සිටී.

### ව්‍යවස්ථාපිත ගෙවීම්

ජනාධිපති අරමුදලට, රජයේ බදු සහ සේවකයින් සම්බන්ධයෙන් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තියන්ගේ භාර අරමුදල ගෙවියයුතු සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් සහ පාරිතෝෂික නිසි වේලාවට ගෙවා ඇති බව අධ්‍යක්ෂවරු තහවුරු කර සිටී.

### ශේෂ පත්‍රයෙන් පසු සිදුවීම්


මූල්‍ය වසර අවසානය සහ මෙම වාර්තාවේ දිනය අතර කාලය තුළ ගැලපීම් හෝ අනාවරණය කළ යුතු කිසිදු වැදගත් කරුණක් පැන නැගී නොමැති බව අධ්‍යක්ෂවරුන්ගේ මතය වේ.

### අඛණ්ඩතා පැවැත්ම

මණ්ඩලයේ සම්පත් එහි මෙහෙයුම් අඛණ්ඩව ගෙන යාම සඳහා ප්‍රමාණවත් බව අධ්‍යක්ෂවරුන්ගේ විශ්වාසය වේ. එමනිසා, මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී ඔවුන් අඛණ්ඩතා පැවැත්ම යොදා ගෙන ඇත.

අවසාන වශයෙන්, අපට සහාය දැක්වූ අතිගරු ජනාධිපතිතුමාටත්, ගරු අග්‍රාමාත්‍යතුමාටත්, ගරු මුදල් අමාත්‍යතුමාටත්, ගරු මුදල් රාජ්‍ය අමාත්‍යතුමා සහ අභියෝග මධ්‍යයෙහි වුවද කැපවීමෙන් කටයුතු කළ අපගේ ක්‍රියාශීලී කාර්ය මණ්ඩලයටත් අපගේ අවංක ස්තූතිය පුද කර සිටිමි. අප වෙත ලබා දෙන මහඟු දායකත්වයන් වෙනුවෙන් අපගේ අලෙවි බලකායට, විශේෂයෙන් ම බෙදාහැරීමේ අලෙවි නියෝජිතයින්ට, අලෙවි නියෝජිතයින්ට, අලෙවි සහායකයින්ට අපගේ විශේෂ ප්‍රශංසාව පුද කර සිටිමි.

එමෙන්ම, සංවර්ධන ලොතරැයි මණ්ඩලය කෙරෙහි තබා ඇති අඛණ්ඩ විශ්වාසය සහ බලාපොරොත්තුව වෙනුවෙන් අපගේ සියලුම ගනුදෙනුකරුවන්ට සහ පාර්ශවකරුවන්ට මාගේ හෘදයංගම ස්තුතිය පුද කර සිටිමි.



**ජෙනට් ජයවර්ධන මහත්මිය (නීතිඥ)**

අධ්‍යක්ෂ

# අධ්‍යක්ෂ මණ්ඩලය - 2023



01



02



03



04



05

**01 අජිත් ගුණරත්න නාරගල මහතා**
*සභාපති/ප්‍රධාන විධායක නිලධාරී 2021.12.16 දින සිට*

**02 ඒ.එම්.පී.එම්.බී. අතපත්තු මහතා**
*ලේකම්, වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා අමාත්‍යංශය*
*අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය - 2023.09.27 දින සිට*

**03 ඩබ්ලිව්.ඒ. සරත් කුමාර මහතා**
*භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්, මුදල් අමාත්‍යංශය*
*ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්, ජනාධිපති ලේකම් කාර්යාලය,*
*ලේකම්, ජනාධිපති අරමුදල,*
*අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය - 2022.08.22 දින සිට*

**04 කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය**
*අධ්‍යක්ෂ, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යංශය*
*අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය - 2021.06.28 දින සිට*

**05 ජෙනට් ජයවර්ධන මහත්මිය**
*(නීතිඥ),*
*අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය - 2020.01.15 දින සිට*

# වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය



01



02



03



04



05

**01 අජිත් ගුණරත්න නාරගල මහතා**
සභාපති/ප්‍රධාන විධායක නිලධාරී 2021.12.16 දින සිට

**02 ඒ.එම්.පී.එම්.බී. අතපත්තු මහතා**
ලේකම්, වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය
අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය - 2023.09.27 දින සිට

**03 ඩබ්ලිව්.ඒ. සරත් කුමාර මහතා**
භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්, මුදල් අමාත්‍යාංශය
ජ්‍යේෂ්ඨ අතිරේක ලේකම්, ජනාධිපති ලේකම් කාර්යාලය,
ලේකම්, ජනාධිපති අරමුදල,
අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය - 2022.08.22 දින සිට

**04 කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය**
අධ්‍යක්ෂ, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය
අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය - 2021.06.28 දින සිට

**05 ජෙනට් ජයවර්ධන මහත්මිය**
(නීතිඥ),
අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය - 2020.01.15 දින සිට

# සංවර්ධන ලොතරැයි මණ්ඩලය අධ්‍යක්ෂ මණ්ඩලයේ විස්තර 2023

## අජිත් ගුණරත්න නාරගල මහතා

සභාපති/ප්‍රධාන විධායක නිලධාරී සංවර්ධන ලොතරැයි මණ්ඩලය

### පත්වීම් දිනය

2021 දෙසැම්බර් 16

### අධ්‍යාපනය, දක්ෂතාව සහ පළපුරුද්ද

- MBA - මහත්මා ගාන්ධි විශ්ව විද්‍යාලය, ඉන්දියාව (2015)
- PGDEM, දේවාන්ශී විද්‍යාලය, ඉන්දියාව
- BPA (Special), දෘශ්‍ය හා ප්‍රසාංගික කලා විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව
- Dip in Business Management -LAVTC, ශ්‍රී ලංකාව
- රාජ්‍ය ආයතනවල දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය සහ උපාය මාර්ගික සැලසුම් හරහා නායකත්වය ලබාදීමේ අද්විතීය පළපුරුද්ද
- අලෙවිකරණය, සන්නාම ගොඩනැගීම, වෙළෙඳපොළ පුළුල් කිරීම පිළිබඳ පුද්ගලික අංශයේ පරිපාලන සහ නායකත්ව පළපුරුද්ද

### වෙනත් පත්කිරීම්

- අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
  - ස්වාධීන රූපවාහිනී සේවය
  - BCC ලංකා ලිමිටඩ්
- විශ්වවිද්‍යාල පාලක සභා සාමාජික - රුහුණු විශ්වවිද්‍යාලය
- බාහිර කථිකාචාර්ය - කැලණිය විශ්වවිද්‍යාලය
- බාහිර කථිකාචාර්ය - දෘශ්‍ය හා ප්‍රාසාංගික කලා විශ්ව විද්‍යාලය
- කළමනාකර අධ්‍යක්ෂ,ලක්ෂරි කෙයාරින් (පුද්ගලික) සමාගම

### පෙර පත්කිරීම්

- අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව
- මෙහෙයුම් අධ්‍යක්ෂ - ජාතික තරුණ සේවා සභාව
- අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - ජාතික තරුණ සේවා සභාව

## ඒ.එම්.පී.එම්.බී. අතපත්තු මහතා

අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය

### පත්වීම් දිනය

2023 සැප්තැම්බර් 27

### අධ්‍යාපනය, දක්ෂතාව සහ පළපුරුද්ද

- MBA -ජාත්‍යන්තර සංවර්ධනය, ෆ්ලින්ඩර්ස් විශ්වවිද්‍යාලය, ඕස්ට්‍රේලියාව
- සංවර්ධන ආර්ථිකය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, සංවර්ධන ආර්ථික විද්‍යා මධ්‍යස්ථානය, ජපානය
- ආර්ථික සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා, කොළඹ විශ්වවිද්‍යාලය
- BSc (රාජ්‍ය කළමණාකරණය) - ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
- වරලත් ගණකාධිකාරී ආයතනයේ ආවසර්ක සහතිකය
- ශ්‍රී ලංකා සැලසුම් සේවය තුළ වසර 30කට වැඩි පළපුරුද්ද

### වෙනත් පත්කිරීම්

- ලේකම්, වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යංශය

### පෙර පත්කිරීම්

- ශ්‍රී ලංකා ජනාධිපති ජ්‍යේෂ්ඨ අතිරේක ලේකම්
- අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්), අධ්‍යාපන අමාත්‍යංශය
- භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්, මුදල් අමාත්‍යංශය
- අධ්‍යක්ෂ ජනරාල්, සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යංශය

## ඩබ්ලිව්.ඒ. සරත් කුමාර මහතා

අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය

### පත්වීම් දිනය

2022 අගෝස්තු 22

### අධ්‍යාපනය, දක්ෂතාව සහ පළපුරුද්ද

- කළමනාකරණය සහ තක්සේරුකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් (SLIDA) රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය
- ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ වසර 36කට වැඩි පළපුරුද්ද

### වෙනත් පත්කිරීම්

- භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්, මුදල් අමාත්‍යංශය
- ජ්‍යේෂ්ඨ අතිරේක ලේකම් ජනාධිපති කාර්යාලය
- ලේකම්, ජනාධිපති අරමුදල.

### පෙර පත්කිරීම්

- ආපදා කළමනාකරණ අමාත්‍යංශයේ ප්‍රධාන ගණකාධිකාරී
- ආර්ථික සංවර්ධන අමාත්‍යංශයේ ප්‍රධාන ගණකාධිකාරී
- අග්‍රාමාත්‍ය කාර්යාලයේ ප්‍රධාන මූල්‍ය නිලධාරී
- රියාද්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ අමාත්‍ය උපදේශක
- නියෝජ්‍ය සමාගම් රෙජිස්ට්‍රාර් (මුදල්)

## කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය

අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය

### පත්වීම් දිනය

2021 ජූනි 28

### අධ්‍යාපනය, දක්ෂතාව සහ පළපුරුද්ද

- BSc - කැලණිය විශ්වවිද්‍යාලය
- MSc (ජීව තාක්ෂණ විද්‍යාව) - පේරාදෙනිය විශ්වවිද්‍යාලය
- MA (ආර්ථික විද්‍යාව) - කැලණිය විශ්වවිද්‍යාලය
- MA (ප්‍රතිපත්ති ආර්ථික විද්‍යාව) - විලියම්ස් කොලීජිය, USA
- රාජ්‍ය මූල්‍ය, ආදායම් ප්‍රතිපත්ති සහ විදේශ සංවර්ධන සහය පිළිබඳ වැඩ කිරීමේ පළපුරුද්ද

### වෙනත් පත්කිරීම්

- අධ්‍යක්ෂ, බාහිර සම්පත් දෙපාර්තමේන්තුව

## ජෙනට් ජයවර්ධන මහත්මිය

අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය

### පත්වීම් දිනය

2020 ජනවාරි 15

### අධ්‍යාපනය, දක්ෂතාව සහ පළපුරුද්ද

- LLB – නීති පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
- වසර 22ක පළපුරුද්ද

### වෙනත් පත්කිරීම්

- සභාපති - කුරුණෑගල වැවිලි සමාගම (2022 ඔක්තෝබර් සිට මේ දක්වා)

### පෙර පත්කිරීම්

- නීති උපදේශක - වයඹ පළාත (2004 සිට 2010)
- NICD සභාපති - 2019 වසර

# කළමනාකරණ කණ්ඩායම ජ්‍යේෂ්ඨ කළමනාකරුවන්



**අජිත් ගුණරත්න නාරගල මහතා**
සභාපති/ප්‍රධාන විධායක නිලධාරී



**ඩබ්ලිව් කේ.ඒ.ඒ. ජයරත්න මහතා**
සාමාන්‍යාධිකාරී



**ඩබ්ලිව් ඒ. වී.සී. සෝමරත්න මෙනවිය**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්))



**ඩී.ඩී.සී. දම්මින්ද මහතා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි)



**ජේ.ඒ.ටී. කසුන් ජයසූරිය මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්)



**එම්.එන්.පී. පෙරේරා මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්)



**එස්.එම්.ඒ. ඩබ්ලිව් උදය කුමාර මහතා**
අභ්‍යන්තර විගණක



**ආචාර්ය ඒ.එස්. ගුණසිංහ මහත්මිය**
සහකාර සාමාන්‍යාධිකාරී (අලෙවි)



**කේ.ආර්.පී. රණසිංහ මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පරිපාලන)

# කළමනාකරණ කණ්ඩායම - ජ්‍යේෂ්ඨ කළමනාකරුවන්



**පී.ඩී.යූ. මලින්ත මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන)



**සී.සී. අයිලප්පෙරුම මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී (විකුණුම්) වැඩබලන

# කළමනාකරණ කණ්ඩායම
# කණිෂ්ඨ කළමනාකරුවන්



**ඊ.ඩී.අයි.එන්.එස්. අබේරත්න මහතා**
පරිපාලන නිලධාරි



**සී.එන්. තෙවරප්පෙරුම මහත්මිය**
මානව සම්පත් නිලධාරි



**එන්.වී. ඉන්දික උපුල් මහතා**
ගිණුම් නිලධාරි



**ජී.ඩී.එස්. ප්‍රේමතිලක මහත්මිය**
අලෙවිකරණ හා ප්‍රචාරණ නිලධාරි



**බී.ඒ.සී.ජේ. කරුණාරත්න මහතා**
ප්‍රසම්පාදන නිලධාරි



**ආර්.ඩී.සී. රාජපක්ෂ මහත්මිය**
ගිණුම් නිලධාරි



**අයි.ඩී. පත්ම කුමාරසිරි මහතා**
කලාප කළමනාකරු



**එම්.බී.එම්.එන්.කේ. බලගල්ල මහතා**
කලාප කළමනාකරු



**පී.ඒ.ආර්.එස්. රණතුංග මහතා**
කලාප කළමනාකරු

# කළමනාකරණ කණ්ඩායම - කණිෂ්ඨ කළමනාකරුවන්



**එම්.කේ.ඒ.අයි.කමල්සිරි මහතා**
කලාප කළමනාකරු



**ඩී.එම්.බී.එල්. මහින්ද මහතා**
කලාප කළමනාකරු



**එම්.එල්. ගෞරි කෞශල්‍යා මහත්මිය**
කලාප කළමනාකරු



**එම්.ඒ.එල්.එන්. ගුණසේකර මහත්මිය**
ගිණුම් නිලධාරි



**ආර්.ඒ.ඩබ්ලිව්.ජී. රූපසිංහ මහත්මිය**
ගිණුම් නිලධාරි



**යූ.ජී. ඉලේපෙරුම මහතා**
පද්ධති විශ්ලේෂක



**මේජර් ජේ.එම්.ඩී.ඒ. ක්‍රිෂාන්ත මහතා**
ප්‍රධාන ආරක්ෂක නිලධාරි



**ආර්.ඒ. සුනිල් රත්නායක මහතා**
කලාප කළමනාකරු



**ආර්.එම්.යූ.එස්.කුමාර මහතා**
කලාප කළමනාකරු



**පී. ගෝකුල ප්‍රනාන්දු මහතා**
ප්‍රවාහන නිලධාරී



**සී.ජේ.බී. ජයවර්ධන මහතා**
කලාප කළමනාකරු

# මෙහෙයුම් සමාලෝචනය

## 2023 වර්ෂයේ අලෙවි කටයුතු පිළිබඳ සුවිශේෂී කරුණු

2023 වසර යනු සංවර්ධන ලොතරැයි මණ්ඩලය තම අලෙවි කටයුතු විධිමත් ලෙස සැලසුම් කර අලෙවිය සාර්ථක කරගත් වසරක් ලෙස හැඳින්විය හැකිය.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් බොහෝ අලෙවි නියෝජිතයින් හා බෙදාහැරීමේ අලෙවි නියෝජිත මහත්ම මහත්මීන්ගේ දීර්ඝකාලීන ඉල්ලීම් වැඩිදුරටත් සළකා බැලීමෙන් අනතුරුව මුදල් අමාත්‍යාංශයේ ද උපදෙස් ඇතිව සියලුම ලොතරැයිවල මිල රු.20 සිට 40 දක්වා වැඩි කිරීමට 2023 ජූලි 06 වන දින සිට තීරණය කරන ලදී. මිල රු.20 පවතින විට පැවැති දෛනික ලොතරැයිපත් අලෙවිය මිලියන 3.5 සිට ටිකට් පතක මිල රු.40 දක්වා වැඩි කිරීමෙන් පසුව මිලියන 1.9 දක්වා පහත වැටුණි. කෙසේ නමුත් පිරිවැටුම සළකා බැලීමේදී එය දිනක අලෙවි ආදායම මිලියන 70 සිට මිලියන 76 දක්වා දක්වා වැඩි වීමකි. එය ප්‍රතිශතාත්මකව බැලුවහොත් 8.5% ක වර්ධනයකි.

සංවර්ධන ලොතරැයියේ තවත් සුවිශේෂ සංදිස්ථානයක් ලෙස එහි ලොතරැයි සංයුතියට තවත් ඉතාමත් සුවිශේෂ ලොතරැයිපතක් 2023 වසරේ අග භාගයේදී ශ්‍රී ලාංකික ජන සමාජයට තව තවත් කෝටිපතියන්, දස ලක්ෂපතියන්, ලක්ෂපතියන් හා සෙසු ත්‍යාග දිනාගත් ජයග්‍රාහකයින් බිහිකිරීමේ අදිටනින් "සුපිරි ධන සම්පත" නමින් සතියේ දින හතේම දිනුම් අදිනු ලබන ලොතරැයියක් වෙළඳපලට හඳුන්වා දෙන ලදී. සුපිරි ධන සම්පත හඳුන්වා දීමෙන් පසුව මිල වැඩි කිරීමෙන් පසුව පහත වැටුණු දෛනික ලොතරැයිපත් අලෙවිය මිලියන 1.9 සිට මිලියන 2.2 දක්වා තවදුරටත් වර්ධනය විය.

මෙම වසර තුල ඉහළ එළදායි මට්ටමකට ලඟාවීමට අපට හැකිවීම හේතුකොට ගෙන ජනාධිපති අරමුදලට වාර්තාගත මුදල් ප්‍රමාණයක් බැර කිරීමටත්, ත්‍යාග වශයෙන් රුපියල් බිලියන 13.4 කට ආසන්න ජයග්‍රාහකයින්ට ලබා දීමටත් සංවර්ධන ලොතරැයි මණ්ඩලයට හැකි විය. මීට අමතරව රජයට බදු මුදල් වශයෙන් රුපියල් බිලියන 1.67 ක්ද, අලෙවි නියෝජිත ජාලය වෙනුවෙන් කොමිස් මුදල් වශයෙන් රු. බිලියන 5.3 ක්ද ලබා දීමට අපට හැකියාව ලැබිණි.

2023 වර්ෂයේ විශේෂයෙන් දියත් කල ප්‍රවර්ධන වැඩසටහන්, අලෙවි නියෝජිත රැස්වීම් හා ඔවුන් මූල්‍යමය වශයෙන් අභිප්‍රේරණය කිරීම මත අලෙවිය බිලියන 26.5 ක් දක්වා වැඩිකර ගැනීමට අපට හැකි විය. මෙය පෙර වර්ෂ හා සැසඳීමේ දී ඉතා ඉහළ ප්‍රගතියකි.

2023 වර්ෂයේදී සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ පහත සඳහන් අලෙවි ප්‍රවර්ධන උපාය මාර්ගයන් නිසා අලෙවිය කටයුතු ඉහළ මට්ටමට ගෙන ඒමට හැකි විය.

## 01. ප්‍රවර්ධන වැඩසටහන් ත්‍යාග රටා වෙනස්වීම්

ලොතරැයිවල මිල වැඩි කිරීමත් සමඟ තවදුරටත් ලොතරැයිපත් වලින් ලබා දෙනු ලබන ත්‍යාග ප්‍රමාණයන් වැඩි කිරීමේ අරමුණින් ප්‍රධාන දිනුම් ඇදීමේන් අනතුරුව නැවත දිනුම් ඇදීමක් සිදු කර තවදුරටත් ත්‍යාග ලබා දීමේ වැඩසටහනක් "දෙවැනි වරම" නමින් අද කෝටිපති, ලග්න වාසනාව, සුපර් බෝල්, ශනිදා, කප්රුක සහ ජයෝදා ලොතරැයිපත් සඳහා 2023 ජූලි 06 වන දින සිට 2023 අගෝස්තු 22 දක්වා ක්‍රියාත්මක කරන ලදී.

තවදුරටත් අලෙවිය වර්ධනය කර ගැනීමේ අරමුණින් 2023 අගෝස්තු 23 වන දින සිට 2023 සැප්තැම්බර් 30 වන දින දක්වා ලග්න වාසනාව, අද කෝටිපති, කප්රුක සහ ශනිදා ටිකට්පත් සඳහා "ලග්න වරම" නමින් විශේෂ දිනුම් ඇදීම සිදු කරන ලද අතර ලග්න සංකේතය ගැලපීමෙන් රු.40 ක මුදලක් ලබා දෙන ලද අතර ඊට සමගාමීව "සෙකන්ඩ් චාන්ස්" යන නමින් රු.100,000 සහ රු.400 මුදල් ත්‍යාග ලබා දීමේ විශේෂ දිනුම් ඇදීම් මාලාවක් අද කොටිපති, ලග්න වානාව, සුපර් බෝල් , ශනිදා, කප්රුක සහ ජයෝදා ලොතරැයිපත් සඳහා ක්‍රියාත්මක කරන ලදී.

2023 ඔක්තෝම්බර් 01 වන දින සිට 2023 ඔක්තෝම්බර් 31 වන දින දක්වා ලග්න වාසනාව ටිකට්පත් සඳහා පමණක් "ලග්න වරම" විශේෂ දිනුම් ඇදීම ක්‍රියාත්මක වූ අතර "සෙකන්ඩ් චාන්ස්" යන නමින් රු.100,000 සහ රු.400 මුදල් ත්‍යාග ලබා දීමේ විශේෂ දිනුම් ඇදීම් මාලාවක් ලග්න වාසනාව සහ කප්රුක ලොතරැයිපත් සඳහා ක්‍රියාත්මක වූ අතර අද කෝටිපති සහ ශනිදා ලොතරැයිපත් වෙතින් රු.100,000 මුදල් ත්‍යාග රැසක් පාරිභෝගිකයන් වෙත බෙදා දෙන ලදී.

2023 දෙසැම්බර් 11 වන දින සිට "සෙකන්ඩ් චාන්ස්" විශේෂ දිනුම් ඇදීම නැවත වරක් වෙළඳපලට හඳුන්වා දුන් අතර අදකෝටිපති, සුපර් බෝල්, ශනිදා සහ සුපිරි ධන සම්පත ලොතරැයිපත් සඳහා රු.100,000 මුදල් ත්‍යාග සහ ලග්න වාසනාව ලොතරැයිපත සඳහා රු.50,000 මුදල් ත්‍යාග ලබා දෙන ලදී. 2023 දෙසැම්බර් 18 වන දින සිට ජයෝදා ලොතරැයිපත් සඳහා "සෙකන්ඩ් චාන්ස්" විශේෂ දිනුම් ඇදීම වෙතින් රු.50,000 මුදල් ත්‍යාග ලබා දෙන ලදී.

### ලග්න වාසනාව

ලොතරැයිවල මිල රු. 40 දක්වා වැඩි කිරීමට සමගාමීව 2023 ජූලි 06 වන දින සිට දිනපතා වෙළඳපලේ වැඩිම ජයග්‍රාහකයින් පිරිසක් බිහිකරන "ලග්න වාසනාව" ලොතරැයිපතේ ආරම්භක ජයමල්ල ලක්ෂ 20 සිට ලක්ෂ 30 දක්වා වැඩි කරන ලද අතර, ලක්ෂ 5 ජයමල්ල ලක්ෂ 10 ලෙසද වැඩි කර ඇති අතර අනෙකුත් ත්‍යාග දෙගුණ කරන ලදී.

ලග්න වසනාව ලොතරැයිය සඳහා " සුපිරි ධන යෝගය" නමින් 2023 මාර්තු 24 (සිකුරාදා) විශේෂ දිනුම් ඇදීමක් පැවැත්වූ අතර මෙම දිනුම් ඇදීමේ දිනයේදී ලොතරැයිපත් මිලියන 3.6 ක අලෙවියක් සිදු කරන ලදී.

### අද කෝටිපති

2023 ජූලි 06 වන දින සිට දිනපතා කෝටිපති වරම් හිමිකරන "අද කෝටිපති" ලොතරැයිපතේ සුපිරි ජයමල්ල හැර සියලු ත්‍යාග මුදල් දෙගුණ කරන ලදී. අද කෝටිපති ලොතරැයිපත් මිලදී ගන්නා පාරිභෝගික ජනතාවට තවදුරටත් වැඩි වැඩියෙන් ත්‍යාග ලබා දීමේ අරමුණින් 2023 ජූනි 28 වන දින (බදාදා) "අද විශේෂ කෝටිපති" නමින් විශේෂ දිනුම් ඇදීමක් පැවැත්වූ අතර මෙම දිනුම් ඇදීම මගින් ලොතරැයිපත් මිලියන 3.3 ක අලෙවියක් වාර්තා විය. එමෙන්ම මේ තුළින් 756,360 ක ත්‍යාගලාභීන් රැසක් බිහි කිරීමට සමත් විය.

### කප්රුක

සිහිනවලටත් ඉහළින් පැතුම් ඉටු කරන "කප්රුක" ලොතරැයිපතේ සුපිරි ජයමල්ල 2023 ජූලි 06 වන දින සිට කෝටි 41 ලෙස හඳුන්වා දෙන ලද අතර කප්රුක ලොතරැයි පතේ අනෙකුත් ත්‍යාග දෙගුණ කරන ලදී. කප්රුක ලොතරැයියෙහි අති විශාල ජයමල්ල ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් 2023 අප්‍රේල් 10 වන දින (බ්‍රහස්පතින්දා) "කප්රුක පවර් ප්ලේ" නමින් විශේෂ දිනුම් ඇදීමක් පැවැත්වූ අතර මෙම දිනුම් ඇදීම මගින් ලොතරැයිපත් මිලියන 1.1 ක අලෙවියක් වාර්තා විය. මේ තුළින් රු.61,124,300 මුදල් ත්‍යාග ප්‍රමාණයක් ලබා දීමට සංවර්ධන ලොතරැයි මණ්ඩලයට හැකි විය.

කප්රුක ලොතරැයිපත සඳහා වූ ඉහළ ඉල්ලුම සැලකිල්ලට ගනිමින් එය තවදුරටත් වෙළඳපළ තුළ ප්‍රචලිත කිරීමේ අරමුණින් 2023 දෙසැම්බර් 29 වන (සිකුරාදා) "කප්රුක පවර් ප්ලේ" නමින් විශේෂ දිනුම් ඇදීමක් පැවැත්වූ අතර මෙම දිනුම් ඇදීම මගින් ලොතරැයිපත් මිලියන 2 ක වාර්තාගත අලෙවියක් වාර්තා විය. ඒ තුළින් රු.43,129,200 ක මුදල් ත්‍යාග ප්‍රමාණයක් පාරිභෝගික ජනතාව වෙත බෙදා දෙන ලදී.

### ශනිදා

පායන හිරු මෙන් විශ්වාස "ශනිදා" වෙළඳපලේ ඉහළ ජනප්‍රියතාවයක් දිනා සිටින වැඩිම ජයග්‍රාහකයින් පිරිසක් බිහිකරන "ශනිදා" ලොතරැයිපතේ ආරම්භක ජයමල්ල වන රු.කෝටි 3 කෝටි 5 දක්වා වැඩි කරන ලද අතර, අනෙකුත් ත්‍යාගද, වැඩි කර වැඩි ජයග්‍රාහකයින් පිරිසක් බිහිවන ආකාරයට මිල වැඩි කිරීමට සමගාමීව ත්‍යාග රටාව වෙනස් කරන ලදී.
2023 මැයි මස 30 වන දින (අඟහරුවාදා) 'වින් වින් කෑෂ්' නමින් විශේෂ දිනුම් ඇදීමක් පැවැත්වූ අතර මෙම දිනුම් ඇදීම මගින් ලොතරැයිපත් මිලියන 2.9 ක අලෙවියක් වාර්තා විය. ඒ තුළින් රු.43,129,200 ක මුදල් ත්‍යාග ප්‍රමාණයක් පාරිභෝගික ජනතාව වෙත බෙදා දෙන ලදී.

### සුපර් බෝල්

වෙළඳපලේ පෙරලිකාර ලොතරැයිය වන "සුපර් බෝල්" සන්නාමය ප්‍රවර්ධනය





කිරීමේ අරමුණින් 2023 පෙබරවාරි මස 28 වන දින (අඟහරුවාදා) කෑෂ් ෆ්ලෑෂ් නමින් විශේෂ දිනුම් ඇදීමක් පැවැත්වූ අතර මෙම දිනුම් ඇදීම මඟින් ලොතරැයිපත් මිලියන 3.2 ක අලෙවියක් වාර්තා විය. මෙම විශේෂ දිනුම් ඇදීම මඟින් රු.32,283,540 ක ත්‍යාග මුදලක් ලබා දෙන ලදී. සුපර් බෝල් ලොතරැයිපතෙහි මිල වැඩිකිරීමත් සමඟම සුපිරි ජයමල්ල හැර අනෙකුත් සියලු ත්‍යාග මුදල් 2023 ජූලි 06 වන දින සිට දෙගුණ කරන ලදී.

## සසිරි

වෙළඳපලේ ලක්ෂපතියන් වැඩියෙන්ම බිහි කරන ලොතරැයිය ලෙස ජනප්‍රියතාවය දිනා ඇති "සසිරි" ලොතරැයිපතේ සියලුම මුදල් ත්‍යාග 2023 ජූලි 06 වන දින සිට දෙගුණ කරන ලදී. 2023 ලක්ෂපතියන් 1634 ක් බිහි කිරීමට සංවර්ධන ලොතරැයි මණ්ඩලයට හැකි විය.

## ජයෝදා

ඔබට උරුම ජයක් "ජයෝදා" ලොතරැයිපතෙන් ලබා දෙන ත්‍යාග සුපිරි ජයමල්ල හැර අනෙකුත් මුදල් ත්‍යාග 2023 ජූලි 06 වන දින සිට දෙගුණ කරන ලදී.

## සංවර්ධන වාසනාව

සංවර්ධන වාසනාව ලොතරැයිපතේ සුපිරි ජයමල්ල හැර අනෙකුත් මුදල් ත්‍යාග 2023 ජූලි 06 වන දින සිට දෙගුණ කරන ලදී. කළමනාකාරිත්වයේ උපායමාර්ගික තීරණයකට අනුව 2023 නොවැම්බර් 05 වන දින සිට මෙම ලොතරැයිපත වෙළඳපලෙන් ඉවත් කිරීමට තීරණය කරන ලදී.

## වාලම්පුරි

උතුරු නැගෙනහිර ජනතාව ඉලක්ක කර ගනිමින් එම ප්‍රදේශයේ ජනතාව වෙත වැඩියෙන් ත්‍යාග ලබා දීමේ අරමුණින් වාසනාවේ ජය සංකේතය "වාලම්පුරි" නමින් රු.50 ක මිලකට 2022 වසරේ අග භාගයේදී වෙළඳපළට හඳුන්වා දුන් අතර මෙම ලොතරැයිපත මාස දෙකකට වරක් දිනුම් අදිනු ලබයි. මෙහි දෙවන දිනුම් ඇදීම 2023 ජනවාරි 17 වෙනිදා (අඟහරුවාදා) දිනුම් අදින ලද අතර මෙම දිනුම් ඇදීම මඟින් ලොතරැයිපත් මිලියන 1.2 ක අලෙවියක් වාර්තා විය.

2023 මාර්තු 16 වන දින (බ්‍රහස්පතින්දා) පවත්වන ලද තුන්වන දිනුම් ඇදීම මඟින් පිළිවෙලින් ලොතරැයිපත් මිලියන 1.0ක අලෙවියක් සිදු විය. එමෙන්ම 2023 මැයි 12 වන දින (සිකුරාදා) සහ 2023 ජූලි 21 වන දින (සිකුරාදා) වන දින පවත්වන ලද හතරවන සහ පස්වන දිනුම් ඇදීම මඟින් පිළිවෙලින් ලොතරැයිපත් මිලියන 0.7ක සහ 0.5ක අලෙවියක් සිදු විය.

## සුපිරි ධන සම්පත

ලොතරැයි ඉතිහාසයේ ප්‍රථම වතාවට ත්‍රිමාණ සජීවිකරණ තාක්ෂණය හඳුන්වා නව්‍යතාවයෙන් යුතු දිනුම් ඇදීමක් ප්‍රථම වරට හඳුන්වා දෙමින් ශ්‍රී ලාංකික ජන සමාජයට තව තවත් කෝටිපතියන්, දස ලක්ෂපතියන්, ලක්ෂපතියන් හා සෙසු ත්‍යාග දිනාගත් ජයග්‍රාහකයින් බිහිකිරීමේ අදිටනින් සහ තවදුරටත් වාසනාවේ නිම් වළලු පුළුල් කරමින් " සුපිරි ධන සම්පත" නමින් සතියේ දින හතේම දිනුම් අදිනු ලබන ලොතරැයියක් 2023 නොවැම්බර් 09 (බ්‍රහස්පතින්දා) වන දින වෙළඳපලට හඳුන්වා දෙන ලදී. මෙහි මංගල දිනුම් ඇදීමේදී ලොතරැයිපත් මිලියන 1.6 ක අලෙවියක් වාර්තා වූ අතර මෙමගින් දෛනික ලොතරැයිපත් අලෙවිය මිලියන 1.9 සිට මිලියන 2.2 දක්වා වර්ධනය විය.

## ලකී ෆ්‍රීඩම්

2023 නිදහස් සැමරුම නිමිත්තෙන් "ලකී ෆ්‍රීඩම්" නමින් විශේෂ ලොතරැයිපතක් වෙළඳපළට හඳුන්වා දුන් අතර මෙම දිනුම් ඇදීම මඟින් ලොතරැයිපත් මිලියන 1.4. ක අලෙවියක් වාර්තා විය.

## 2023 වර්ෂයේ ලබා දුන් සුපිරි ත්‍යාග සහ සෙසු ත්‍යාග

2023 වර්ෂයේ ත්‍යාග මුදල් වශයෙන් රු. බිලියන 13.4 ට ආසන්න මුදලක් සුපිරි ත්‍යාග ප්‍රථම, දෙවන, තෙවන ත්‍යාග හා සෙසු ත්‍යාග වශයෙන් පාරිභෝගික ජනතාව වෙත ලබා දීමට සමත් විය.

## අද කෝටිපති

අද කෝටිපති ලොතරැයි පත මඟින් සුපිරි ජයමලු 5ක්, රුපියල් මිලියනයේ සහ මිලියන දෙකේ ත්‍යාග 116 ක් සහ රුපියල් ලක්ෂයේ ත්‍යාග 1,566 ක් ලබා දුන් අතර රු. 2,208,616,692.2ක සමස්ත ත්‍යාග මුදලක් 2023 වර්ෂයේ පාරිභෝගිකයන් අතර බෙදා දීමට සමත් විය.

## ලග්න වාසනාව

වැඩිම ජයග්‍රාහකයින් පිරිසක් බිහි කරන ලග්න වාසනාව ලොතරැයි පත හරහා 2023 වර්ෂයේ රු. 3,887,176,243.2ක මුදලක් ත්‍යාග වශයෙන් පාරිභෝගික ජනතාව වෙත බෙදා දීමට සමත් වූ අතර එහි සුපිරි ධන යෝග 41 ක් සහ ලක්ෂ දහයේ සහ පන් ලක්ෂයේ ත්‍යාග 430ක් ඇතුළත් විය.

## සුපර් බෝල්

2023 වර්ෂයේ ලොතරැයි ලොවේ පෙරළාකාරයා වන සුපර් බෝල් ලොතරැයි පත මඟින් රු.99,940,599 ක හා රු.71,536,404 ක සුපිරි ජයමලු දෙකක්, රුපියල් මිලියනයේ සහ මිලියන දෙකේ ත්‍යාග 82 ක් සහ රුපියල් දෙලක්ෂයේ සහ ලක්ෂයේ ත්‍යාග 1,259 ක් ලබා දීමට සමත් වූ අතර සමස්ත ත්‍යාග මුදල වශයෙන් 1,631,475,323.4 ක මුදලක් පාරිභෝගිකයින් අතර බෙදා දීමට හැකි විය.

## ශනිදා

ශනිදා ලොතරැයි පත මඟින් 2023 වර්ෂයේ රු. 1,914,648,181 ක ත්‍යාග මුදලක් පාරිභෝගිකයන් වෙත ලබා දීමට හැකි වූ අතර රු. 33,800,738.10, රු. 33,898,380.90, 51,103,110 සහ 31,866,372 සුපිරි ජයමලු හතරක් ලබා

# මෙහෙයුම් සමාලෝචනය

දිමට හැකි විය. එමෙන් ම එහි රුපියල් මිලියනයේ සහ මිලියන දෙකේ ත්‍යාග 113 ක් සහ රුපියල් දෙලක්ෂයේ සහ ලක්ෂයේ ත්‍යාග 1,548 ඇතුළත්ය.

## කප්රුක

අති විශාල ජයමල්ලක් සහ තවත් කෝටිපති සහ මිලියනපති ජයමලු සහිත කප්රුක ලොතරැයිපත හරහා 2023 වර්ෂයේ කෝටිපති ජයමලු හයක් හා ලක්ෂ 20 හේ ජයමලු 145ක් ඇතුලුව සමස්ත ත්‍යාග මුදල රු. 2,589,493,820 ක මුදලක්
පාරිභෝගිකයන් වෙත තිළිණ කිරීමට සමත් විය. සමස්ත ත්‍යාග මුදල තුළ ජයමලු කිහිපයට අමතරව රුපියල් මිලියනයේ ත්‍යාග 85 ක් සහ රුපියල් දෙලක්ෂයේ සහ ලක්ෂයේ ත්‍යාග 1,953 ක් ඇතුළත්ය.

## ජයෝදා

ජයෝදා ලොතරැයි පත මඟින් 2023 වර්ෂයේ රු.46,572,527.20 එක් සුපිරි ජයමල්ලක් සමඟ සමස්ත ත්‍යාග මුදල ලෙස රු. 333,615,467.2 ක මුදලක් ලබා දුන් අතර, රුපියල් මිලියනයේ සහ මිලියන දෙකේ ත්‍යාග 20 ක්, රුපියල් ලක්ෂයේ සහ පනස් දහසේ ත්‍යාග 132ක් ලබා දීමට හැකි විය.

## සංවර්ධන වාසනාව

2023 වර්ෂයේ සංවර්ධන වාසනාව ලොතරැයිපත මඟින් රු. 22,623,096.00 ක සුපිරි ජයමල්ලක්, පන් ලක්ෂයේ සහ ලක්ෂ 10 ත්‍යාග 9ක් සහ ලක්ෂයේ ත්‍යාග 111 ක් පාරිභෝගික ජනතාව වෙත තිළිණ කළ අතර 2023 වර්ෂයේ ලබා දුන් සමස්ත ත්‍යාග මුදල රු.252,996,936.00 කි.

## සසිරි

සසිරි ලොතරැයි පත මඟින් 2023 වර්ෂයේ සමස්ත ත්‍යාග මුදල ලෙස රු. 423,444,840 ක මුදලක් ලබා දුන් අතර රුපියල් දෙලක්ෂයේ සහ ලක්ෂයේ ත්‍යාග 1,634 ක් ලබා දීමට හැකි විය.

## සුපිරි ධන සම්පත

2023 වර්ෂයේ අග භාගයේදී වෙළඳපළට හඳුන්වා දුන් සුපිරි ධන සම්පත ලොතරැයිපත මඟින් දින 53 ක් තුළ ලක්ෂ විසි පහේ ත්‍යාග 14 ක් සහ රුපියල් දෙලක්ෂයේ ත්‍යාග 272 ක් පාරිභෝගික ජනතාව වෙත තිළිණ කළ අතර 2023 වර්ෂයේ ලබා දුන් සමස්ත ත්‍යාග මුදල රු. 303,161,080.00 කි.

## 03. 2023 වර්ෂය සදහා නව බෙදාහැරීමේ නියෝජිතයින් සහ අලෙවි නියෝජිතයින් පත් කිරීම.

| දිස්ත්‍රික්ක අංකය | දිස්ත්‍රික්කය | බෙදාහැරීමේ නියෝජිතයින් | අලෙවි නියෝජිතයින් |
|---|---|---|---|
| 01 | කොළඹ | | 14 |
| 02 | කළුතර | 01 | 05 |
| 03 | මහනුවර | 01 | 09 |
| 04 | මාතලේ | | 05 |
| 05 | නුවරඑළිය | | 04 |
| 06 | ගාල්ල | | 06 |
| 07 | මාතර | | 02 |
| 08 | හම්බන්තොට | | 04 |
| 09 | යාපනය | | 11 |
| 10 | මන්නාරම | | 01 |
| 11 | වව්නියාව | | - |
| 12 | මඩකලපුව | | 02 |
| 13 | අම්පාර | | - |
| 14 | ත්‍රිකුණාමලය | | 02 |
| 15 | කුරුණෑගල | | 09 |
| 16 | පුත්තලම | 01 | 02 |
| 17 | අනුරාධපුර | | 05 |
| 18 | පොලොන්නරුව | | 03 |
| 19 | බදුල්ල | | 04 |
| 20 | මොණරාගල | | 01 |
| 21 | රත්නපුර | | 06 |
| 22 | කෑගල්ල | | 06 |
| 23 | ගම්පහ | 03 | 20 |
| 24 | කිලිනොච්චි | | 01 |
| 25 | මුලතිව් | | 01 |
| | | 06 | 123 |

## 04. දිස්ත්‍රික් බෙදාහැරීමේ අලෙවි නියෝජිත සහ අලෙවි නියෝජිත රැස්වීම්

- දිවයිනේ සියලු දිස්ත්‍රික්කයන් වල ලොතරැයිපත් බෙදාහැරීමේ කටයුතුවල නිරත නියෝජිතයින් වෙත සිය අලෙවිය වර්ධනය කර ගැනීම සඳහා නව ක්‍රමෝපායන් සහ "සුපිරි ධන සම්පත" නව ලොතරැයිපත වෙළඳපොළට නිකුත් කිරීමට සමගාමීව බෙදාහැරීමේ අලෙවි නියෝජිතයින් වෙත සංකේතාත්මකව නව ලොතරැයිපත ප්‍රධානය කිරීමත්, බෙදාහැරීමේ අලෙවි නියෝජිතයින් වෙත සමරු තිළිණ ප්‍රදානය කිරීම සඳහා 2023 ඔක්තෝම්බර් මස 29 වන දින "වෝටස් ඒජ්" හෝටල් පරිශ්‍රයේදී දිස්ත්‍රික් බෙදාහැරීමේ අලෙවි නියෝජිත හමුවක් පවත්වන ලදී.

- දිවයින පුරා විසිරී පැතිරී සිටින අලෙවි ජාලය දිරිමත් කිරීමේ අරමුණ පෙර දැරිව 2023 වසර තුළ සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් "සංවර්ධන අභිමන්" නමින් පහත සඳහන් දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් අලෙවි නියෝජිතයන් සඳහා නව මුහුණුවරකින් රැස්වීම් මාලාවක් දියත් කෙරුණි.

| දිනය | දිස්ත්‍රික්කය | ස්ථානය |
|---|---|---|
| 2023 මැයි 21 | කොළඹ | කොළඹ |
| 2023 මැයි 28 | ගම්පහ | ගම්පහ |
| 2023 ජුනි 04 | කළුතර | කළුතර |
| 2023 ජුනි 11 | හම්බන්තොට | හම්බන්තොට |

මෙම අලෙවි නියෝජිත හමුවීම් තුළ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් අලෙවි නියෝජිතයින්ගේ සේවය ඇගයීමට වැඩසටහනක් සංවිධානය කරන ලදී. ඒ අනුව, මුදල් ත්‍යාග හා සම්මාන පහත පරිදි පිරිනමන ලදී.

- අදාළ දිස්ත්‍රික්ක තුළ ඉහළම අලෙවියක් වාර්තාකළ අලෙවි නියෝජිතයින් අතරින් පළමු, දෙවන සහ තෙවන ස්ථාන හිමි කරගත් අලෙවි නියෝජිතයින්
- අදාළ මැතිවරණ කොට්ඨාස තුළ වැඩිම අලෙවියක් වාර්තාකළ අලෙවි නියෝජිතයින්

## 05. දිස්ත්‍රික් බෙදාහැරීමේ අලෙවි නියෝජිත, අලෙවි නියෝජිතයන් සහ අලෙවි සහයකයින් සදහා වූ විශේෂ වැඩසටහන්

- ලොතරැයි පතක මිල රු 40 වීමත් සමඟම සියලුම දිනුම් ඇදීමේ ලොතරැයිපත් වර්ග සදහා අලෙවි නියෝජිතයින් වෙත රු. 8.00 ක කොමිස් මුදලක් (රු.7.50 ක කොමිස් මුදලට අමතරව තවත් ශත 50ක දිරි දීමනාවක්) ලබා දෙන ලදී. තවද අලෙවි ඉලක්ක ලගා කර ගන්නා බෙදාහැරීමේ අලෙවි නියෝජිතයින් සඳහා ශත 5 ක අමතර දිරි දීමනාවක් (ඔවුන් ලබන ශත 50 කොමිස් මුදලට අමතරව)  ලබා දෙන ලදී.
- සුපිරි ධන සම්පත ලොතරැයි පත සඳහා සියලුම දිනුම් ඇදීමේ ලොතරැයිපත් වලට දැනට ලබා දෙනු ලබන ශත 50 දිරි දීමනාවට අමතරව ශත 25 ක දීමනාවක් අලෙවි නියෝජිතයින් වෙත ලබා දෙන ලදී. එනම් සුපිරි ධන සම්පත ලොතරැයිපතක් සදහා ශත 75 ක දිරි දීමනාවක් අලෙවි නියෝජිතයින් වෙත ලබා දෙන ලදී. තවද අලෙවි ඉලක්ක ළඟා කර ගැනීම මත බෙදාහැරීමේ අලෙවි නියෝජිතයින් සඳහා ලොතරැයිපතකට ලබා දෙන ශත 50 කොමිස් මුදලට අමතර ශත 15 ක් දිරි දීමනාවක් ලබා දෙන ලදී.
- 2023 ජූලි මාසයේ මිල වැඩි කිරීමත් සමඟ අලෙවිය 60% ක මට්ටමක පවත්වා ගැනිම සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලොතරැයිපත් වැඩි වැඩියෙන් ප්‍රදර්ශනය කර ඇති ආකර්ශනීය අලෙවි කුටි/ජංගම රථ 5ක් සඳහා රු.5,000 ක දෛනික මුදල් ත්‍යාගයක් ලබා දෙන ලදී. මෙම වැඩසටහන  2023 ජූලි 18 වන දින සිට 2023 අගෝස්තු 31 දක්වා ක්‍රියාත්මක කරනු ලැබූ අතර එම අලෙවි කුටි දිනපතා "DLB Lottery Show" වැඩසටහන තුලින් ප්‍රදර්ශනය කරන ලදි.
- සුපිරි ධන සම්පත ලොතරැයි පත වෙළඳපලේ ප්‍රචලිත කරීමේ අරමුණින් සුපිරි ධන සම්පත සහ අනෙකුත් සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලොතරැයි පත් වැඩි වශයෙන් ප්‍රදර්ශනය කර ඇති දිනකට අලෙවි කුටි 10ක් තෝරා එම තෝරා ගනු ලැබූ අලෙවි කුටි සඳහා සුපිරි ධන සම්පත ලොතරැයි පත් 30ක් මිළදී ගැනීමට වවුචර් පත් ලබා දීමේ වැඩසටහනක් 2023 නොවැම්බර් 20 දින සිට 2023 දෙසැම්බර් 31 දක්වා ක්‍රියාත්මක කරන ලදී.
- 2023 වසරේ දෙසැම්බර් මාසයේ ගාල්ල, මාතර, මහනුවර සහ මොණරාගල දිස්ත්‍රික්කවල  ගංවතුර නිසා පීඩාවට පත් වූ අලෙවි නියෝජිතයින් සහ අලෙවි සහායකයින් 230 දෙනෙකු සඳහා එක් අයෙකුට රු.5,000 බැගින් රු.1,150,000 ක මූල්‍යාධාර මුදලක් ලබා දීමට ප්‍රතිපාදන වෙන් කර ඇත.
- 2023 වර්ෂයේ DLB සන්නාම ඇතුළත් නව අලෙවි කුටි 527ක ප්‍රමාණයක් නිර්මාණය කරන ලද අතර ඒ සඳහා 2023 වර්ෂයේදී රු.65,610,000 ක මුදලක් වැය කර ඇත.
- 2023 වර්ෂයේ අලෙවි කුටි 203ක ප්‍රමාණයක් ස්ටිකර් කරන ලද අතර ඒ සඳහා 2023 වර්ෂයේදී රු.11,655,052 ක මුදලක් වැය කර ඇත.
- සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් දිවයින පුරා අලෙවි නියෝජිතයින්හට "Lottery Shops" තනා ගැනීම සදහා අනුග්‍රාහකත්වය ලබාදීමේ වැඩසටහනක් 2018 වර්ෂයේදී ආරම්භ කරන ලදී. මෙලෙස දිවයින පුරා "Lottery Shops" 25ක් නිර්මාණය කිරීමට 2023 වර්ෂය දී හැකි විය.
- ලංකාව පුරා විසිරී ඇති සිල්ලර කඩ සඳහා ලොතරැයි පත් අලෙවියට යොමු කිරීමේ ව්‍යාපෘතියක් 'selling through retail shop project' 2022 වර්ෂයේදී ආරම්භ කරන ලදී. මෙලෙස 2023 වර්ෂයේ දිවයින පුරා සිල්ලර කඩ 882 සඳහා ලොතරැයි පත් හඳුන්වා දීම සිදු කරන ලදී.
- විවිධ රෝගාබාධ වලට ලක් වූ අලෙවි නියෝජිතයින් හා සහායකයින් වෙනුවෙන් සහ මරණයට පත්වන සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අලෙවි නියෝජිතයින් සහ විකුණුම් සහායකයින් වෙනුවෙන් 2023 වර්ෂයේ රු.6,735,594 ලබා දී ඇත.
- විශ්ව විද්‍යාල වරම් ලබා සිටින සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අලෙවි නියෝජිතයින්ගේ දූ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සාර්ථක කර ගැනීම සඳහා 2023 වර්ෂයේ රු.838,500 ක මුදලක් ලබා දීමට වෙන් කර ඇත.
- පහ වසර ශිෂ්‍යත්ව විභාගය, අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගය සහ අ.පො.ස උසස් පෙළ විභාගය ඉහළින් සමත් අලෙවි නියෝජිතයින් සහ අලෙවි සහායකයින්ගේ දූ දරුවන් සඳහා 2023 වර්ෂයේ රු.300,000 ක මුදලක් ලබා දීමට වෙන් කර ඇත.
- 2023 වර්ෂයේ සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ දිවයින පුරා විසිරී සිටින අලෙවි නියෝජිත මහත්ම මහත්මීන් ඔවුන්ගේ අලෙවි කටයුතු තවදුරටත් වර්ධනය කර ගැනීම සඳහා උද්‍යාන කුඩ 88ක් ලබා දෙන ලදී.
- සෑම දිස්ත්‍රික්කයකම වැඩිම අලෙවියක් සිදු කරනු ලබන දිස්ත්‍රික්ක අලෙවි නියෝජිතයන් දිරිමත් කිරීමේ අරමුණ පෙර දැරි කොට ගෙන දිස්ත්‍රික්ක තුළ කුඩා රැස්වීම් මාලාවක් වසර පුරා වරින් වර පැවැත්වූ අතර, අලෙවි සහායක මහත්ම මහත්මීන්ගේ අදහස් විමසමින් ලොතරැයි කුටි අධීක්ෂණයක් මෙන්ම ඔවුන් ව අගය කරමින් ත්‍යාග පිරි නැමීමක් ද එහි දී සිදු කරන්නට විය.



# මෙහෙයුම් සමාලෝචනය

## 06. සමාජ සත්කාරක වැඩසටහන්

- වෙළඳ වානිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය විසින් දෙසැම්බර් 13 සිට 17 දක්වා ජා-ඇල නගර සභා ක්‍රීඩාංගනයේදී පවත්වනු ලැබූ මහපොළ උසස් අධ්‍යාපන වෙළඳ ප්‍රදර්ශනය සඳහා රු. 1,000,000 ක අනුග්‍රාහක මුදලක් ලබා දීමට සංවර්ධන ලොතරැයි මණ්ඩලය කටයුතු කරන ලදී.

- 75 වන නිදහස් සැමරුම වෙනුවෙන් පෙබරවාරි 11 වන දින යාපනය මුතුවෙල් ක්‍රීඩාංගණයේදී පවත්වන ලද විවිධ ප්‍රසංගය සඳහා . 1,000,000 ක අනුග්‍රාහක මුදලක් ලබා දීමට සංවර්ධන ලොතරැයි මණ්ඩලය කටයුතු කරන ලදී.

- 2023 වර්ෂයේ මහනුවර ශ්‍රී දළදා පෙරහැර වෙනුවෙන් රු. 2,000,000 ක අනුග්‍රාහක මුදලක් ලබා දීමට සංවර්ධන ලොතරැයි මණ්ඩලය කටයුතු කරන ලදී.

- 2023 වර්ෂයේ රුහුණු කතරගම මහා දේවාලයේ ඇසළ පෙරහැර වෙනුවෙන් රු. 1,000,000 ක අනුග්‍රාහක මුදලක් ලබා දීමට සංවර්ධන ලොතරැයි මණ්ඩලය කටයුතු කරන ලදී.

- 2023 වර්ෂයේ බෙල්ලන්විල රජ මහා විහාරස්ථානයේ 73 වැනි වාර්ෂික ඇසළ පෙරහැර වෙනුවෙන් රු. 1,000,000 ක අනුග්‍රාහක මුදලක් ලබා දීමට සංවර්ධන ලොතරැයි මණ්ඩලය කටයුතු කරන ලදී.

- 2023 වර්ෂයේ ගැටබරු රජ මහා විහාරස්ථායේ වාර්ෂික ඇසළ පෙරහැර සඳහා රු. 1,000,000 ක අනුග්‍රාහක මුදලක් ලබා දීමට සංවර්ධන ලොතරැයි මණ්ඩලය කටයුතු කරන ලදී.

- 2023 වර්ෂයේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ඓතිහාසික රජ මහා විහාරස්ථානයේ වාර්ෂික ශ්‍රී දළදා මහා පෙරහැර වෙනුවෙන් රු. 500,000 ක අනුග්‍රාහක මුදලක් ලබා දීමට සංවර්ධන ලොතරැයි මණ්ඩලය කටයුතු කරන ලදී.

- 2023 වර්ෂයේ කැලණිය රජ මහා විහාරස්ථානයේ දුරුතු පෙරහැර සඳහා රු. 500,000 ක අනුග්‍රාහක මුදලක් ලබා දීමට සංවර්ධන ලොතරැයි මණ්ඩලය කටයුතු කරන ලදී.

- සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සියලුම සාමාජිකයින්ගේ දායකත්වයෙන් හා සේවක සුභ සාධක සංගමය එක්ව, පරිත්‍යාග යේ අපේක්ෂාව අවැසි මහරගම අපේක්ෂා රෝහල වෙත උදෑසන තැඹිලි සහ පලතුරු ලබාදීමේ මහඟු පුණ්‍යකර්මය 2023 අගෝස්තු මහ 24 වන දින රෝහල් පරිශ්‍රය තුළ දී සිදු කරන ලදී.

## 07. විශේෂ වැඩසටහන්

- සංවර්ධන ලොතරැයි මණ්ඩලය තුළින් බිහි වූ ජයග්‍රාහකයන් සඳහා මුදල් ත්‍යාග ලබා දීම මෙන්ම එම ලොතරැයිපත් අලෙවි කළ අලෙවි නියෝජිතවරුන් සඳහා මුදල් ත්‍යාග ලබා දීම හා සහතික පත් ලබා දීම මහජනතාව නිතර ගැවසෙන අලෙවි කුටි ඉදිරිපිට සිදු කිරීමේ වැඩපිළිවෙළක් 2022 වසරේ මුල සිට ක්‍රියාත්මක විය. එම වැඩසටහන 2023 වසරේද ක්‍රියාත්මක වු අතර එම ත්‍යාග ලබා දීමට අදාළ ඡායාරූප සං.ලො.ම මුහුණු පොතෙහි 'facebook page' පළ කිරීම මඟින් අඛණ්ඩව මහජනතාව දැනුවත් කිරීම සිදු කරන ලදී.



- තවද, ශ්‍රී ලංකාවේ පළමු ඩිජිටල් දිනුම් ඇදීමේ අත්දැකීම සලකුණුකළ සුපිරි ධන සම්පත් සඳහා නව දිනුම් ඇදීමේ සජීවීකරණය දියත් කිරීම අන්තර් ක්‍රියාකාරී ලොතරැයි පරිසරයක් නිර්මාණය කර අතර, ජනාධිපති අරමුදලට දායකත්වයන් තුළින් සමාජීය සුභසාධනයට දයක වේ. මෙම වැඩසටහන් මගින් තාක්ෂණික අභිවෘද්ධියට සහ පාරිභෝගික කේන්ද්‍රීය නව්‍යකරණය සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ කැපවීම පෙන්නුම් කරයි.

- සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලොතරැයිපත් විශාල ප්‍රමාණයක් මිළදී ගන්නා පාරිභෝගිකයන් හට ඔවුන්ට අවශ්‍ය ලොතරැයිපත් ඔවුන් සිටින ස්ථානයටම ගෙන ගොස් භාර දීම සඳහා දුරකථන මාර්ග ඔස්සේ ඇණවුම් ලබා ගන්නා වැඩ පිළිවෙලක් දියත් කරන ලද අතර ඒ අනුව දිනකට ලොතරැයිපත් දහසක් (1000) පමණ අලෙවි කිරීමට හැකියාව ලැබී ඇත.

- සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ වසර විස්සක සේවා කාලයක් සම්පූර්ණ කළ සේවක මහත්ම මහත්මීන්ට සහ 2023 වර්ෂයේ සේවයෙන් විශ්‍රාම ගත් කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙනුවෙන් උපහාර පිදීම 2023.07.11 වන දින සිදු කරන ලදි. වසර තුල නිම කල තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති පිළිබද ලැයිස්තුව.

## 2023 වසර තුළ නිමකළ තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති පිළිබඳ ලැයිස්තුව

2023 දී, තොරතුරු තාක්ෂණ අංශය විසින් සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ තාක්ෂණික යටිතල පහසුකම් ඉහළ නැංවීම අරමුණු කරමින් විවිධ මූලික ව්‍යාපෘති නිමකරමින් සැලකියයුතු සන්ධිස්ථාන සාක්ෂාත් කර ගන්නා ලදි. මෙවැනි ව්‍යාපෘතිවලට ස්වයංක්‍රිය උපස්ථ මෘදුකාංගය ක්‍රියාත්මක කිරීම ඇතුළත් වන අතර එය සංවර්ධන ලොතරැයි මණ්ඩලය සහ ශ්‍රී ලංකා ටෙලිකොම් දත්ත මධ්‍යස්ථාන පරිශ්‍ර දෙකෙහි සමමුහුර්ත කළ උපස්ථ සහතික කරමින් සෑම මිනිත්තු 15කට වරක් සිදුවන දත්ත උපස්ථ ක්‍රියාවලිය පරිනාමයකට ලක් කරන ලදි. ඊට අමතරව, දත්ත මධ්‍යස්ථානයේ යථාතථ්‍ය වායුසමීකරණ පද්ධතියක් හඳුන්වාදීම මගින් සර්වර්ය වසා දැමීමේ අවදානම අඩුකරමින් සිසිල්කරන සහ තෙතමනය ප්‍රභස්ථ කරන ලදි. තවද, කිලෝවොට් 20 ඒකක සමඟ ඔජී පද්දතිය පුළුල් කිරීම විදුලිබලය ඇණහිටින කාලසීමට තුළ බාධාරහිත තීරණාත්මක මෙහෙයුම් සහතික කරමින් බලශක්ති උපස්ථ හැකියාව ශක්තිමත් කරන ලදි.

තවද ශ්‍රී ලංකාවේ පළමු ඩිජිටල් දිනුම් ඇදීමේ අත්දැකීම සලකුණුකල සුපිරි ධන සම්පත් සඳහා නව දිනුම් ඇදීමේ සජීවීකරණය දියත් කිරීම අන්තර ක්‍රියාකාරී ලොතරැයි පරිසරයක් නිර්මාණය කර අතර, ජනාධිපති අරමුදලට දයකත්වයන් තුළින් සමාජීය සුභසාධනයට දායක වේ. මෙම වැඩසටහන් මගින් තාක්ෂණික අභිවෘද්ධියට සහ පාරිභෝගික කේන්ද්‍රීය නව්‍යකරණය සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ කැපවීම පෙන්නුම් කරයි.

# නිෂ්පාදන කළඹ පිළිබඳ දළ විශ්ලේෂණය

සංවර්ධන ලොතරැයි මණ්ඩලය ජනාධිපති අරමුදල හරහා අධ්‍යාපනය සහ ප්‍රජා ව්‍යාපාර සඳහා අරමුදල් සපයා දෙයි. සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි නිෂ්පාදන වර්ග දෙකක් තිබේ. මුද්‍රිත ලොතරැයි සහ ඩිජිටල් ලොතරැයි එම වර්ග දෙක වේ. ඩිජිටල් ලොතරැයිය "DLB Sweep" ජංගම යෙදවුම හරහා අලෙවි කරනු ලැබේ.

- **දිනුම් ඇදීමේ ලොතරැයි** - ලොතරැයිපතේ ඇති අංක ලොතරැයිය විසින් දිනුම් අදිනු ලබන අංක සමග ගැලපීම මගින් මෙම ක්‍රීඩාව සිදුකරනු ලැබේ.
- **සූරන ලොතරැයි** - පූර්වයෙන් තීරණය කරන ලද ත්‍යාග තිබේද යන්න හෙලිකර ගැනීම සඳහා කඩදාසි ලොතරැයිපතෙහි ඇති ක්ෂීර ස්ථරය සූරා ඉවත් කිරීම මගින් දිනුම අදිනු ලැබේ.

දිනපතා

දිනපතා

දිනපතා

දිනපතා

දිනපතා

දිනපතා

සඳුදා / බදාදා

අඟහරුවාදා, සිකුරාදා, ඉරිදා

මාස දෙකකට වරක්

නිදහස් දිනයට

ක්ෂණික

# නිෂ්පාදන කළඹ පිළිබඳ දළ විශ්ලේෂණය

## 1. අද කෝටිපති



### සන්නාම දැක්ම

වෙළෙඳපොල ප්‍රමුඛයා සහ ශ්‍රී ලංකාවේ ජනප්‍රිය ලොතරැයිය බවට පත්වීම.

### සන්නාම මෙහෙවර

අති නවීනතම තාක්ෂණය යොදා ගනිමින් නව්‍ය ත්‍යාග ව්‍යුහයන් හඳුන්වාදීම සහ ඒ මගින් මණ්ඩලයේ ලාභදායී බව වැඩි දියුණු කිරීම.

### ලොතරැයි විස්තර

දිනුම් ඇදීමේ දින : සඳුදා සිට ඉරිදා දක්වා (සතියේ දින 7)
ලොතරැයි වර්ණ : රතු, තද නිල්, රෝස, ලා නිල්, දම්, කහ සහ කොළ,
ආරම්භක ජයමල්ල : රු 50,000,000/-

### ත්‍යාග ව්‍යුහය

| සංයෝජනය | ත්‍යාගය (රු.) |
|---|---|
| ඕනෑම අංක 1ක් | රු. 40.00 |
| ඕනෑම ඉංග්‍රීසි අකුරක් | රු. 40.00 |
| ඕනෑම අංක 2ක් | රු. 200.00 |
| ඕනෑම අංක 3ක් | රු. 4,000.00 |
| අංක 4 | රු. 2,000,000.00 |
| ඉංග්‍රීසි අකුර සමඟ ඕනෑම අංක 1ක් | රු. 200.00 |
| ඉංග්‍රීසි අකුර සමඟ ඕනෑම අංක 2ක් | රු. 2,000.00 |
| ඉංග්‍රීසි අකුර සමඟ ඕනෑම අංක 3ක් | රු. 200,000.00 |
| ඉංග්‍රීසි අකුර සමඟ අංක4 | රු. 50,000,000.00 |

## 2. ශනිදා



### සන්නාම දැක්ම

සඳුදා සිට ඉරිදා දක්වා සතියේ සෑම දින 7 ලොතරැයි වෙළෙඳපොලේ ප්‍රමුඛතම සන්නාමය බවට පත්වීම.

### සන්නාම මෙහෙවර

ශ්‍රී ලංකාවේ සතියේ දින හතෙහිම ප්‍රමුඛතම සන්නාමය ලෙස, අති නවීනතම තාක්ෂණය තුළින් නව්‍ය ත්‍යාග ව්‍යුහයන් හඳුන්වා දීම සහ එමගින් මණ්ඩලයේ ලාභදායී බව වැඩිදියුණු කිරීමට අපි අපේක්ෂා කරමු.

### ලොතරැයි විස්තර

දිනුම් ඇදීමේ දින : සඳුදා සිට ඉරිදා දක්වා (සතියේ දින 7)

ලොතරැයි වර්ණ : ලා කොළ, ලා නිල්, දම්, රතු, තැඹිලි, කොළ සහ රෝස

ආරම්භක ජයමල්ල : රු. 50,000,000

### ත්‍යාග ව්‍යුහය

| සංයෝජනය | ත්‍යාගය (රු.) |
|---|---|
| ඕනෑම ඉංග්‍රීසි අකුරක් | රු. 40.00 |
| ඕනෑම අංක 1ක් | රු. 40.00 |
| ඕනෑම අංක 2ක් | රු. 200.00 |
| ඕනෑම අංක 3නක් | රු. 4,000.00 |
| අංක 4 | රු. 2,000,000.00 |
| ඉංග්‍රීසි අකුර සමඟ ඕනෑම අංක 1ක් | රු. 200.00 |
| ඉංග්‍රීසි අකුර සමඟ ඕනෑම අංක 2ක් | රු. 2,000.00 |
| ඉංග්‍රීසි අකුර සමඟ ඕනෑම අංක 3ක් | රු. 200,000.00 |
| ඉංග්‍රීසි අකුර සමඟ අංක 4 | රු. 50,000,000.00 |

## 3. කප්රුක



### සන්නාම දැක්ම

ජැක්පොට් ත්‍යාගය දිනා ගැනීමේ අභිලාෂයෙන් පසුවන ජනතාවගේ සිහින සහ අපේක්ෂාවන් ඉටු කර දෙන ලොතරැයිය සන්නාමය බවට පත්වීම.

### සන්නාම මෙහෙවර

ජැක්පොට් ත්‍යාගය දිනා ගැනීමේ අභිලාෂයෙන් පසුවන ජනතාව අතර ප්‍රියකරන ලොතරැයි සන්නාමය බවට පත් වීම.

### ලොතරැයි විස්තර

දිනුම් ඇදීමේ දින : සඳුදා සිට ඉරිදා දක්වා : සතියේ දින 7*
ලොතරැයි වර්ණ : කොළ, රෝස, ලා නිල්, තැඹිලි, ලා දුඹුරු, රතු සහ කහ
ආරම්භක ජයමල්ල : රු.150,000,000.00

### ත්‍යාග ව්‍යුහය

| සංයෝජනය | ත්‍යාගය (රු.) |
|---|---|
| ඕනෑම අංක 1ක් | රු. 40.00 |
| සුපිරි අංකය | රු. 40.00 |
| ඉංග්‍රීසි අකුර | රු. 40.00 |
| ඉංග්‍රීසි අකුර සමඟ ඕනෑම අංක 1ක් | රු. 200.00 |
| ඕනැම අංක 2ක් | රු. 200.00 |
| ඉංග්‍රීසි අකුර සමඟ ඕනෑම අංක 2ක් | රු. 2,000.00 |
| ඕනැම අංක 3ක් | රු. 4,000.00 |
| ඉංග්‍රීසි අකුර සමඟ ඕනෑම අංක 3ක් | රු. 200,000.00 |
| අංක 4 | රු. 2,000,000.00 |
| අංක 4 සමඟ සුපිරි අංකය | රු. 10,000,000.00 |
| අංක 4 සමඟ ඉංග්‍රීසි අකුර | රු. 10,000,000.00 |
| අංක 4 සමඟ ඉංග්‍රීසි අකුර සහ සුපිරි අංකය | රු. 150,000,000.00 |

## 4. ලග්න වාසනාව



### සන්නාම දැක්ම

ලග්න සංකේතයෙන් වාසනාව උදා වන්නේ යැයි විශ්වාස කරන ජනතාවගේ අපේක්ෂාවන් ඉටු කරන ප්‍රමුඛතම ලොතරැයිය බවට පත්වීම.

### සන්නාම මෙහෙවර

ලග්න සංකේතයෙන් වාසනාව සහ සෞභාග්‍ය උදා වන්නේ යැයි විශ්වාස කරන ජනතාව සඳහා ප්‍රියතම සන්නාමය බවට පත්වීම

### ලොතරැයි විස්තර

දිනුම් ඇදීමේ දින : සඳුදා සිට ඉරිදා දක්වා : සතියේ දින 7*
ලොතරැයි වර්ණ : කහ, රතු, කොළ, දුඹුරු, තද නිල්, ලා නිල් සහ දම්
ආරම්භක ජයමල්ල : රු. 3,000,000

### ත්‍යාග ව්‍යුහය

| සංයෝජනය | ත්‍යාගය (රු.) |
|---|---|
| ඕනෑම අංක 1ක් | රු. 40.00 |
| ඕනෑම ලග්න සංකේතයක් | රු. 40.00 |
| ඕනෑම අංක 2ක් | රු. 200.00 |
| ඕනෑම අංක 3ක් | රු. 2,000.00 |
| අංක 4 | රු. 1,000,000.00 |
| ලග්න සංකේතය සමඟ ඕනෑම අංක 1ක් | රු. 120.00 |
| ලග්න සංකේතය සමඟ ඕනෑම අංක 2ක් | රු. 400.00 |
| ලග්න සංකේතය සමඟ ඕනෑම අංක 3ක් | රු. 20,000.00 |
| ලග්න සංකේතය සමඟ අංක 4 | රු. 3,000,000.00 |

# නිෂ්පාදන කළඹ පිළිබඳ දළ විශ්ලේෂණය

## 5. සුපර් බෝල්




### සන්නාම දැක්ම

ශ්‍රී ලංකාවේ ලොතරැයි වෙළඳපොළ ප්‍රමුඛයා සහ ජනප්‍රිය ලොතරැයියක් බවට පත්වීම.

### සන්නාම මෙහෙවර

අති නවීනතම තාක්ෂණය යොදා ගනිමින් නව්‍ය ත්‍යාග ව්‍යුහයන් හඳුන්වා දීම සහ එමගින් මණ්ඩලයේ ලාභදායී බව වැඩිදියුණු කිරීම.

### ලොතරැයි විස්තර

දිනුම් ඇදීමේ දින : සඳුදා සිට ඉරිදා දක්වා : සතියේ දින 7*
ලොතරැයි වර්ණ : දම්, ලා නිල්, රතු, කොළ, රෝස, නිල් සහ තැඹිලි
ආරම්භක ජයමල්ල : රු. 50,000,000/-

### ත්‍යාග ව්‍යුහය

| සංයෝජනය | ත්‍යාගය (රු.) |
|---|---|
| ඕනෑම ඉංග්‍රිසි අකුරක් | රු. 40.00 |
| ඕනෑම අංක 1ක් | රු. 40.00 |
| ඕනෑම අංක 2ක් | රු. 200.00 |
| ඕනැම අංක 3ක් | රු. 4,000.00 |
| අංක හතර | රු. 2,000,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක 1ක් | රු. 200.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක 2ක් | රු. 2,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක 3ක් | රු. 200,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග අංක 4 | රු. 50,000,000.00 |

## 6. සුපිරි ධන සම්පත



### සන්නාම දැක්ම

අංක රටා ගැලපීම තුළින් තම වාසනාව විශ්වාස කරන පුද්ගලයින් ගේ අපේක්ෂාවන් ඉටුකරන ප්‍රමුඛතම ලොතරැයිය බවට පත්වීම.

### සන්නාම මෙහෙවර

ප්‍රියතම අංක සංයෝග උත්සාහ කරන පාරිභෝගිකයින් සඳහා වඩාත් ප්‍රියකරන ලොතරැයිය බවට පත්වීම.

### ලොතරැයි විස්තර

දිනුම් ඇදීමේ දින : සඳුදා සිට ඉරිදා දක්වා : සතියේ දින 7*
ලොතරැයි වර්ණ : දම්, රතු, කොළ, කහ, රෝස, නිල් සහ දුඹුරු
ආරම්භක ජයමල්ල : රු. 20,000,000/-

### ත්‍යාග ව්‍යුහය

| සංයෝජනය | ත්‍යාගය (රු.) |
|---|---|
| අවසන් අංක 6 සමඟ ඉංග්‍රිසි අකුර | රු. 20,000,000.00 |
| අනුපිළිවෙලට සියලුම අංක 6 | රු. 1,000.00 |
| අවසන් අංක 6 | රු. 2,500,000.00 |
| අවසන් අංක 5 | රු. 200,000.00 |
| අවසන් අංක 4 | රු. 20,000.00 |
| අවසන් අංක 3 | රු. 2,000.00 |
| අවසන් අංක 2 | රු. 200.00 |
| අවසන් අංකය | රු. 40 |
| පළමු අංක 5 | රු. 100,000.00 |
| පළමු අංක 4 | රු. 2,000.00 |
| පළමු අංක 3 | රු. 400.00 |
| පළමු අංක 2 | රු. 120.00 |
| පළමු අංකය | රු. 40.00 |
| ඉංග්‍රිසි අකුර | රු. 40.00 |
| ප්‍රසාද ඉංග්‍රිසි අකුර (දෙවන අකුර) | රු. 40.00 |

## 7. ජයෝදා




### සන්නාම දැක්ම

සංවර්ධන ලොතරැයි මණ්ඩලයට ආදායම් සහ ලාභ උත්පාදනය කර දෙමින්, සුවිශේෂී සහ විශ්වාසනීය යෝජනා ක්‍රමයක් පිරිනමමින් සඳුදා සහ බදාදා දිනවල ජනප්‍රියතම ලොතරැයි නිෂ්පාදනය බවට පත්වීම.

### සන්නාම මෙහෙවර

මණ්ඩලයේ ලාභදායීත්වය වැඩිදියුණු කරමින්, නවීනතම තාක්ෂණය හරහා නව්‍ය ත්‍යාග ව්‍යුහයන් හඳුන්වාදෙමින්, සඳුදා සහ බදාදා දිනවල ජනප්‍රියතම ලොතරැයි නිෂ්පාදනය බවට පත්වීම.

### ලොතරැයි විස්තර

දිනුම් ඇදීමේ දින : සඳුදා සහ බදාදා දක්වා

ලොතරැයි වර්ණ: තැඹිලි සහ කහ

ආරම්භක ජයමල්ල : රු. 20,000,000

### ත්‍යාග ව්‍යුහය

| සංයෝජනය | ත්‍යාගය (රු.) |
|---|---|
| ඕනෑම ඉංග්‍රිසි අකුරක් | රු. 40.00 |
| ඕනෑම අංක 1ක් | රු. 40.00 |
| ඕනෑම අංක 2ක් | රු. 200.00 |
| ඕනෑම අංක 3ක් | රු. 4,000.00 |
| අංක 4 | රු. 2,000,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක 1ක් | රු. 80.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක 2ක් | රු. 2,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක 2ක් | රු. 100,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග අංක 4 | රු. 20,000,000.00 |

## 8. සසිරි




### සන්නාම දැක්ම

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ ඩිජිටල් ලොතරැයි සන්නාමයක් බවට පත්වීම.

### සන්නාම මෙහෙවර

නව්‍ය, අධි තාක්ෂණික ලොතරැයි ක්‍රමයක් හඳුන්වා දීම මගින් මෙතෙක් ප්‍රයෝජනයට නොගත් නව වෙළඳපොලක් නිර්මාණය කිරීම සහ එමගින් මණ්ඩලයේ ලාභදායීත්වය වැඩිදියුණු කිරීම.

### ලොතරැයි විස්තර

දිනුම් ඇදීමේ දින : අඟහරුවාදා, සිකුරාදා සහ ඉරිදා

ලොතරැයි වර්ණ : දම්, ලා දුඹුරු සහ කොළ

### ත්‍යාග ව්‍යුහය

| සංයෝජනය | ත්‍යාගය (රු.) |
|---|---|
| ඕනෑම අංක 1ක් | රු. 40.00 |
| ඕනෑම අංක 2ක් | රු. 400.00 |
| ඕනෑම අංක 3ක් | රු. 200,000.00 |

# නිෂ්පාදන කළඹ පිළිබඳ දළ විශ්ලේෂණය

## 9. වාලම්පුරි



### සන්නාම දැක්ම

උතුරු හා නැගෙනහිර කලාපයේ වඩාත් ජනප්‍රිය ලොතරැයි නිෂ්පාදනය බවට පත්වීම සහ එම කලාපයේ වැඩිපුර ජයග්‍රාහකයින් බිහි කිරීම.

### සන්නාම මෙහෙවර

කලාපය තුළ වඩා වැඩි ජයග්‍රාහී අවස්ථා බෙදාහැරීම මගින් අපගේ සංස්කෘතික අනන්‍යතාව භාවිතා කරමින් උතුරු හා නැගෙනහිර කලාපයේ ජනප්‍රිය ලොතරැයි නිෂ්පාදනය බවට පතකිරීම සහ මණ්ඩලයේ ලාභදායිතාව වැඩි කිරීම.

### ලොතරැයි විස්තර

දිනුම් ඇදීමේ දින : මාස දෙකකට වරක්
ලොතරැයි වර්ණ : කොළ, තැඹිලි සහ රතු

| සංයෝජනය | ත්‍යාගය (රු.) |
|---|---|
| ඕනෑම අංක 1ක් | රු. 50.00 |
| ඕනෑම ඉංග්‍රීසි අකුරක් | රු. 50.00 |
| ඕනෑම අංක 1ක් සමඟ ඉංග්‍රීසි අකුර | රු. 500.00 |
| ඕනෑම අංක 2ක් | රු. 1,500.00 |
| ඕනෑම අංක 2ක් සමඟ ඉංග්‍රීසි අකුර | රු. 10,000.00 |
| ඕනෑම අංක 3ක් | රු. 100,000.00 |
| ඕනෑම අංක 3ක් සමඟ ඉංග්‍රීසි අකුර | රු. 6,000,000.00 |

## 10. ලකී ෆ්‍රීඩම්




### ලොතරැයි විස්තර

දිනුම් ඇදීමේ දින : නිදහස් දිනය (පෙබරවාරි 10 දින)
ලොතරැයි වර්ණ : නිල්

### ත්‍යාග ව්‍යුහය

| සංයෝජනය | ත්‍යාගය (රු.) |
|---|---|
| ඕනෑම අංක 1ක් | රු. 50.00 |
| ඕනෑම ඉංග්‍රීසි අකුරක් | රු. 50.00 |
| ඕනෑම අංක 1ක් සමඟ ඉංග්‍රීසි අකුර | රු. 100.00 |
| ඕනෑම අංක 2ක් | රු. 1,000.00 |
| ඕනෑම අංක 2ක් සමඟ ඉංග්‍රීසි අකුර | රු. 10,000.00 |
| ඕනෑම අංක 3ක් | රු. 100,000.00 |
| ඕනෑම අංක 3ක් සමඟ ඉංග්‍රීසි අකුර | රු. 5,000,000.00 |

## 11. ක්ෂණික ලොතරැයිය

සංවර්ධන ක්ෂණික

### හඳුන්වාදීම

ශ්‍රී ලංකාවේ ක්ෂණික ලොතරැයි පුරෝගාමියා ලෙස 1983 වර්ෂයේ දී සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් මුල් වරට ශ්‍රී ලංකාවට ක්ෂණික ලොතරැයියක් හඳුන්වා දෙන ලදී. වෙළඳපොළට එය හඳුන්වාදෙන විට එය මෙරටට නව්‍ය සංකල්පයක් විය.

### සන්නාම දැක්ම

මාර්ගගත නොවන ක්ෂණික දිනුම් ලොතරැයි වැඩසටහන හරහා ශ්‍රී ලංකාවේ වෙළඳපොළ ප්‍රමුඛයා බවට පත්වීම.

### සන්නාම මෙහෙවර

ශ්‍රී ලංකාවේ මාර්ගගත නොවන ක්ෂණික දිනුම් ලොතරැයි වෙළඳපොළ ප්‍රමුඛයා ලෙස නව්‍ය ත්‍යාග ව්‍යුහයක් හඳුන්වා දීම සහ මණ්ඩලයේ ලාභදායීත්වය වැඩිදියුණු කිරීම සඳහා නවීනතම තාක්ෂණය හරහා නව මුහුණුවරක් හඳුන්වා දීම.

### තරඟකාරී පසුබිම

සංවර්ධන ලොතරැයි මණ්ඩලය ක්ෂණික ලොතරැයි වෙළඳපොළට හඳුන්වා දීමෙන් පසු ජාතික ලොතරැයි මණ්ඩලය විසින් වෙළඳපොළට ක්ෂණික ලොතරැයි දෙකක් හඳුන්වා දෙන ලදී: සෙවණ සහ සමෘද්ධි එම ලොතරැයි දෙක විය. සෙවණ ලොතරැයිය සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ක්ෂණික සූරන ලොතරැයියේ සෘජු තරඟකරු විය. සෙවන ක්ෂණික ලොතරැයිය පැවැත්වීම සඳහා ජාතික ලොතරැයි මණ්ඩලය විසින් කළමනාකරණය කරනු ලබන වෙනම ම ආයතනයක් ස්ථාපනය කරන ලදී. එම නිසා ජනතාව එය මෙරට තිබෙන ක්ෂණික ලොතරැයි ව්‍යාපාර ආයතනයක් ලෙස පුළුල්ව පිළිගන්නා ලදී.

# තිරසාරභාවය පිළිබඳ වාර්තාව

පසුගිය දශක හතරක කාලය තුළදී, සංවර්ධන ලොතරැයි මණ්ඩලය තිරසාර ව්‍යාපාරික ආයතනයක් ලෙස පැවත තිබේ. එය ආරම්භයේ සිටම, තරඟකාරී ව්‍යාපාර ක්‍රමෝපාය සකස් කිරීම සමාජයේ දිගු කාලීන අවශ්‍යතා හා සාරධර්ම සමඟ නෛසර්ගිකව නොගැටෙන බවට සංවර්ධන ලොතරැයි මණ්ඩලය විශ්වාසය තබාගෙන ඇත. මණ්ඩලයේ තිරසාරභාවය පිළිබඳ වාර්තාව එහි පැතිකඩ, තිරසාරභාවය සඳහා වන උපාය මාර්ගය, ආර්ථික වගකීම, සමාජ වගකීම සහ පාරිසරික වගකීම යන ඒවායින් සමන්විත වේ.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය වගකීමෙන් යුතු වර්ධනයක් සඳහා කැපවී සිටින අතර එය ස්වකීය ලොතරැයි නිෂ්පාදන සහ ත්‍යාග හරහා ශ්‍රී ලාංකිකයින්ට ක්‍රමයෙන් නියත සහ තිරසාර වටිනාකමක් නිර්මාණය කර දෙයි. මෙම වාර්තාව මගින් සමාජ, පාරිසරික හා ආර්ථික වගවීම පවත්වා ගැනීම සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග අවධාරණය කර ඇත. සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි සමාජ වගකීමට ව්‍යාපාරයේ, පාරිභෝගිකයින්ගේ සහ ලොතරැයි ජයග්‍රාහකයින්ගේ ආරක්ෂාව සඳහා ගෙන ඇති වගකීම් සහගත ක්‍රියාමාර්ග මෙන්ම ප්‍රජා සත්කාර වැඩසටහන් ද ඇතුළත් වේ.

පාරිසරික වගකීම සාක්ෂාත් කර ගැනීම පිණිස සංවර්ධන ලොතරැයි මණ්ඩලය ස්වකීය ආයතනික ක්‍රියාකාරකම්වල පාරිසරික බලපෑම නියාමනය කරන අතර පරිසර හිතකාමී ක්ෂණික ලොතරැයි නිෂ්පාදනය කරයි.



ආර්ථික වගකීම, විනිවිදභාවයෙන් යුතු සහ සමබර වන පාලන ව්‍යවහාර තුළින් පිළිබිඹු කරයි.

## අපගේ මූලික සාරධර්ම

සංවර්ධන ලොතරැයි මණ්ඩලය අපගේ තෝරා ගෙන ඇති ව්‍යාපාරික ක්ෂේත්‍රය තුළ සුවිශේෂී පාරිභෝගික අත්දැකීමක්, කැපවීම, විශ්වාසනීයත්වය සහ උපදේශනය ලබා දීම සඳහා මණ්ඩලයට පැහැදිලි අභිලාෂයක් අඛණ්ඩව පවත්වා ගනී. මෙම අභිලාෂය සපුරාලීම සරල දෙයක් නොවන අතර එය බොහෝ දුරට අපි තිරසාර ආකාරයකට වගකීම් සහගත ව්‍යාපාරයක් බවට පත්වෙමින් සිටින බවට සැකයකින් තොරව සනාථ කිරීමට අපිට ඇති හැකියාව මත රඳා පවතියි.

අපගේ කැපවීමෙන් යුතු දැඩි ලෙස උද්යෝගිමත් සේවකයින් සම්බන්ධයෙන් සැලකූ විට, ශක්තිමත් කණ්ඩායමක් අපට සිටීම වාසනාවකි. ඒ නිසාම සිය කාර්යයන් පිළිබඳ ආඩම්බර විය හැකි පරිසරයක් නිර්මාණය කිරීමට අපි කැපවී සිටිමු. අපගේ ශ්‍රම බලකායෙහි විශිෂ්ඨත්වය සහ දියුණුව දිරිගැන්වීම පිණිස පුහුණුව සහ අඛණ්ඩ අධ්‍යාපනය සඳහා අවස්ථා ලබා දීම මගින් අපි අපගේ සේවක පිරිස සඳහා ආයෝජනය කරන්නේ අපගේ ව්‍යාපාරයේ සාර්ථකත්වය රඳා පවතින්නේ තම රැකියාව පිළිබඳ ඔවුන්ගේ ඇති තෘප්තිමත්භාවය මත වන බව අපි අවබෝධ කර ගෙන සිටින බැවින්ය.

අපගේ තිරසාරභාවය පිළිබඳ වැඩසටහන මගින් පාරිභෝගික අත්දැකීම් වැඩිදියුණු කිරීමට, කර්මාන්තයේ රැකියා නිර්මාණය කිරීම සහ ජනාධිපති අරමුදලට හා මහපොළ භාරකාර අරමුදලට දායකත්වය ලබා දීම තුළින් සෞඛ්‍ය රැකවරණය සහ අධ්‍යාපනය වැනි වැදගත් සේවාවන් සපයා දීමට සහාය වීම සඳහා ආදායම වැඩි කර ගැනීම අරමුණු කරයි. සංවර්ධන ලොතරැයි මණ්ඩලය ලොතරැයි සපයා දීමේදී පාරිභෝගිකයින් කෙරෙහි වඩාත් නැඹුරුවී සිටින අතර, සේවා සපයන්නන් අධීක්ෂණය කිරීම අඛණ්ඩව සිදු කරයි.

## පාරිසරික වගකීම

පරිසරයට වන බලපෑම අවම කිරීම සඳහා අප විසින් දරන ලද ප්‍රයත්නයන් ධනාත්මක ප්‍රතිඵල අත් කර දී ඇත. සංවර්ධන ලොතරැයි මණ්ඩලය සේවකයින් සඳහා පරිපූර්ණ පුහුණුව, නව්‍ය තාක්ෂණය සහ පාර්ශවකරුවන් සමග සහයෝගීතාවය හරහා ඵලදායී ප්‍රජා සහාය සේවාවන් සපයා දීමට කැප වී සිටී.

සසිරි ඊ-ලොතරැයි සේවය සහ ඊ යෙදවීම් සමඟ සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ Sweep App හඳුන්වාදීම, මෙම පරමාර්ථයන්ට උදාහරණ සපයයි. ඩිජිටල්කරණය වැළඳගැනීම මගින්, සංවර්ධන ලොතරැයි මණ්ඩලය ස්වකීය ගනුදෙනුකරුවන්ගේ පහසුව උදෙසා වැඩි වැඩියෙන් ඊ යෙදවුම් සහ ඊ-සේවා හඳුන්වා දෙමින් පෘථිවිය මත කාබන් පියසටහන අවම කිරීමට ඉලක්ක කරයි. අප පාරිසරික බලපෑම පිළිබඳ සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි මෙහෙයුම් වැඩි දියුණු කිරීමට සහ ගනුදෙනුකරුවන් සහ සේවකයින් අතර හරිත දැනුවත්භාවය වැඩි කිරීමට ද කැපවී සිටිමු. මෙම වාර්තාව තුළින් අපි සෑම වර්ෂයකම මෙම ක්ෂේත්‍රයන්හි  අපි අත් කර ගනිමින් සිටින ප්‍රගතිය පෙන්වා දෙන අතර ඉදිරි වර්ෂය සඳහා අපගේ අරමුණු ද ප්‍රකාශ කරන්නෙමු.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය සිය ලොතරැයි නිෂ්පාදන හා ත්‍යාග තුළින් තිරසාර සංවර්ධනයට කැපවී සිටින අතර, එය ශ්‍රී ලාංකිකයින්ගේ ජීවිතවලට ස්ථාවර වටිනාකමක් ලබා දේ. මෙවැනි වැඩසටහන් සංවර්ධන ලොතරැයි මණ්ඩලය ස්වකීය ආයතනික ව්‍යායාමයන්හි පාරිසරික බලපෑම් අඛණ්ඩව අධීක්ෂණය කිරීම සමඟ සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සමාජ, පාරිසරික සහ මූල්‍ය වගකීම් ඉටු කිරීම සඳහා සිය බැඳීම අවධාරණය කරයි.

## ආයතනික සමාජ වගකීම

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අපට අපගේ ආයතනික සමාජ වගකීම් වැඩසටහන් තුළින් වටිනා ප්‍රජා සාමාජිකයෙකු ලෙස පිළිගනු ලැබීමට අපි අපේක්ෂා කරමු.

# තිරසාරභාවය පිළිබඳ වාර්තාව

එබැවින්, සංවර්ධන ලොතරැයි මණ්ඩලය අර්ථවත්, දිගුකාලීන හවුල්කාරිත්වයන් හරහා ප්‍රජාවට දායක වීම සහ පාරිසරික වශයෙන් තිරසාර ලෙස ව්‍යාපාර පවත්වාගෙන යාම කෙරෙහි ප්‍රමුඛතාව ලබා දේ.

අපි ජනාධිපති අරමුදලට සහ මහපොළ උසස් අධ්‍යාපන භාර අරමුදල වැනි සහය වැඩසටහන්වලට මෙන්ම ප්‍රාදේශීය පුණ්‍යායතනවලට  සහ සත්කාරක ප්‍රජාවන්ට අරමුදල් සපයා දෙන අතර, ඒ තුළින් ශ්‍රී ලංකාවේ ජනතාවගේ ජීවිත කෙරෙහි ධනාත්මක බලපෑම් ඇති කරයි.

ලොතරැයි අලෙවිකරුවන්/බෙදාහරින්නන්ගේ සමස්ත දාමයට ම සහාය සපයා දෙමින් පුද්ගලයින්ගේ සවිබල ගැන්වීම අරමුණු කර ගත් විවිධ සමාජ ව්‍යවසායකත්ව වැඩසටහන් කිහිපයක් සංවර්ධන ලොතරැයි මණ්ඩලය ක්‍රියාත්මක කර ඇත.

## රැකියා සවිබල ගැන්වීම

2023 දී අලෙවි නියෝජිතයින් සහ අලෙවි සහයකයින් සඳහා ඔවුන්ගේ කාර්යසාධනය වැඩි කිරීමට සහ විවිධාකාරයෙන් සහයෝගය ලබාදීමට විශේෂ වැඩසටහන් පවත්වන ලදි.

සියලූම ලොතරැයි ටිකට්පත් වර්ග සඳහා රු.40 දක්වා ටිකට්පත් මිල වැඩි කිරීමෙන් පසු, අලෙවි නියෝජිතයින්ට සම්මත කොමිස් මුදල වන රු.7.50ට අමතරව ශත 50ක දිරිදීමනාවක් ලැබුණි,  තවද බෙදාහැරීමේ අලෙවි නියෝජිතවරුන්ගේ ලඟා කර ගන්නා ඉලක්කවලට දැනට පවතින ශත 50 කොමිස් මුදල මත ශත 5ක ප්‍රසාද දීමනාවක් පිරිනමන ලදී.

අලෙවි කාර්ය මණ්ඩලයට සුපිරි ධන සම්පත ලොතරැයි ටිකට්පත සඳහා, දිනුම් අදින ලද සියලූම ටිකට්පත් මත අමතර ශත 25ක දිරිදීමනාවක් ලැබුණු අතර එහි මුළු මුදල ශත 75ක් බවට පත්විය. අලෙවි ඉලක්ක කරා ලඟාවීම මත, බෙදාහැරීමේ අලෙවි වෘත්තිකයින් වෙත ලොතරැයි ටිකට්පතකට ශත 50 කොමිස් මුදලට අමතරව ශත 15ක ප්‍රසාද දීමනාවක් ලැබුණි.

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ  ලොතරැයි ටිකට්පත් ප්‍රදර්ශනය කරන ඉහළම අලෙවිය සහිත අලෙවිකුටි/ජංගම වාහන පහකට 2023 ජූලි මිල වැඩි කිරීමෙන් පසුව 60%ක අලෙවිය පවත්වා ගැනීමට රු. 5,000 දෛනික මුදල් දිරි දීමනාවක් පිරිනමන ලදී. වැඩසටහන දෛනිකව DLB ලොතරැය දැක්ම සහිත අලෙවි කුටි සමඟ 2023 ජූලි 18 සිට 2023 අගෝස්තු 31 දක්වා ක්‍රියාත්මක කරන ලදී.

සුපිරි ධන සම්පත ලොතරැයි ටිකට්පත් අලෙවිය වැඩි කිරීම සඳහා, සුපිරි ධන සම්පත ලොතරැයිය ප්‍රමුඛ අයුරින් ප්‍රදර්ශනය කිරීම මත පදනම් වී තෝරාගත් අලෙවි කුටි 10ක වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලද අතර අනෙකුත් සංවර්ධන ලොතරැයි මණ්ඩල ලොතරැයි ටිකට් සඳහා සුපිරි ධන සම්පත ලොතරැයි ටිකට්පත් තිහක් මිලදී ගැනීම සඳහා වවුචර් ලැබුණි. මෙම වැඩසටහන 2023 නොවැම්බර් 20 සිට 2023 දෙසැම්බර් 31 දක්වා ක්‍රියාත්මක කරන ලදී.

2023 දෙසැම්බර් ගාල්ල, මාතර, මහනුවර සහ මොනරාගල යන දිස්ත්‍රික්කවල ගංවතුරෙන් පීඩාවට පත් අලෙවි නියෝජිතයින් සහ අලෙවි සහයකයින් 230කට රු. 1,150,000ක් වූ මූල්‍යමය අධාර වෙන් කරන ලදී.

2023 දී, රු. 65,610,000ක වියදමකින් සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සන්නාමය සහිත නව විකුණුම් අලෙවි කුටි 527ක් ස්ථාපිත කරන ලදී.

2023 දී, රු. 11,655,052ක පිරිවැයකින් අලෙවි කුටි 203ක් ස්ටිකර් කරන ලදි.

2018 දි ආරම්භකළ "ලොතරැයි  අලෙවිසැල්" අනුග්‍රහක වැඩසටහන 2023 දී දිවයින පුරා ලොතරැයි  අලෙවිසැල් 25ක් ස්ථාපිත කිරීමට හේතු විය.

"සිල්ලර වෙළෙඳසැල් ව්‍යාපෘතිය තුළින් අලෙවිය"  2023 දි දිවයින පුරා සිල්ලර වෙළෙඳසැල් 882 දක්වා ලොතරැයි ටිකට් හඳුන්වා දෙන ලදී.

2023 දී විවිධ රෝගවලට ගොදුරු වූ සහ මියගිය සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අලෙවි නියෝජිතයින්ට සහ අලෙවි සහයකයින් වෙනුවෙන් රු.6,735,594ක් වෙන් කරන ලදී.

2023 දී, දිවයින පුරා විසිරී සිටින සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අලෙවි නියෝජිතයින් අතර උද්‍යාන කුඩ 88ක් බෙදාහරින ලදී.

ඉහළම අලෙවිය වාර්තාකළ දිස්ත්‍රික් අලෙවි නියෝජිතයින් දිරි ගැන්වීමට දිස්ත්‍රික්කවල කුඩා රැස්වීම් සංවර්ධනය කරන ලද අතර අලෙවි සහයකයින්ගේ අදහස් මෙම රැස්වීම්වලදී පෙළගැස්වීමට සැලකිල්ලට ගනිමින් සේවාව අගය කිරීමේ ත්‍යාග පිරිනමන ලදි.

## වෙනත් ආයතනික සමාජ වගකීම් කටයුතු

විශ්ව විද්‍යාලවලට ඇතුළත් වූ සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අලෙවි නියෝජිතයින්ගේ ළමුන් සඳහා ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. මෙම අරමුණ සඳහා 2023 වසරේදී රු. 838,500ක් වෙන් කිරීමක් සිදු කරන ලදී.

තවද, පහ වසර ශිෂ්‍යත්ව විභාගය, අපොස සාමාන්‍ය පෙළ විභාගය සහ අපොස උසස් පෙළ විභාගය සමත් අලෙවි නියෝජිතයින්ට සහ අලෙවි සහයකයින්ට රු.300,000ක් ලබා දෙන ලදී.

## මානව සම්පත්

යහපත් ව්‍යාපාරික පිළිවෙත සංවර්ධනය කිරීමේදී සහ කල් පවත්නා පාරිභෝගික සම්බන්ධතා ගොඩනැගීමේදී අපගේ සේවකයින් වැදගත් කාර්යභාරයක් ඉටුකරන බව අපි පිළිගනිමු. අපි අපගේ සේවකයින්ව ඉතා දැඩි ලෙස අගය කරන අතර, ඔවුන් ලබා දෙන ඉතා වටිනා දායකත්වයන් පිළිබඳ අපගේ ඇගයීම පෙන්නුම් කිරීම සඳහා නව්‍ය, සහයෝගී සහ ආකර්ෂණීය සේවා ස්ථානයක් නිර්මාණය කිරීමට අපි උත්සාහ කරන්නෙමු.

## කාර්ය මණ්ඩල සංවර්ධන අරමුණු

අපගේ ආයතනය තුළ රැකියා සහ වෘත්තීය අවස්ථා බිහිකිරීම සහ පෝෂණය කිරීම පහත ක්‍රියාමාර්ග සඳහා අපි කැපවී සිටිමු.

- අපගේ ශ්‍රම බලකා සැලසුම් කිරීම සහ නිපුණතා කළමනාකරණ වැඩසටහන් අඛණ්ඩව උසස් කිරීම සහ ගුණාත්මක බඳවා ගැනීම් සහ රඳවා ගැනීමේ ක්‍රියාමාර්ග කෙරෙහි අවධානය මෙන්ම, නායකත්ව සහ අනුප්‍රාප්තික සැලසුම්කරණ උපායමාර්ග සංවර්ධනය කිරීම.
- අපගේ සේවකයින්ගේ දායකත්වයන් පිළිගන්නා බව සහ අගය කරන බව සහතික කරමින්  ඔවුන්ගේ ජයග්‍රහණ වෙනුවෙන් ඔවුන්ව සවිබලගැන්වීම සහ ප්‍රධාන ලබාදීම.
- සමාගමේ ක්‍රමෝපායික දිශාව පිළිබඳව  අපගේ කාර්ය මණ්ඩලය මානව දැනුවත් කර තබාගැනීම සහ ආයතනයේ අරමුණු සහ පරමාර්ථ සමඟ ඔවුන්ගේ උත්සාහයන් පෙළගැස්වීමට ඔවුන් ශක්තිමත් කිරීම.

# දේශීය පුහුණු වැඩසටහන්

| පුහුණු වැඩසටහන | සහභාගි වූ අයගේ නම | තනතුර | පුහුණු කාලසීමාව | ආයතනය |
|---|---|---|---|---|
| මුදල් රෙගුලාසි 104 අලාභ වාර්තා කිරීම හානිපූර්නය හා ගිණුම් තැබීම පිළිබඳ වැඩමුළුව | 1. නුවන් අබේරත්න මහතා<br>2 චමිලා තෙවරප්පෙරුම මහත්මිය<br>3. ප්‍රසන්න ගෝකුල මහතා | කණිෂ්ඨ කළමනාකරුවන් | දින 02 | නිපුණතා සංවර්ධන අරමුදල |
| | 4. චමිලා දිසානායක මහත්මිය<br>5. ප්‍රියංගනී රාජපක්ෂ මෙනවිය<br>6. ෂෙරින් පිරිස් මහත්මිය<br>7. සුනේත්‍රා සුදර්ශනී මහත්මිය<br>8. චමෝද්‍යා සමරසිංහ මෙනවිය<br>9. නිරෝධා නදිශානි මෙනවිය<br>10. අයන්ති සාරාංගා මහත්මිය<br>11. කල්හාරි විජේසේකර මහත්මිය<br>12. බුද්ධික කරුණාසේන මහතා<br>13. දුෂානි ප්‍රනාන්දු මහත්මිය<br>14. සජිත ආටිගල මහතා<br>15. නලින් දර්ශන මහතා<br>16. තාරක පෙරේරා මහතා<br>17. කණිෂ්ක මධුශංක මහතා<br>18. රොහාන් පුෂ්පකුමාර මහතා<br>19. සාමල් ජයසිංහ මහතා<br>20. චම්මිකා විජේසේකර මහත්මිය<br>21. මනෝපිතා සංජීවනි මහත්මිය<br>22. දර්ශි රත්නසේකර මහත්මිය<br>23. අමිල පුංචිහේවා මහතා<br>24. කෞශල්‍ය වික්‍රමසිංහ මහතා<br>25. ජලිත පුංචිහේවා මහතා<br>26. ඩිලාන් විරසිංහ මහතා<br>27. ජගත් මුදන්නායක මහතා<br>28. හිමාෂි විතානගේ මහත්මිය<br>29. ශශිකා දිල්හානි මහත්මිය<br>30. අචිනි මධුශානි මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| ආයතනික අභ්‍යන්තර පාලන ක්‍රම පිළිබඳ එක් දින වැඩමුළුව | 1. විපිතා සෝමරත්න මෙනවිය<br>2. ඩී.ඩී.සී. දම්මින්ද මහතා | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී | දින 01 | නිපුණතා සංවර්ධන අරමුදල |
| | 3. කසුන් ජයසූරිය මහතා<br>4. නිශාන් පෙරේරා මහතා<br>5. ආචාර්ය අසංක ගුණසිංහ මහත්මිය<br>6. ප්‍රසාද් රණසිංහ මහතා<br>7. පී.ඩී.යු. මලින්ත මහතා | සහකාර සාමාන්‍යාධිකාරී | | |
| | 8. සී.සී. අයිලප්පෙරුම මහතා | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වැඩබලන) | | |
| | 9. වසන්ත උදයකුමාර මහතා | අභ්‍යන්තර විගණක | | |
| | 10. නුවන් අබේරත්න මහතා<br>11. මේජර්. ක්‍රිශාන්ත ජයමහ මහතා<br>12. මලින්ද බලගල්ල මහතා<br>13. උමේෂ් ඉලේපෙරුම මහතා<br>14. චමිලා තෙවරප්පෙරුම මහත්මිය<br>15. ඉන්දික උපුල් මහතා<br>16. චන්ද්‍රා රාපක්ෂ මහත්මිය<br>17. වත්සලා රූපසිංහ මහත්මිය<br>18. නෙරංජලා ගුණසේකර මහත්මිය<br>19. චමින්ද කරුණාරත්න මහතා<br>20. සේපාලිකා ප්‍රේමතිලක මහත්මිය<br>21. ප්‍රසන්න ගෝකුල මහතා | කණිෂ්ඨ කළමනාකරුවන් | | |

# දේශීය පුහුණු වැඩසටහන්

| පුහුණු වැඩසටහන | සහභාගි වූ අයගේ නම | තනතුර | පුහුණු කාලසීමාව | ආයතනය |
|---|---|---|---|---|
| වෘත්තීමය ජායාරූප නිපුණතා සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩමුළුව | 01. ඇෂ්ලි ලාසර්ස් මහතා<br>02. රේඛාන් සන්කන මහතා<br>03. අමිල පුංචිහේවා මහතා<br>04. කමේෂ් කාන් මහතා | කළමනාකරණ සහයක | දින 05 | ජාතික තරුණ සේවා සභාව |
| | 05. ලක්නාත් රණසිංහ මහතා | කාර්යාල කාර්ය සහයක | | |
| පොදු ප්‍රසම්පාදන ක්‍රියාවලිය | සි.සී. අයිලප්පෙරුම මහතා | සහකාර සාමාන්‍යාධිකාරී (විකුණුම්) වැඩබලන | දින 02 | නිපුණතා සංවර්ධන අරමුදල |
| | ප්‍රසන්න ගෝකුල ප්‍රනාන්දු මහතා | ප්‍රවාහන නිලධාරී | | |
| | තිළිණ අමරසිංහ මහත<br>තිසර ඉඳුසංඛ මහතා | කළමනාකරණ සහකාර | | |
| අභ්‍යන්තර විගණන ක්‍රියාපටිපාටියේ මූලධර්ම පිළිබඳ වැඩමුළුව | වසන්ත සේනාධිර මහතා | අභ්‍යන්තර විගණක | දින 02 | නිපුණතා සංවර්ධන අරමුදල |
| විකිණීමේ බලපත්‍ර ලබාගැනීම පිළිබඳ වැඩමුළුව | අයි.ඩී.පී. කුමාරසිරි මහතා | කළාප කළමණාකරු | මාස 03 | SLIM ආයතනය |
| ආයතනික සැලැස්ම සංවර්ධනය පිළිබඳ පාඨමාලාව | ඩිස්නි තරින්ද්‍රා මහත්මිය | කළමනාකරණ සහකාර | දින 01 | නිපුණතා සංවර්ධන අරමුදල |
| රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පුහුණු වැඩමුළුව | 1. විපිතා සෝමරත්න මහත්මිය<br>2. ඩී.ඩී.සී. දම්මින්ද මහතා | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී | දින 02 | මුදල් අමාත්‍යංශය |
| | 3. කසුන් ජයසූරිය මහත<br>4. නිශාන් පෙරේරා මහතා<br>5. ආචාර්ය අසංක ගුණසිංහ මහතා<br>6. ප්‍රසාද් රණසිංහ මහතා<br>7. පී.ඩී.යු. මලින්ත මහතා | සහකාර සාමාන්‍යාධිකාරී | | |
| | 8. සි.සී. අයිලප්පෙරුම මහතා | සහකාරී සාමාන්‍යාධිකාරී (වැඩබලන) | | |
| | 9. වසන්ත උදයකුමාර මහතා | අභ්‍යන්තර විගණක | | |
| | 10. නුවන් අබේරත්න මහතා<br>11. යූ.ජී. ඉලේපෙරුම මහතා<br>12. ඉන්දික උපුල් මහතා<br>13. චන්ද්‍රා රාජපක්ෂ මහත්මිය<br>14. වත්සලා රූපසිංහ මහත්මිය<br>15. චමින්ද කරුණාරත්න මහතා<br>16. සේපාලිකා ප්‍රේමතිලක මහත්මිය<br>17. ප්‍රසන්න ගෝකුල මහතා | කණිෂ්ඨ කළමනාකරුවන් | | |
| | 18. මනෝපිතා සංජීවනි මහත්මිය<br>19. දර්ශි රත්නසේකර මහත්මිය<br>20. තිසර ඉඳුසංඛ මහතා<br>21. චාමර කටුකෙන්ද මහතා<br>22. අචිනි මධුශානි මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| වරලත් ගණකාධි-කාරීන්ගේ 44 වැනි ජාතික සමුළුව | 1. නිශාන් පෙරේරා මහතා | සහකාර සාමාන්‍යාධිකාරී මුදල් | දින 03 | වරලත් ගණකාධිකාරී ආයතනය |
| | 2. වසන්ත උදයකුමාර මහතා | අභ්‍යන්තර විගණක | | |
| සිදුවීම් කළමනාකරණය | 1. සුදර්ශන නැදගමුව මහතා<br>2. අනුරාධා ගොඩගම්පල මහත්මිය<br>3. ඩී.ජී. වීරසේකර මහත්මිය<br>4. ඩබ්.එම්.ප්‍රාර්ථනා මහත්මිය | කළමනාකරණ සහකාර | දින 02 | නිපුණතා සංවර්ධන අරමුදල |
| UPS යන්ත්‍ර නඩත්තුව සඳහා පුහුණුව | ඩී.එන්.එස්.ජී. රාජපක්ෂ මහතා | විදුලි කාර්මික | දින 01 | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය |
| ජාතික තොරතුරු තාක්ෂණ සමුළුව 2023 | උමේෂ් ඉලේපෙරුම මහතා | පද්ධති විශ්ලේෂක | දින 01 | ශ්‍රී ලංකා පරිගණක සංසදය |

| පුහුණු වැඩසටහන | සහභාගි වූ අයගේ නම | තනතුර | පුහුණු කාලසීමාව | ආයතනය |
|---|---|---|---|---|
| දිනුම් ඇදීමේ යන්ත්‍ර භාවිතය සඳහා පුහුණුව | 1. එල්. ප්‍රදීප් ප්‍රේමසිරි මහතා<br>2. යූ.එන්.සී. පෙරේරා මහතා<br>3. ආර්.එම්.යූපී.රාමනායක මහතා<br>4. ඩබ්.බී.එන්.එස්. පෙරේරා මහතා<br>5. එන්. තරංග සමරසේකර මහතා<br>6. ඩී.ඩී. මානෙල් දිසානායක මහතා<br>7. අයි.එන්. වික්‍රමසිංහ මහතා<br>8. කේ.පී.ඩබ්.එස්. බර්නාඩ් මහතා<br>9. ඩී.එම්. මනෝජ් අධිකාරි මහතා<br>10. අයි.කේ. විශ්වජිත් ඉලංගකෝන් මහතා | ආරච්චි<br>දිනුම් ඇදීමේ යන්ත්‍ර භාරකරු<br>දිනුම් ඇදීමේ යන්ත්‍ර භාරකරු<br>දුරකථන ක්‍රියාකරු<br>සන්නිවේදනකරු<br>නිවේදන සහයක<br>අනුපිටපත් යන්ත්‍ර භාරකරු<br>දිනුම් ඇදීම් යන්ත්‍ර භාරකරු<br>දිනුම් ඇදීමේ යන්ත්‍ර භාරකරු<br>දිනුම් ඇදීමේ යන්ත්‍ර භාරකරු | | |
| දිනුම් ඇදීමේ යන්ත්‍ර භාවිතය සඳහා පුහුණුව | 1. එම්.ඩී. චින්තක මහතා | දිනුම් ඇදීමේ යන්ත්‍ර භාරකරු | | |
| | 2. කේ.පී.උපාලි ශාන්ත මහතා<br>3. ඩී.ඩී.රන්ජන් සාලිය මහතා<br>4. ආර්.ඩී.පී.පී. රණතුංග මහතා<br>5. ඊ.එම්. දමිත් තුෂාර මහතා<br>6. ඩී.පී. කොළඹගේ මහතා<br>7. අබේසේකර ගුණරත්න මහතා<br>8. ඩබ්. මාලිංග යොහාන් මහතා<br>9. එස්.ඩී. ගර්ලි ප්‍රියදර්ශනී මහත්මිය<br>10. ආර්.ඩී. කමල් සුරවීර මහතා<br>11. ටී.පී. හෂාන් එරන්ද මහතා<br>12. කේ.ඩී.එස්. චමින්ද පෙරේරා මහතා<br>13. එස්.ඩී.ඩී. ගුණසේකර මහතා<br>14. පත්මසිරි තිසේරා මහතා<br>15. කේ.කේ විපුල් තුෂාර මහතා<br>16. එස්.ඩී. පියරත්න මහතා<br>17. එම්.ටී. සුසුන්ත ජයලාල් මහතා<br>18. ඩබ්.ඩී. රෝහාන් සම්පත් මහතා<br>19. සුරංග කොතලාවල මහතා<br>20. උපුල් ශාන්ත ජයරත්න සමතා<br>21. පී.ඩී.පී. සංකල්ප මහතා<br>22. ඩී.පී.සී.බී. මධුසංඛ මහතා<br>23. එම්.ඩී.සී. මධුසංඛ මහතා<br>24. පී.බී. මහයාහගේ මහතා<br>25. ඩී.එල්.එල්. රණසිංහ මහතා<br>26. ඩී.පී. නුවන් විබුද්ධ මහතා<br>27. ආර්.එස්.ඩී.ටී.පී. සිරිවර්ධන මහතා<br>28. රෝහන අරුණ ශාන්ත මහතා<br>29. එච්.එච්. මධුරංග ඔහතා<br>30. ඩී.ඩී.ඩබ්. විශ්වජිත් මහතා<br>31. ඩී.එම්.එල්. වානගුරු මහතා<br>32. කේ.එල්.පී. ෆොන්සේකා මහතා<br>33. නෙරන්ජන් ප්‍රනාන්දු මහතා<br>34. එන්. ප්‍රදීප් තරංග මහතා<br>35. ජයන්ත පෙරේරා මහතා<br>36. ඩී.එන් එස්.ඩී. රාජපක්ෂ මහතා<br>37. කේ,එච්. සුජිත් කුමාර මහතා<br>38. කේ.එච්. උදාර මධුමල් මහතා<br>39. ඩී.එම්. සමරසිංහ මහතා<br>40. එම්.එච්. ශෂික රදිශාන් මහතා | කාර්යාල කාර්ය සහකාර | දින 01 | ට්‍රේඩ් ප්‍රමෝටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| විද්‍යුත් පාලන ප්‍රසම්පාදනය | පී.ඩී.යූ. මලින්ත මහතා | සහකාර සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන) | දින 01 | මුදල් අමාත්‍යාංශය |
| | මනෝපීතා සංජීවනී මහත්මිය<br>චාමර කටුකෙන්ද මහතා | කළමනාකරණ සහකාර | | |

# 2023.12.31 දිනට අනුමත සේවක සංඛ්‍යාව

| තනතුර | වැටුප | අනුමත සේවක සංඛ්‍යාව | සිටින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු | අතිරික්තය |
|---|---|---|---|---|---|
| | | | | | |
| සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී | | 1 | 1 | | |
| සාමාන්‍යාධිකාරී | H.M - 2.1 | 1 | 1 | | |
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි) | H.M - 1.1 | 1 | 1 | | |
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) | H.M - 1.1 | 1 | 1 | | |
| සහකාර සාමාන්‍යාධිකාරී (අලෙවි) | M.M-1.1 | 2 | 1 | 1 | |
| සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) | M.M- 1.1 | 3 | 2 | 1 | |
| සහකාර සාමාන්‍යාධිකාරී (විකුණුම්) | M.M- 1.1 | 2 | 1 වැඩබලන | 2 | |
| සහකාර සාමාන්‍යාධිකාරී (මා.ස./පරිපාලන) | M.M- 1.1 | 1 | 1 | | |
| සහකාර සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදනය) | M.M- 1.1 | 1 | 1 | | |
| සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණ) | M.M- 1.1 | 1 | 0 | 1 | |
| අභ්‍යන්තර විගණක | M.M- 1.1 | 1 | 1 | | |
| පරිපාලන නිලධාරී | J.M- 1.1 | 1 | 1 | | |
| ප්‍රධාන ආරක්ෂක නිලධාරී | J.M- 1.1 | 1 | 1 | | |
| ප්‍රවාහන නිලධාරී | J.M- 1.1 | 1 | 1 | | |
| කලාප කළමනාකරු | J.M- 1.1 | 10 | 10 | | |
| ගිණුම් නිලධාරී | J.M- 1.1 | 4 | 4 | | |
| පද්ධති/වැඩසටහන් විශ්ලේෂක | J.M- 1.1 | 1 | 1 | | |
| ප්‍රසම්පාදන නිලධාරී | J.M- 1.1 | 1 | 1 | | |
| මානව සම්පත් නිලධාරී | J.M- 1.1 | 1 | 1 | | |
| අලෙවි හා ප්‍රචාරණ නිලධාරී | J.M- 1.1 | 1 | 1 | | |
| අලෙවි ප්‍රවර්ධන සහකාර | MA - 3 | 24 | 16 | 8 | |
| තත්ත්ව පාලන සහකාර | MA - 3 | 1 | 0 | 1 | |
| තොරතුරු තාක්ෂණ සහකාර | MA - 3 | 4 | 2 | 2 | |
| මාධ්‍ය හා මහජන සම්බන්ධතා සහකාර | MA-3 | 1 | 1 | | |
| ප්‍රසම්පාදන සහකාර | MA-3 | 1 | 0 | 1 | |
| ගිණුම් සහකාර | M.A-2.2 | 2 | 0 | 2 | |
| ප්‍රධාන කලමනකාරණ සහකාර | MA-1.2 | 1 | 1 | | |
| කලමනකාරණ සහකාර - 135 හා පෞද්ගලික සහකාර 01 | MA-1.2 | 136 | 118+2** | 16 | |
| අලෙවි සම්බන්ධීකාරක* | MA-1.2 | 5 | 3 | 2 | |
| රියදුරු | P.L - 3 | 43 | 37+1** | 5 | |
| විදුලි කාර්මික | P.L -3 | 2 | 1 | 1 | |
| කාර්යාල කාර්ය සහායක | P.L -1 | 65 | 55+1** | 9 | |
| ක්ෂේත්‍ර ප්‍රවර්ධක | P.L -1 | 10 | 9 | 1 | |
| ක්ෂේත්‍ර ජංගම රථ නිවේදක | P.L -1 | 6 | 1 | 5 | |
| ආරක්ෂක සහකාර | P.L -1 | 3 | 14 | | *11 |
| **එකතුව** | | **340** | **289+4**** | **58** | ***11** |

* මෙම තනතුරු කාර්ය මණ්ඩලය ලෙස අනුමත කර ඇත.
* * කොන්ත්‍රාත් සේවක සංඛ්‍යාව

| වයස් අනුව කාර්ය මණ්ඩලය | |
|---|---|
| අවුරුදු 59 | 4 |
| අවුරුදු 58 | 2 |
| අවුරුදු 57 | 3 |
| අවුරුදු 56 | 13 |
| අවුරුදු 55 | 5 |
| අවුරුදු 54 | 9 |
| අවුරුදු 53 | 6 |
| අවුරුදු 52 | 9 |
| අවුරුදු 51 | 7 |
| අවුරුදු 50 | 3 |
| අවුරුදු 49 | 11 |
| අවුරුදු 48 | 10 |
| අවුරුදු 47 | 9 |
| අවුරුදු 46 | 9 |
| අවුරුදු 45 | 14 |
| අවුරුදු 44 | 9 |
| අවුරුදු 43 | 17 |
| අවුරුදු 42 | 14 |
| අවුරුදු 41 | 16 |
| අවුරුදු 40 | 11 |
| අවුරුදු 39 | 11 |
| අවුරුදු 38 | 8 |
| අවුරුදු 37 | 12 |
| අවුරුදු 36 | 12 |
| අවුරුදු 35 | 6 |
| අවුරුදු 34 | 6 |
| අවුරුදු 33 | 10 |
| අවුරුදු 32 | 6 |
| අවුරුදු 31 | 8 |
| අවුරුදු 30 | 9 |
| අවුරුදු 29 | 7 |
| අවුරුදු 28 | 7 |
| අවුරුදු 27 | 6 |
| අවුරුදු 26 | 2 |
| අවුරුදු 25 | 2 |
| **එකතුව** | **293** |

| වර්ගය අනුව කාර්ය මණ්ඩලය | |
|---|---|
| සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී | 1 |
| සාමාන්‍යාධිකාරී | 1 |
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී | 2 |
| සහකාර සාමාන්‍යාධිකාරී | 5 |
| අභ්‍යන්තර විගණක | 1 |
| පරිපාලන නිලධාරී | 1 |
| ප්‍රධාන ආරක්ෂක නිලධාරී | 1 |
| කලාප කළමනාකරු | 10 |
| ගිණුම් නිලධාරී | 4 |
| පද්ධති/වැඩසටහන් විශ්ලේෂක | 1 |
| මානව සම්පත් නිලධාරී | 1 |
| ප්‍රසම්පාදන නිලධාරී | 1 |
| ප්‍රවාහන නිලධාරී | 1 |
| අලෙවි හා ප්‍රචාරණ නිලධාරී | 1 |
| ප්‍රදේශ අලෙවි ප්‍රවර්ධන සහකාර | 16 |
| තොරතුරු තාක්ෂණ සහකාර | 2 |
| මාධ්‍ය හා මහජන සම්බන්ධතා සහකාර | 1 |
| ප්‍රධාන කලමනකාරණ සහකාර | 1 |
| කලමනකාරණ සහකාර | 120 |
| අලෙවි සම්බන්ධීකාරක | 3 |
| රියදුරු | 38 |
| විදුලි කාර්මික | 1 |
| කාර්යාල කාර්ය සහායක | 56 |
| ක්ෂේත්‍ර ප්‍රවර්ධක | 9 |
| ක්ෂේත්‍ර ජංගම රථ නිවේදක | 1 |
| ආරක්ෂක සහකාර | 14 |
| **එකතුව** | 293 |

| ස්ත්‍රීපුරුෂභාවය අනුව කාර්ය මණ්ඩලය | |
|---|---|
| පිරිමි කාර්ය මණ්ඩලය | 208 |
| කාන්තා කාර්ය මණ්ඩලය | 85 |
| **එකතුව** | 293 |

| වයස් ඛාණ්ඩය අනුව කාර්ය මණ්ඩලය | |
|---|---|
| 21 - 30 | 33 |
| 31 - 40 | 90 |
| 41 - 50 | 112 |
| 51 - 60 | 58 |
| **එකතුව** | **293** |

# ආයතනික පාලනය

ආයතනික පාලන පද්ධතිය සංවර්ධන ලොතරැයි මණ්ඩලයට තීරණ ගැනීම සඳහා වන පරිචයන් සහ මගපෙන්වීමේ ප්‍රතිපත්ති නිර්වචනය කර දෙන අතර ම, මණ්ඩලයෙහි දිගු කාලීන අරමුණු සහ උපාය මාර්ගික සැලසුම් වලට මග පෙන්වයි. ආයතනික පාලන ආකෘතිය මගින් සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි විවිධ මට්ටම් අතර, විශේෂයෙන් ම පාලනයෙහි මට්ටම් අතර, එනම් අධ්‍යක්ෂ මණ්ඩල සහ විධායක කළමනාකරණ මට්ටම් අතර බලතල සහ වගකීම බෙදී යන ආකාරය සංක්ෂිප්තව දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මණ්ඩලයේ ආයතනික ප්‍රතිපත්ති ස්ථාපනය කරන අතර තම ව්‍යාපාරයේ මනා ක්‍රියාකාරීත්වය සඳහා වගකිව යුතු පුද්ගලයින් වන ප්‍රධාන විධායක නිලධාරීට සහ විධායක නිලධාරීන්ට ක්‍රමෝපායික මග පෙන්වීමක් සපයා දෙයි. 1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි පනත මගින් සංවර්ධන ලොතරැයි මණ්ඩලය පාලනය වෙයි. මණ්ඩලයේ ව්‍යුහය පහත සඳහන් පරිදි පනතේ 3(ෂ) වගන්තිය යටතේ විශේෂිතව දක්වා ඇත.

**(අ) පහත සඳහන් නිල බලයෙන් පත්වන සාමාජිකයින්:**

i. මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාරකාර මණ්ඩලයේ සභාපති හෝ ඔහුගේ නියෝජිතයෙකු.

ii. ජනාධිපති ලේකම් හෝ ඔහුගේ නියෝජිතයෙකු.

iii. අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ ලේකම් හෝ ඔහුගේ නියෝජිතයෙකු.

**(ආ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන තවත් සාමාජිකයින් දෙදෙනෙක්.**

අමාත්‍යවරයා විසින් සභාපතිවරයෙකු පත් කරනු ලැබිය යුතු අතර, එම සභාපතිවරයා මණ්ඩලයේ පරිපාලනය කිරීමේ සහ කටයුතු කළමනාකරණය කිරීමේ වගකීම පැවරෙන ප්‍රධාන විධායක නිලධාරී වන්නේය.

## අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය

රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය ආයතනයේ කාර්යක්ෂම කළමනාකරණය සම්බන්ධයෙන් වගකිව යුතු වන්නේය. සියලු ව්‍යවස්ථාපිත හා අනෙකුත් කළමනාකරණ නියාමන අවශ්‍යතාවයන්ට අනුකූලව වන අතර ම, සම්පත් ආරක්ෂා කිරීම, ප්‍රමාණවත් පරිදි ගිණුම් පවත්වා ගැනීම සහ නිවැරදි වාර්තා සම්පාදනය කිරීම සහතික කරමින් මෙය සාක්ෂාත් කරගත යුතුය.

එබැවින් අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් දෑ සහතික කළ යුතුය.

- සංවිධානයේ උපායමාර්ගික අරමුණු ස්ථාපිත කිරීම
- උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා නායකත්වය ලබා දීම
- ඵලදායී අභ්‍යන්තර පාලනයක් සහ අවදානම් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම
- ආයතන කළමනාකරණ කටයුතු ඵලදායී ලෙස අධීක්ෂණය කිරීම
- මූල්‍ය අංග සහ අනාවරණයන් පිළිබඳව කාලීනව සහ නිවැරදිව කොටස් හිමියන් වෙත වාර්තා කිරීම
- සම්පත් සහ වත්කම් වගකීමෙන් යුතුව භාවිතා කිරීම.
- අදාළ අණ පනත්, මාර්ගෝපදේශ සහ චක්‍රලේඛ ආදිය ප්‍රකාරව ඔවුන්ගේ සියලු ක්‍රියාමාර්ග සඳහා වගකිව යුතු වීම.

## අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

අයවැය සහ අදාළ ප්‍රමිතීන්ට අනුකූලව ආයතනික මෙහෙයුම් සහ ප්‍රතිඵල අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී සමීපව හා නිරන්තරයෙන් අධීක්ෂණය කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ සවිස්තරාත්මකව අවධානය අවශ්‍ය කරන අනෙකුත් කාරණා සමග සම්මත න්‍යාය පත්‍රයක් අනුගමනය කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය මසකට වරක් රැස් වන අතර අවශ්‍ය ඕනෑම අවස්ථාවක විශේෂ කරුණු සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වනු ලැබේ.

## සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ කමිටු

1. කළමනාකරණ කමිටුව
2. විගණන සහ කළමනාකරණ කමිටුව
3. ටෙන්ඩර් මණ්ඩල කමිටුව
4. කාර්ය මණ්ඩල සුභසාධක කමිටුව
5. වෙළෙඳ දැන්වීම් කමිටුව
6. සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සංස්කෘතික සහ කලා සංගමය

## කළමනාකරණය

මණ්ඩලයේ එදිනෙදා මෙහෙයුම් කටයුතු සභාපති, ප්‍රධාන විධායක නිලධාරී සහ ඔහුගේ ඉහළ කළමනාකරණ සහ ජ්‍යේෂ්ඨ කළමනාකරණ කණ්ඩායම් වෙත පවරා තිබේ. අවදානම් සහ අවස්ථා හඳුනාගැනීම, නිසි කලට අවශ්‍ය පියවර ගැනීම සහ ආයතනයේ අරමුණු සාකෂාත් කර ගැනීමට අයවැය සකස් කිරීම සඳහා මෙම කණ්ඩායම් වගකීමට බැඳී සිටී.

### 2023 වර්ෂයේ දී පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සංඛ්‍යාව

| රැස්වීමෙහි දිනය | රැස්වීම් අංකය | අධ්‍යක්ෂවරයාගේ නම | තනතුර | පැමිණීම |
|---|---|---|---|---|
| 25.01.2023 | 274 | අජිත් ගුණරත්න නාරගල මහතා | සභාපති / ප්‍ර.වි.නි | ✓ |
| | | ඩබ්ලිව් ඒ.සරත් කුමාර මහතා | අධ්‍යක්ෂ | ✓ |
| | | කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ✓ |
| | | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ✓ |

| රැස්වීමෙහි දිනය | රැස්වීම් අංකය | අධ්‍යක්ෂවරයාගේ නම | තනතුර | පැමිණීම |
|---|---|---|---|---|
| 23.02.2023 | 275 | අජිත් ගුණරත්න නාරගල මහතා | සභාපති / ප්‍ර.වි.නි | ✓ |
| | | ඩබ්ලිව් ඒ.සරත් කුමාර මහතා | අධ්‍යක්ෂ | ✓ |
| | | කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ✓ |
| | | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ✓ |

| රැස්වීමෙහි දිනය | රැස්වීම් අංකය | අධ්‍යක්ෂවරයාගේ නම | තනතුර | පැමිණීම |
|---|---|---|---|---|
| 09.03.2023 | 276 | අජිත් ගුණරත්න නාරගල මහතා | සභාපති / ප්‍ර.වි.නි | ✓ |
| | | ඩබ්ලිව් ඒ.සරත් කුමාර මහතා | අධ්‍යක්ෂ | ✓ |
| | | කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ✓ |
| | | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ✓ |

| රැස්වීමෙහි දිනය | රැස්වීම් අංකය | අධ්‍යක්ෂවරයාගේ නම | තනතුර | පැමිණීම |
|---|---|---|---|---|
| 30.03.2023 | 277 | අජිත් ගුණරත්න නාරගල මහතා | සභාපති / ප්‍ර.වි.නි | ✓ |
| | | ඩබ්ලිව් ඩී.සරත් කුමාර මහතා | අධ්‍යක්ෂ | ✓ |
| | | කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ✓ |
| | | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ✓ |

| රැස්වීමෙහි දිනය | රැස්වීම් අංකය | අධ්‍යක්ෂවරයාගේ නම | තනතුර | පැමිණීම |
|---|---|---|---|---|
| 27.04.2023 | 278 | අජිත් ගුණරත්න නාරගල මහතා | සභාපති / ප්‍ර.වි.නි | ✓ |
| | | ඩබ්ලිව් ඩී.සරත් කුමාර මහතා | අධ්‍යක්ෂ | ✓ |
| | | කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ✓ |
| | | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ✓ |

| රැස්වීමෙහි දිනය | රැස්වීම් අංකය | අධ්‍යක්ෂවරයාගේ නම | තනතුර | පැමිණීම |
|---|---|---|---|---|
| 31.05.2023 | 279 | අජිත් ගුණරත්න නාරගල මහතා | සභාපති / ප්‍ර.වි.නි | ✓ |
| | | ඩබ්ලිව් ඩී.සරත් කුමාර මහතා | අධ්‍යක්ෂ | ✓ |
| | | කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ✓ |
| | | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ✓ |

| රැස්වීමෙහි දිනය | රැස්වීම් අංකය | අධ්‍යක්ෂවරයාගේ නම | තනතුර | පැමිණීම |
|---|---|---|---|---|
| 26.06.2023 | 280 | අජිත් ගුණරත්න නාරගල මහතා | සභාපති / ප්‍ර.වි.නි | ✓ |
| | | ඩබ්ලිව් ඩී.සරත් කුමාර මහතා | අධ්‍යක්ෂ | ✓ |
| | | කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ✓ |
| | | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ✓ |

| රැස්වීමෙහි දිනය | රැස්වීම් අංකය | අධ්‍යක්ෂවරයාගේ නම | තනතුර | පැමිණීම |
|---|---|---|---|---|
| 26.07.2023 | 281 | අජිත් ගුණරත්න නාරගල මහතා | සභාපති / ප්‍ර.වි.නි | ✓ |
| | | ඩබ්ලිව් ඩී.සරත් කුමාර මහතා | අධ්‍යක්ෂ | ✓ |
| | | කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ✓ |
| | | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ✓ |

| රැස්වීමෙහි දිනය | රැස්වීම් අංකය | අධ්‍යක්ෂවරයාගේ නම | තනතුර | පැමිණීම |
|---|---|---|---|---|
| 11.08.2023 | 282 | අජිත් ගුණරත්න නාරගල මහතා | සභාපති / ප්‍ර.වි.නි | ✓ |
| | | ඩබ්ලිව් ඩී.සරත් කුමාර මහතා | අධ්‍යක්ෂ | ✓ |
| | | කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ✓ |
| | | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ✓ |

| රැස්වීමෙහි දිනය | රැස්වීම් අංකය | අධ්‍යක්ෂවරයාගේ නම | තනතුර | පැමිණීම |
|---|---|---|---|---|
| 11.09.2023 | 283 | අජිත් ගුණරත්න නාරගල මහතා | සභාපති / ප්‍ර.වි.නි | ✓ |
| | | ඩබ්ලිව් ඩී.සරත් කුමාර මහතා | අධ්‍යක්ෂ | ✓ |
| | | කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ✓ |
| | | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ✓ |

| රැස්වීමෙහි දිනය | රැස්වීම් අංකය | අධ්‍යක්ෂවරයාගේ නම | තනතුර | පැමිණීම |
|---|---|---|---|---|
| 27.09.2023 | 284 | අජිත් ගුණරත්න නාරගල මහතා | සභාපති / ප්‍ර.වි.නි | ✓ |
| | | ඩබ්ලිව් ඩී.සරත් කුමාර මහතා | අධ්‍යක්ෂ | ✓ |
| | | කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ✓ |
| | | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ✓ |

# ආයතනික පාලනය

| රැස්වීමෙහි දිනය | රැස්වීම් අංකය | අධ්‍යක්ෂවරයාගේ නම | තනතුර | පැමිණීම |
|---|---|---|---|---|
| 30.10.2023 | 285 | අජිත් ගුණරත්න නාරගල මහතා | සභාපති / ප්‍ර.වි.නි | ✓ |
| | | ඒ.එම්.පී.එම්.බී. අතපත්තු මහතා | අධ්‍යක්ෂ | ✓ |
| | | ඩබ්ලිව් ඒ.සරත් කුමාර මහතා | අධ්‍යක්ෂ | ✓ |
| | | කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ✓ |
| | | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ✓ |

| රැස්වීමෙහි දිනය | රැස්වීම් අංකය | අධ්‍යක්ෂවරයාගේ නම | තනතුර | පැමිණීම |
|---|---|---|---|---|
| 27.11.2023 | 286 | අජිත් ගුණරත්න නාරගල මහතා | සභාපති / ප්‍ර.වි.නි | ✓ |
| | | ඒ.එම්.පී.එම්.බී. අතපත්තු මහතා | අධ්‍යක්ෂ | ✓ |
| | | ඩබ්ලිව් ඒ.සරත් කුමාර මහතා | අධ්‍යක්ෂ | ✓ |
| | | කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ✓ |
| | | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ✓ |

| රැස්වීමෙහි දිනය | රැස්වීම් අංකය | අධ්‍යක්ෂවරයාගේ නම | තනතුර | පැමිණීම |
|---|---|---|---|---|
| 11.12.2023 | 287 | අජිත් ගුණරත්න නාරගල මහතා | සභාපති / ප්‍ර.වි.නි | ✓ |
| | | ඒ.එම්.පී.එම්.බී. අතපත්තු මහතා | අධ්‍යක්ෂ | ✓ |
| | | ඩබ්ලිව් ඒ.සරත් කුමාර මහතා | අධ්‍යක්ෂ | ✓ |
| | | කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ✓ |
| | | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ✓ |

| රැස්වීමෙහි දිනය | රැස්වීම් අංකය | අධ්‍යක්ෂවරයාගේ නම | තනතුර | පැමිණීම |
|---|---|---|---|---|
| 21.12.2023 | 288 | අජිත් ගුණරත්න නාරගල මහතා | සභාපති / ප්‍ර.වි.නි | ✓ |
| | | ඒ.එම්.පී.එම්.බී. අතපත්තු මහතා | අධ්‍යක්ෂ | ✓ |
| | | ඩබ්ලිව් ඒ.සරත් කුමාර මහතා | අධ්‍යක්ෂ | ✓ |
| | | කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ✓ |
| | | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ✓ |

## 2023 වර්ෂයේ දී පවත්වන ලද විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් සංඛ්‍යාව

| රැස්වීමෙහි දිනය | අධ්‍යක්ෂවරයාගේ නම | තනතුර | පැමිණීම |
|---|---|---|---|
| 22.03.2023 | ඩබ්ලිව් ඒ.සරත් කුමාර මහතා | අධ්‍යක්ෂ | ✓ |
| | කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ✓ |
| | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ✓ |

| රැස්වීමෙහි දිනය | අධ්‍යක්ෂවරයාගේ නම | තනතුර | පැමිණීම |
|---|---|---|---|
| 17.08.2023 | ඩබ්ලිව් ඒ.සරත් කුමාර මහතා | අධ්‍යක්ෂ | ✓ |
| | කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ✓ |
| | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ✓ |

| රැස්වීමෙහි දිනය | අධ්‍යක්ෂවරයාගේ නම | තනතුර | පැමිණීම |
|---|---|---|---|
| 24.11.2023 | ඩබ්ලිව් ඒ.සරත් කුමාර මහතා | අධ්‍යක්ෂ | ✓ |
| | ඒ.එම්.පී.එම්.බී. අතපත්තු මහතා | අධ්‍යක්ෂ | ✓ |
| | කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ✓ |
| | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ✓ |

| රැස්වීමෙහි දිනය | අධ්‍යක්ෂවරයාගේ නම | තනතුර | පැමිණීම |
|---|---|---|---|
| 11.12.2023 | ඩබ්ලිව් ඒ.සරත් කුමාර මහතා | අධ්‍යක්ෂ | ✓ |
| | ඒ.එම්.පී.එම්.බී. අතපත්තු මහතා | අධ්‍යක්ෂ | ✓ |
| | කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ✓ |
| | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ✓ |

# අවදානම් කළමනාකරණ වාර්තාව

එලදායී අවදානම් කළමනාකරණය සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි ව්‍යාපාර ක්‍රියාවලියේ ප්‍රධාන සාධකයකි. අපගේ ව්‍යාපාරයෙහි අවදානම් සහ ප්‍රතිඵල අතර සමතුලිතතාවයක් ඇති කර ගැනීමට සහ පාලිත පරිසරයක් තුළ අපගේ වර්ධන සැලසුම්වලට උපකාරී වන අපගේ අවදානම් කළමනාකරණ හැකියාවන් අපි වර්ධනය කරමු. අපගේ අවදානම් කළමනාකරණ රාමුව සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි මෙහෙයුම් ව්‍යුහයේ ප්‍රධානතම අංගයකි. අවදානම් රුචියේ පූර්ව නිශ්චිත මට්ටම ඇතුළත අවදානම් නිරාවරණයවීම් කළමනාකරණය කිරීම මගින් ඉපැයීම්වල සහ ප්‍රාග්ධනයෙහි අහිතකර විචලනයන් අවම කිරීම එම රාමුවෙන් අරමුණු කරයි.

අපගේ අවදානම් කළමනාකරණ පද්ධතිය තුළ අවදානම් හඳුනා ගැනීම සහ අවම කිරීම සඳහා වගකීම අපි ප්‍රමුඛ කර ඇත. අවදානම් දැනුවත්භාවය ප්‍රවර්ධනය කරන සහ තීරණ ගැනීමේ හැසිරීම්වලට බලපාන ශක්තිමත් අවදානම් කළමනාකරණ සංස්කෘතියක් පෝෂණය කිරීම කෙරෙහි අපගේ අවධානය යොමුව ඇත. සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි දිගුකාලීන තිරසාර බව සහතික කිරීම සඳහා අපගේ අවදානම් උපාය මාර්ග තවදුරටත් වැඩිදියුණු කිරීම අත්‍යවශ්‍යය.

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අවදානම් කළමනාකරණය උපායමාර්ගය පාර්ශ්වකරුවන්, කළමනාකරුවන් සහ අධ්‍යක්ෂ මණ්ඩල සඳහා ප්‍රතිපෝෂණ යාන්ත්‍රණයක් ලෙස සේවය කරයි මණ්ඩලයේ ව්‍යාපාර කාර්යයන්, මෙහෙයුම්, පද්ධති සහ සේවාවන් හරහා දැනුවත්භාවයෙන් යුතු තීරණ ගැනීම සඳහා උපාය මාර්ගික කේන්ද්‍රයක් ලෙස එය ක්‍රියාකරයි. මෙම ප්‍රවේශය පහත සඳහන් දෑ මඟින් උපායමාර්ගික, මෙහෙයුම් සහ ව්‍යාපෘති කළමනාකරණය මට්ටම්වලදී ව්‍යාපාර අවදානම් ආමන්ත්‍රණය කිරීමේදී අනුරූපත්වය සහතික කරයි.

- ව්‍යාපාර කාර්යයන් සහ ඒකක පුරා ඇති අවදානම් පිළිබඳ අවබෝධය වැඩි කිරීම.
- ප්‍රමුඛකරණය සහ තීරණ ගැනීම සඳහා පහසුකම් සැලසීම පිණිස දැනට පවත්නා අවදානම් තක්සේරු සමඟ කළමනාකරණය සපයා දීම.
- අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් සේවක දැනුවත්භාවය සහ කළමනාකරණ වගකීම් වැඩි කිරීම.

**සංවර්ධන ලොතරැයි මණ්ඩලය පහත සඳහන් කර ඇති පරිදි විශේෂිත අවදානම් සමූහයකට මුහුණ දේ.**

### ත්‍යාග මුදල් ගෙවීමේ අවදානම:

මුදල් ප්‍රවාහයට බලපෑ හැකි වැඩිවන ත්‍යාග මුදල් ගෙවීමේ අවදානම කළමනාකරණය කර ගැනීමට සියලුම තොග මට්ටමකදී ම සංවර්ධන ලොතරැයි මණ්ඩලය ත්‍යාග සඳහා සම්මත ගෙවීම් අනුපාතයක් පවත්වා ගත යුතුය. මෙම අවදානම අවම කිරීමට මුද්‍රණ ආයතන වලින් රක්ෂණ ආවරණයක් ද ලබා ගනී.

### ආර්ථික අවදානම :

රටෙහි පවතින සමාජ ආර්ථික හා දේශපාලන වාතාවරණය තුළ වෙනස්කම් ආයතනයට ආර්ථික අවදානමක් ඇති කරමින් සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි ගනුදෙනුකරුවන්ගේ මිලදී ගැනීමේ රටාවන්වලට බලපෑම් සිදු කරයි.

### මූල්‍ය අවදානම :

අකාර්යක්ෂම මුදල් ප්‍රවාහ කළමනාකරණය හා මූල්‍ය තොරතුරු ව්‍යවහාරවලට සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලාභදායීත්වයට හානි ගෙන දිය හැකිය. නිසි රක්ෂණ ආවරණය සහ පිරිවැය පාලන උපාය මාර්ග වැනි සාම්ප්‍රදායික මූල්‍ය අවදානම් කළමනාකරණ පිළිවෙත් මෙම අවදානම් අවම කිරීමට යොදවා ඇත.

### ද්‍රවශීලතා අවදානම :

ඉහළ මට්ටමේ ත්‍යාග වේලාසනින් ගෙවීම සංවර්ධන ලොතරැයි මණ්ඩලය සඳහා ද්‍රවශීලතා අවදානම් නිර්මාණය කළ හැකිය. මෙම අවදානම අවම කිරීම පිණිස, ආයතනයට ගෙවීම් බැඳීම් සපුරාලීමට හැකි බව සහතික කිරීමට අයතනය විසින් ඉහළ මුදල් වත්කම් පවත්වා ගනී.

### මෙහෙයුම් අවදානම :

පද්ධති ඇණහිටීම්, මානව දෝෂ, සාපරාධී ක්‍රියාකාරකම් හෝ අභ්‍යන්තර බිඳවැටීම් සංවර්ධන ලොතරැයි මණ්ඩලයට මෙහෙයුම් අවදානම් ඇති කරන අතර ඉන් පාරිභෝගික විශ්වාසයට හා ආයතනික ප්‍රතිරූපයට හානි සිදු විය හැකිය. ශක්තිමත් කළ අභ්‍යන්තර පාලනයන් සහ නිරන්තර අවදානම් තක්සේරු මෙම අවදානම් අවම කිරීමට සහය වේ.

### ව්‍යාපාර අවදානම :

උපායමාර්ගික හෝ කීර්තිනාම හේතූන් නිසා ඇති වන පිරිවැය පදනමට සාපේක්ෂව ආදායම් හිගය පිළිබඳ අවදානමට සංවර්ධන ලොතරැයි මණ්ඩලය මුහුණ දේ. බාහිර සාර්ව ආර්ථික සාධක, උපායමාර්ගික තීරණ, සහ වෙළඳපොළ කීර්තිනාමය සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි ආදායම් උත්පාදන හැකියාව කෙරෙහි බලපායි.

### කීර්තිනාම අවදානම :

පාර්ශ්වකරුවන් අතර සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි ප්‍රතිරූපයට හානිකිරීම සිය ව්‍යාපාරය රඳවා තබා ගැනීමට සහ ආකර්ෂණය කර ගැනීමට එයට ඇති හැකියාව අඩපණ කළ හැකිය. සංවර්ධන ලොතරැයි මණ්ඩලය ඵලදායී අලෙවිකරණ වැඩසටහන් සහ දැඩි විනිවිදභාවයක් තුළින් මෙම අවදානම අවම කරයි.

### නෛතික අවදානම :

නීතිමය ක්‍රියාමාර්ග වලින් ආරක්ෂා වීමට අපොහොසත් වීම සංවර්ධන ලොතරැයි මණ්ඩලයට නෛතික අවදානම් ඇති කරයි. අනාගත නෛතික හානි අවම කිරීමට සංවර්ධන ලොතරැයි මණ්ඩලය නීති වෘත්තිකයන් සමඟ කටයුතු කරයි.

### තොරතුරු තාක්ෂණ අවදානම :

තොරතුරු තාක්ෂණ අවදානම සැලකියයුතු ගැටළුවක් බැවින් තොරතුරු තාක්ෂණ පද්ධති මගින් ලබා ගන්නා නිශ්චිත හා කාලෝචිත තොරතුරු මත සංවර්ධන ලොතරැයි මණ්ඩලය විශ්වාසය තබයි.

# විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වන අපගේ වාර්තාව අපි සතුටින් ඉදිරිපත් කරන්නෙමු.

## විගණන කමිටුවේ සංයුතිය

විගණන කමිටුව පහත සඳහන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් හතර දෙනෙකුගෙන් (04) ගෙන් සමන්විත වේ'

**ඩබ්ලිව් ඊ.සරත් කුමාර මහතා**
විගණන හා කළමනාකරණ කමිටුවේ සභාපති

**ඒ.එම්.පී.එම්.බී. අතපත්තු මහතා**
විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජික

**කේ.ඊ.එච්.සී. පුබුදුසිරි මෙනවිය**
විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජික

**ජෙනට් ජයවර්ධන මහත්මිය**
විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජික

සාමාන්‍යාධිකාරි, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි - (අලෙවි), නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි - (මූල්‍ය), අභ්‍යන්තර විගණක, සහකාර සාමාන්‍යාධිකාරි - මානව සම්පත් හා පරිපාලන

1. වාර්ෂික මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට පෙර එම ප්‍රකාශනවල අනුකූලතාවය සහ සම්පූර්ණ බව පරීක්ෂා කර බැලීම සහ ඒවායෙහි අඩංගු වැදගත් මූල්‍ය වාර්තාකරණ විනිශ්චයන් සමාලෝචනය කිරීම, ගිණුම්කරණ ප්‍රතිපත්ති, සටහන් සහ පරිචයන්, විනිශ්චයකිරීම අවශ්‍ය කරන ප්‍රධාන අංශ සහ නෛතික හා නියාමන අවශ්‍යතා වලට අනුකූලතාව මෙයට ඇතුළත් වේ. මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීමෙන් සොයාගත් කරුණු සමාලෝචනය කිරීමෙහි කොටසක් ලෙස විගණන කමිටුව මෙම කරුණු විගණකාධිපති දෙපාර්තමේන්තුවෙහි නියෝජිත සමග සාකච්ඡා කළේය.

2. අනුමත වාර්ෂික විගණන සැලැස්මට අනුකූලව සිදු කරනු ලබන අභ්‍යන්තර විගණනය පිළිබඳ කාලීන අභ්‍යන්තර විගණන වාර්තා අභ්‍යන්තර විගණක විසින් ඉදිරිපත් කරනු ලැබේ. මෙම අභ්‍යන්තර විගණන වාර්තා මගින් මණ්ඩලයේ ක්‍රියාත්මකව පවතින පද්ධති හා ක්‍රියා පටිපාටිවල ඇති අඩුපාඩු අවධාරණය කර පෙන්වා දෙන අතර, නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අවශ්‍ය අවස්ථාවන්හි දී පවතින ක්‍රමවේද හා කාර්ය පටිපාටිවල වැඩිදියුණු කිරීම් නිර්දේශ කර කළමනාකරණ හා විගණන කමිටුවට ප්‍රගතිය වාර්තා කරයි. විගණන කමිටුවට අභ්‍යන්තර විගණනයෙන් නිතිපතා වාර්තා ලැබෙන අතර, එම කාල පරිච්ඡේදය තුළ සිදු කරන ලද එක් එක් විගණනය මගින් සොයා ගත් ප්‍රධාන කරුණු පිළිබඳ සාරාංශයක් එම වාර්තාවට ඇතුළත් වේ. කළමනාකරණයෙහි අදහස් ද එහි කොටසක් වන අතර, විගණනය විසින් නිරීක්ෂණය කර ඇති තත්ත්වයන්ට හේතු වී ඇති මූලික කරුණු සහ එම තත්ත්වයන් නැවත ඇතිවීම වළක්වා ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ද කමිටුව විසින් සමාලෝචනය කරනු ලබයි.

3. අභ්‍යන්තර විගණනයේ සහ රජයේ විගණනයේ සහාය ඇතිව, කමිටුව විසින් මණ්ඩලයේ මෙහෙයුම් සහ මූල්‍ය පාලන සහ කාර්ය පටිපාටිවල ඵලදායීතාවය තක්සේරු කරනු ලබන අතර, ඒවාට වියදම්, ආදායම් ක්‍රියාවලිය සහ ප්‍රාග්ධන වියදම් සඳහා අවසර දීමේ සීමා, අත්සන් කිරීමේ බලධාරීන්, තොරතුරු තාක්ෂණ යෙදවුම් පාලන සහ සංවර්ධනය කිරීම්, ආයතනික ව්‍යුහය, ප්‍රතිපත්ති, රාජකාරි වෙන් කර දීම සහ කළමනාකරණය විසින් සිදු කරන සමාලෝචන ඇතුළත් වේ. මණ්ඩලයෙහි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ද්‍රවශීලතා තත්ත්වය නිරන්තරයෙන් නිරීක්ෂණය කරන ලදී. එහිදී හඳුනාගනු ලබන අඩුපාඩු අවශ්‍ය වැඩි දියුණු කිරීම් සඳහා වන නිර්දේශ ද සහිතව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරනු ලැබේ. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් මණ්ඩලය වෙත නිකුත් කරනු ලබන නියෝග කෙරෙහි කමිටුව විශේෂ අවධානයක් යොමු කරයි. සහ අනෙකුත් අවශ්‍ය නිලධාරීන් මෙම රැස්වීම් වලට සහභාගී වීම අනිවාර්ය වේ. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන අධිකාරී මෙම කමිටුවේ නිරීක්ෂකයෙකු ලෙස රැස්වීම්වලට සහභාගී වේ. තවද, මුදල් අමාත්‍යංශයේ අභ්‍යන්තර විගණන ප්‍රධානි ද කමිටුවේ නිරීක්ෂකයෙකු ලෙස රැස්වීම්වලට සහභාගී වේ.

## විගණන කමිටුවේ කාර්ය භාරය

පාර්ශ්වකරුවන්ගේ අයිතීන් සහ මණ්ඩලය සතු වත්කම් ආරක්ෂා කර ගැනීම සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලය ශක්තිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් පවත්වා ගත යුතු වේ. මුදල් අමාත්‍යාංශය සහ අදාළ බලධාරීන් විසින් නිකුත් කර ඇති මාර්ගෝපදේශ ද කමිටුව විසින් අනුගමනය කරනු ලබයි. 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ දී විගණන කමිටුව විසින් එහි ප්‍රධාන වගකීම්වලට අදාළව සිදුකරන ලද කටයුතු පහත සාරාංශ කර දක්වා ඇත.

## විගණන කමිටුවේ රැස්වීම් ගණන

2023 වර්ෂය සඳහා රැස්වීම් හතරක් (04) පවත්වන ලද අතර ඒ සඳහා පැමිණීම පහත සඳහන් පරිදි වේ.

| අධ්‍යක්ෂවරයාගේ නම | පැමිණීම | අවසරය මත සහභාගි නොවූ |
|---|---|---|
| ඩබ්ලිව් ඊ.සරත් කුමාර මහතා | 04/04 | නැත |
| ඒ.එම්.පී.එම්.බී. අතපත්තු මහතා | 02/02 | නැත |
| කේ.ඊ.එච්.සී. පුබුදුසිරි මෙනවිය | 04/04 | නැත |
| ජෙනට් ජයවර්ධන මහත්මිය | 04/04 | නැත |



**ඩබ්ලිව් ඊ.සරත් කුමාර මහතා**
සභාපති - විගණන හා කළමනාකරණ කමිටුව



# මූල්‍ය වාර්තාව


ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව | 48

විගණන වාර්තාව 2023 සහ කළමනාකරණය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග | 58

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය | 69

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය | 70

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | 71

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය | 72

ගිණුම්කරණ ප්‍රතිපත්ති | 73

අංශමය වාර්තාව | 78

මූල්‍ය ප්‍රකාශවලට සටහන් | 79

දස වසරක සාරාංශය | 89

සටහන් | 90

# ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

| මගේ අංකය / எனது இல. / My No. | පියූආර්/එෆ්/ඩීඑල්බී/01/23/37 | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 2024 මැයි 31 දින |
|---|---|---|---|---|---|

සභාපති

සංවර්ධන ලොතරැයි මණ්ඩලය

**සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 2 හි 9 වන ඡේදය අනුව තොගය පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවද 2023 දෙසැම්බර් 31 දින භෞතිකව ගබඩාවේ නොතිබූ පිරිවැය රු.443,609 ක් වූ ශුද්ධ උපලබ්ධි අගයක් නොමැති ක්ෂණික ලොතරැයිපත් 2883 ක තොගයක් ගැණුම් පිරිවැයට, අවසන් තොගයේ ඇතුලත් කර තිබීම නිසා රඳවාගත් ඉපයුම් සංචිතය සහ ක්ෂණික ලොතරැයිපත් අවසන් තොගය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව    இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.    No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34    +94 11 2 88 72 23    ag@auditorgeneral.gov.lk    www.naosl.gov.lk

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 07 වන ඡේදය අනුව දේපල, පිරියත හා උපකරණ හි අයිතමයකින් ලැබිය හැකි අනාගත ආර්ථික වාසිය අස්ථිත්වය තුලට ගලා එන්නේ නම් හා එහි පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකිනම් පමණක් එය දේපල, පිරියත හා උපකරණ ලෙස හඳුනාගත යුතු වුවද ආර්ථික වාසිය අස්ථිත්වය තුලට ගලා ඒම යන කොන්දේසිය සපුරාලිය නොහැකි භෞතිකව මණ්ඩලය සතුව නොමැති වටිනාකම රු.8,095,000 ක් වූ කැබ් රථයක් සහ දැනට භාවිතයෙන් ඉවත් කර ඇති වටිනාකම රු.7,641,159 ක් වූ දිනුම් ඇදීමේ යන්ත්‍ර 07 ක් සමාලෝචිත වර්ෂයේ දේපල, පිරියත හා උපකරණ යටතේ දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 36 වගන්තිය අනුව දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීමේදී දේපල පිරියත උපකරණ අයත් පන්තියම ප්‍රත්‍යාගණනය කල යුතු අතර තෝරාගත් අයිතමයන් කිහිපයක් පමණක් ප්‍රත්‍යාගණනය නොකල යුතු වුවද කාර්යාල උපකරණ හා ජංගම දුරකථන, යන්ත්‍ර සූත්‍ර, ලී බඩු හා සවිකිරීම්, පරිගණක හා උපාංග, පරිගණක මෘදුකාංග යන වත්කම් පන්ති පහකට අයත් ගිණුම් නවයක 2023 දෙසැම්බර් 31 දිනට එකතු ශේෂය රු.245,194,377 ක් වූ අයිතමයන් වලින් වටිනාකම රු.86,478,373 ක් වූ අයිතමයන් සමාලෝචිත වර්ෂය තුලදී ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24 හි 17 වන ඡේදය ප්‍රකාරව ආයතනයේ ප්‍රධාන කළමනාකරණ පුද්ගල කණ්ඩායම් ප්‍රතිලාභවල එකතුව කෙටි කාලීන සේවා ප්‍රතිලාභ, පශ්චාත් සේවා ප්‍රතිලාභ, වෙනත් දිගු කාලීන ප්‍රතිලාභ සහ සේවය අවසන්වීමේ ප්‍රතිලාභ වශයෙන් දැක්විය යුතු වුවද එලෙස ක්‍රියාකර නොතිබුණි.

(ඉ) සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දින සිට ජූලි 05 දින දක්වා කාලය තුලදී ශනිදා වාසනා, ලග්න වාසනා, ජයෝදා, කප්රුක, අද කෝටිපති හා වාලම්පුරි යන ලොතරැයිපත් 06 හි විශේෂ දෙවැනි දිනුම් ඇදීම් සඳහා සහ ජූලි 06 දින සිට දෙසැම්බර් 31 දින දක්වා කාලය තුලදී ශනිදා වාසනා, ලග්න වාසනා, ජයෝදා, සුපර් බෝල්, කප්රුක, අද කෝටිපති, සුපිරි ධන සම්පත හා වාලම්පුරි යන ලොතරැයිපත් 08 හි "දෙවන වරම" හා "සෙකන්ඩ් චාන්ස්" දිනුම් ඇදීම් සඳහා ත්‍යාග මුදල් ලෙස ගෙවූ රු.761,885,800 ක මුදල සමාලෝචිත වර්ෂයේ ත්‍යාග වියදමක් ලෙස ගිණුම්ගත නොකර ත්‍යාග සංචිත ගිණුමට ගැලපීම නිසා සමාලෝචිත වර්ෂයේ එම ප්‍රමාණයෙන් ත්‍යාග වියදම අඩුවෙන් හා ලාභය වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ තොග ගණනය කිරීමේ ක්‍රමවේදය අනුව ඉදිරි වර්ෂයේ දිනුම් ඇදීම් සඳහා මුද්‍රණය කර දෙසැම්බර් 31 දිනට ගබඩාවට භාරදී ඇති ලොතරැයිපත් වල වටිනාකම අවසන් තොගය ලෙස හඳුනාගනු ලැබුවද 2024 ජනවාරි 01 දින සිට ජනවාරි 27 දින දක්වා කාලපරිච්ඡේදයේ දිනුම් ඇදීම් සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින ගබඩාවට භාරදී තිබූ ලොතරැයි පත් 4,605,000 ක වටිනාකම වූ රු.5,787,310 ක් අවසන් තොගයට ඇතුලත් කර නොතිබීම නිසා අවසන් තොගය සහ වෙළඳ ණය හිමියන් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

# ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව

(උ) සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සේවකයන් විශ්‍රාම යාමේදී හෝ සේවයෙන් ඉවත්වීමේදී ගෙවිය යුතු පාරිතෝෂිත ගෙවීම සඳහා රාජ්‍ය බැංකු දෙකක ආයෝජනය කර තිබූ ස්ථාවර තැන්පතු 06 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.6,619,629 ක පොලී ආදායම ශුද්ධ සේවක ප්‍රතිලාභ වගකීම ගණනය කිරීමේදී සැලකිල්ලට නොගෙන ජංගම වත්කම් යටතේ වූ ස්ථාවර තැන්පතු වටිනාකමට එකතුකර තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ ස්ථාවර තැන්පතු ශේෂය සහ සේවක ප්‍රතිලාභ වගකීම් ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ) ස.තො.ස ආයතනයෙන් 2009 වර්ෂයේ නිකුත් කර තිබූ වටිනාකම රු.592,500 ක් වූ ත්‍යාග වවුචර් පත් 123 ක් මූල්‍ය තත්ව ප්‍රකාශනයේ ත්‍යාග භාණ්ඩ අවසන් තොගය ලෙස ඇතුලත් කර තිබුණද මෙම වවුචර් පත් ලොතරැයි මණ්ඩලයට ලැබී සමාලෝචිත වර්ෂය අවසන් වන විට වර්ෂ 14 කට අධික කාලයක් ගතවී ඇති බැවින් සහ ඒ සඳහා මුදල් ලබාගැනීම සම්බන්ධව අවිනිශ්චිත තාවයක් තිබියදී ඒ සඳහා අවශ්‍ය ගැලපීම් සිදු නොකර මූල්‍ය තත්ව ප්‍රකාශනයේ ජංගම වත්කමක් ලෙස නිරූපනය කර තිබුණි.

(එ) සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ කෑම කාමරය , ගබඩා කාමරය සහ මායිම් බිත්ති අලුත්වැඩියා කිරීම සඳහා 2017 සහ 2018 වර්ෂවලදී දරන ලද රු.1,728,884 ක වියදම සිදුකර සමාලෝචිත වර්ෂය අවසන් වන විට වසර 06 කට අධික කාලයක් ගතවී තිබුණද අවශ්‍ය ගිණුම්කරණ ගැලපීම් සිදුනොකර දේපල පිරියත උපකරණ යටතේ කෙරීගෙන යන වැඩ ලෙස දක්වා තිබුණි.

(ඒ) ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව සහ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම යන ආයතන දෙකට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව ගෙවිය යුතු මුදල පිළිවෙලින් රු.11,884,975 ක් සහ රු.4,735,627 ක් වුවද, එම ආයතන විසින් විගණනයට සෘජුවම තහවුරු කරන ලද මුදල පිළිවෙලින් රු.22,606,401 ක් සහ රු.2,754,832 ක් විය.

(ඔ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව කාර්යාල උපකරණ හා ජංගම දුරකථන ශේෂය, ලිබඩු හා සවිකිරීම් ශේෂය, පරිගණක උපාංග ශේෂය පිළිවෙලින් රු.43,416,368 ක්, රු.14,802,820 ක් හා රු. 57,425,324 ක් වුවද, ඊට අදාල උපලේඛණය අනුව එම ශේෂයන් පිළිවෙලින් රු. 43,353,012 ක්, රු. 14,881,156 ක් හා රු. 57,175,052 ක් විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා, මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි, ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මණ්ඩලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන මණ්ඩලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මණ්ඩලයේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

# ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව



2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය

ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති / විධානයට යොමුව | නිරීක්ෂණ |
|---|---|
| **(අ)** 1997 අංක 20 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත | |
| (i) 17(5) වගන්තිය | ත්‍යාගලාභීන් හිමිකම් නොපෑ, මාස 06 ක කාලසීමාව ඉකුත් වූ ත්‍යාග සඳහා මිලදීගත් භාණ්ඩ විකිණීමෙන් ලැබෙන මුදල පළමු කොට අරමුදලටද, ඉන් පසුව ජනාධිපති අරමුදලටද බැරකල යුතු වුවත්, 2018 සහ 2020 වර්ෂයේදී ත්‍යාග වශයෙන් ලබාදීමට මිලදී ගත් එකතු වටිනාකම රු.779,750 ක්වූ යතුරු පැදි තුනක් අලෙවි කර එම පනත ප්‍රකාරව යෙදවීමට 2022 වර්ෂයේ මැයි 30 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබාදී තිබුණද, අදාල කටයුතු වර්තමානය වන විටත් සිදුකර නොතිබුණි. |
| (ii) 19 (1) හා 19 (2) වගන්ති | නියමිත යැයි මේ පනතින් ප්‍රකාශිත හෝ බලය දී ඇති සියලු කාරණා සම්බන්ධයෙන් මණ්ඩලය විසින් රීති සෑදිය යුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි. |
| **(ආ)** 2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 දරන රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තු චක්‍රලේඛය | 2020 ජනවාරි 31 දිනට පෙර රාජ්‍ය සංස්ථා ඇතුළු රාජ්‍ය ආයතන www.promise.lk වෙබ් අඩවිය යටතේ හඳුන්වා දී ඇති විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රමවේදය (e–GP) යටතේ ලියාපදිංචි විය යුතු වුවත්, සංවර්ධන ලොතරැයි මණ්ඩලය මෙම ක්‍රමවේදය යටතේ ලියාපදිංචි වී නොතිබුණු බැවින්, ඒ අනුව ප්‍රසම්පාදන කටයුතු සිදු කර නොතිබුණි. |
| **(ඇ)** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | |
| (i) 4.2.3 වගන්තිය සඳහා වූ 31 වැනි අතිරේකය | රු.මිලියන 1,328 ක ඇස්තමේන්තු වටිනාකමකට 2023 වර්ෂය සඳහා ලොතරැයි 08 ක මුද්‍රණ කටයුතු සිදුකිරීම හා සැපයීම සඳහා මුද්‍රණකරුවන් තෝරාගැනීමේ ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර සති 10 ක් තුල නිම කල යුතු වුවද ඒ සඳහා සති 65 ක කාලයක් ගත කර තිබුණි. |

| | | |
|---|---|---|
| | (ii) 2.9.2 වගන්තිය සඳහා වූ 32 වන අතිරේකය | ප්‍රසම්පාදන හා තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයන්ට ගෙවීම් කිරීමේදී සම්පූර්ණ දීමනාව ලබාගැනීමට නම් සති 10 ක කාලය තුල ප්‍රසම්පාදන කාර්යයන් අවසන් කල යුතු වුවද 2023 වර්ෂය සඳහා ලොතරැයි මුද්‍රණය කිරීමේ සැපයුම්කරුවන් තෝරාගැනීමේ ප්‍රසම්පාදන කාර්යය සඳහා සති 65 ක කාලයක් ගත කර තිබියදී අදාළ කමිටු සාමාජිකයන්ට මුළු දීමනාව වශයෙන් රු.345,000 ක් ගෙවා තිබුණි. |
| | (iii) 4.2.1 වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. |
| **(ඇ)** | 2022 ජනවාරි 18 දිනැති අංක 02/2022 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය | i. දුරකථන වියදම් සීමාව නොසලකා සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ නිලධාරීන් 11 දෙනෙකු සඳහා 2022 ජනවාරි සිට 2023 පෙබරවාරි දක්වා කාලපරිච්ඡේදයේ දුරකථන වියදම් දීමනාව ලෙස එකතුව රු.141,599 ක් වැඩියෙන් ගෙවා තිබුණි.<br>ii. දුරකථන වියදම් දීමනාව සඳහා හිමිකම් නොලබන නිලධාරීන් 53 කට එකතුව රු.1,200,064 ක් දුරකථන වියදම් දීමනාව ලෙස සමාලෝචිත වර්ෂය තුලදී ගෙවා තිබූ අතර ඒ සඳහා 2023 පෙබරවාරි 23 දිනැති අධ්‍යක්ෂක මණ්ඩල තීරණය පරිදි රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| **(ඉ)** | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2015 මැයි 25 දිනැති අංක PED/1/2015 දරන චක්‍රලේඛයේ 2.3 ඡේදය | නිල වාහන හිමිකම් නොමැති නිලධාරීන් පස් දෙනෙකු සඳහා නිල වාහන සපයා දී තිබූ අතර ඒ වෙනුවෙන් ඉන්ධන වියදම් ලෙස සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.2,913,410 ක වියදමක් දරා තිබුණි. |
| **(ඊ)** | 2016 මැයි 30 දිනැති අංක 04/2016 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය | නිල වාහන හිමිකමක් නොමැති නිලධාරිනියකට මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ මණ්ඩලය විසින් ලබාගත් මෝටර් රථයක් ලබාදී තිබූ අතර එම මෝටර් රථය සඳහා සමාලෝචිත වර්ෂයේදී මෙහෙයුම් කල්බදු කුලී ලෙස රු.2,028,000 ක් ගෙවා තිබුණි. |

# ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

## 2.3 වෙනත් විගණන නිරීක්ෂණ

(අ) සංවර්ධන ලොතරැයි මණ්ඩලය තුල ලොතරැයි මෙහෙයුම් හා කළමනාකරණ ක්‍රියාවලිය බාහිර සේවා සැපයුම් ආයතනයක් තුලින් සිදුවන බැවින් ලොතරැයි කළමනාකරණ මෘදුකාංග පද්ධතියක් නිර්මාණය කිරීම හා ස්ථාපනය කිරීම, කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සඳහා සුදුසු සැපයුම්කරුවකු තෝරාගැනීම සඳහා අවශ්‍ය ලංසු ලියවිලි පිළියෙල කිරීමේ කටයුතු 2020 ජූලි මස ආරම්භ කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් එම කටයුතු අවසන්වී නොතිබුණි. මේ නිසා 2020 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා මාසික සේවා ගාස්තු සියයට 68 ක වැඩිවීම් සහිතව සේවා ගිවිසුම් කාලය දීර්ඝ කරමින් තරඟකාරී ටෙන්ඩර් පරිපාටියෙන් බැහැරව මෘදුකාංග සේවා සැපයුම් සමාගමක් තෝරාගෙන ලොතරැයි මෙහෙයුම් හා කළමනාකරණ මෘදුකාංග සේවා ලබාගැනීම නිසා 2020 වර්ෂයේ සිට 2023 වර්ෂයේ අවසානය දක්වා රු.73,221,351 ක් ගෙවා තිබුණි.

(ආ) සංවර්ධන ලොතරැයි මණ්ඩලය සහ මෘදුකාංග සේවා සැපයුම් සමාගම අතර 2009 අගෝස්තු 18 දින ඇතිකරගත් ගිවිසුම ප්‍රකාරව මෘදුකාංග සේවා සැපයුම් සමාගම ලබාදෙන සේවාවන් සම්බන්ධ පද්ධති විගණනයක් සිදුකිරීමට මණ්ඩලයට බලය ලැබී තිබුණද මණ්ඩලය විසින් ඒ සම්බන්ධව සමාලෝචිත වර්ෂයේදී කටයුතු කර නොතිබුණි.

(ඇ) අධ්‍යක්ෂක මණ්ඩලයේ සහ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරණ මෙහෙයුම් කාර්ය සංග්‍රහයේ 3.2 (V) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව අනුමත කරන ලද දිරිදීමනා ගෙවීමේ පටිපාටියකින් තොරව සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය තුලදී එකතුව රු.105,739,646 ක මුදලක් දිරි දීමනා ලෙස කාර්ය මණ්ඩලයට ගෙවා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ රු.25,442,131,713 ක් වූ ලොතරැයි එකතුකල අගය මත බදු පසු විකුණුම් ආදායම පසුගිය වර්ෂයට සාපේක්ෂව රු.6,370,674,962 කින් හෙවත් සියයට 33 කින් වැඩිවී තිබූ නමුදු පසුගිය වර්ෂයේ ශුද්ධ ලාභ අනුපාතය වූ සියයට 17, සමාලෝචිත වර්ෂයේදී සියයට 14 දක්වා අඩුවී තිබුණි. 2022 වර්ෂයට සාපේක්ෂව බෙදාහැරීමේ පිරිවැය සියයට 49 කින් සහ පරිපාලන වියදම් සියයට 17 කින් වැඩිවීම මෙයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි. පසුගිය වර්ෂය හා සැසඳීමේදී එම වියදම් වර්ග දෙකේ වැඩිවීම රු.2,319,819,639 ක් විය.

(ඉ) අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය මත සංවර්ධන ලොතරැයි මණ්ඩලය සඳහා ව්‍යාවසාය සම්පත් සැලසුම්කරණ (ERP) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට 2019 වර්ෂයේ සැලසුම් කර තිබුණි. මෙම ව්‍යාපෘතියේ පළමු අදියර ලෙස ගිණුම්කරණ මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීමේ කාර්යය 2020 වර්ෂයේ සිට සෑම වර්ෂයකම ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කර තිබුණද එම ප්‍රසම්පාදන කටයුතු සමාලෝචිත වර්ෂයේ අවසානය තෙක් ආරම්භ කර නොතිබුණි.

(ඊ) මණ්ඩලය විසින් වොක්ෂෝල් වීදියේ අංක 234 දරන ගොඩනැගිල්ල 2006 ඔක්තෝබර් මාසයේ සිට කුලී පදනම මත ලබාගැනීම සඳහා එළඹුණු ගිවිසුම ඒකපාර්ශිකව කඩ කර තිබීම නිසා තැන්පතු මුදල ලෙස ගෙවූ රු.723,780 ක් හා එම වර්ෂයන් සඳහා ගෙවූ කුලී මුදලින් කොටසක් වන රු.4,976,220 ක් යන මුදල්වල එකතුව වන රු.5,700,000 ක් දැනට වර්ෂ 17 ක් මුළුල්ලේ අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

(උ) 1990 වර්ෂයේ වෝඩ් පෙදෙසේ පුද්ගලයෙකු සමඟ ඇතිකරගෙන තිබූ කුලී ගිවිසුම ප්‍රකාරව රු.2,520,000 ක ගොඩනැගිලි කුලී තැන්පතු මුදලක් අයකර දෙන ලෙස ඉල්ලා අවුරුදු 23 කට පෙර ගොනුකර තිබූ නඩුවේ තීන්දුව 2016 ජනවාරි 11 දින ලැබී තිබුණි. අදාල මුදල අයකර ගන්නා ලෙස නඩු තීන්දුව ප්‍රකාශ වී වර්ෂ 07 කට ආසන්න කාලයක් ගත වී තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම මුදල අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

(ඌ) 2023 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයහිමි ගිණුමේ රු.414,095,595 ක ශේෂයක් පැවති අතර එය තුල වසර 1 ත් 2 ත් අතර කාලයක් තුල පවතින රු.207,860 ක ශේෂයක්ද, වසර 3 ඉක්මවූ රු.2,800,000 ක ශේෂයක්ද විය. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ණය ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(එ) දැනට ලෝකයේ පවත්නා තාක්ෂණික නැඹුරුව හා ලොතරැයි වෙළඳපොලේ පවත්නා තරඟකාරිත්වය සැලකිල්ලට ගෙන ලොතරැයි අලෙවිය ඩිජිටල් මාධ්‍ය භාවිතා කර සිදුකිරීම සඳහා ඩිජිටල් යෙදවුමක් DLB Sweep නමින් ආරම්භ කර SMS මාධ්‍ය හරහා E ලොතරැයි අලෙවි කිරීම, අලෙවි ප්‍රවර්ධනය ඇතුළු කාර්යයන් සඳහා 2023 වර්ෂයේ අයවැය මඟින් රු.57,625,000 ක මුදලක් උපයෝජනය කිරීමට සැලසුම් කර තිබුණද 2023 වර්ෂයේ E ලොතරැයි අලෙවි ප්‍රවර්ධන කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණේ රු.1,643,873 ක මුදලක් පමණක් වූ අතර එය ඇස්තමේන්තුගත මුදලින් සියයට 3 ක් පමණ වැනි ඉතා පහළ ප්‍රතිශතයක් විය.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

# විගණන වාර්තාව 2023 සහ කළමණාකරණය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ගය

| විගණකාධිපති වාර්තාවේ සඳහන් කරුණු | කළමණාකරණය විසින් ගනු ලැබූ පියවර |
|---|---|
| **1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**<br>**(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත**<br>(i) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 2 හි 9 වන ඡේදය අනුව තොගය පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවද 2023 දෙසැම්බර් 31 දින භෞතිකව ගබඩාවේ නොතිබූ පිරිවැය රු.443,609 ක් වූ ශුද්ධ උපලබ්ධි අගයක් නොමැති ක්ෂණික ලොතරැයිපත් 2883 ක තොගයක් ගැණුම් පිරිවැයට, අවසන් තොගයේ ඇතුලත් කර තිබීම නිසා රඳවාගත් ඉපයුම් සංචිතය සහ ක්ෂණික ලොතරැයිපත් අවසන් තොගය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | පිරිවැය රු. 443,609/- ක් වූ ක්ෂණික ලොතරැයි ටිකට්පොත් තොගය 2023/12/31 දිනට මණ්ඩල පරිශ්‍රය තුළ නොතිබුණ ද මණ්ඩලයට අයත් තොගයක් බැවින් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා ඇත.<br><br>මෙම ටිකට්පොත් විකුණුම් වලට අදාල මුදල් නොලැබීම සම්බන්ධව විමර්ෂණයක් සිදුවෙමින් පවතී. එම පරීක්ෂණයේ නිර්දේශ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය.<br><br>තව ද ලොතරැයි ටිකට්පොත් සදහා ප්‍රායෝගිකව ශුද්ධ උපලබ්ධිත අගයක් නොමැති බැවින් ලොතරැයි ටිකට්පත් මිලට ගැනුම් පිරිවැයට අගය කර ඇත. |
| (ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 07 වන "ඡේදය අනුව දේපල, පිරියත හා උපකරණ හි අයිතමයකින් ලැබිය හැකි අනාගත ආර්ථික වාසිය අස්ථිත්වය තුලට ගලා එන්නේ නම් හා එහි පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකිනම් පමණක් එය "දේපල, පිරියත හා උපකරණ ලෙස හඳුනාගත යුතු වුවද ආර්ථික වාසිය අස්ථිත්වය තුලට ගලා ඒම යන කොන්දේසිය සපුරාලිය නොහැකි භෞතිකව මණ්ඩලය සතුව නොමැති වටිනාකම රු.8,095,000 ක් වූ කැබ් රථයක් සහ දැනට භාවිතයෙන් ඉවත් කර ඇති වටිනාකම රු.7,641,159 ක් වූ දිනුම් ඇදීමේ යන්ත්‍ර 07 ක් සමාලෝචිත වර්ෂයේ දේපල, පිරියත හා උපකරණ යටතේ දක්වා තිබුණි. | මෙහි සඳහන් රු.8,095,000/-ක් වූ ඩබල් කැබ් රථය මණ්ඩලය සතුව භෞතිකව නොමැති යන විගණන නිරීක්ෂණය සමඟ එකඟවේ. මෙම කැබ් රථය සම්බන්ධයෙන් මේවන විට කොළඹ දිසා අධිකරණයේ නඩු පවරා (නඩු අංකය - DMR/4781/2021) ඇති අතර මණ්ඩලය නමින් ලියාපදිංචි කර ඇති බැවින් එය ස්ථාවර වත්කමක් ලෙස ගිණුම්ගත කර ඇත.<br><br>මෙහි සඳහන් රු.7,641,119/- වටිනාකම තුල දිණුම් ඇදීමේ යන්ත්‍ර 4 ක් වායු සම්පීඩක 1 ක් සහ  දිනුම් ඇදිම සඳහා යොදාගනනා පන්දු ඇතුලත්වේ. මෙම අයිතම දිනුම් ඇදීමේ කාර්ය සදහා මණ්ඩලය විසින් ආරම්භක අවධියේ යොදාගන්නා ලද අයිතම වන අතර මේවා මණ්ඩලයේ වත්කම් ලෙස සටහන් තබා ඇත. එම අයිතම දිනුම් ඇදීමේ කාර්ය සඳහා යොදාගන්නා ලද විශේෂ යන්ත්‍ර වන බැවින් මෙම යන්ත්‍ර අපහරණය කිරීමේ දී ගැටළුවක් පවතී. මෙහි ඇති සුවිශේෂිභාවය සහ අබලි තත්වය මත මේවා බාහිර පාර්ශවයන් වෙත අපහරණය කිරීම දුෂ්කර වී ඇත. මේවන විට මෙම යන්ත්‍ර අපහරණය නොකිරීම මත මෙම යන්ත්‍ර ගිණුම් තුල පෙන්වීම සිදුකර ඇත. |
| (ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 36 වගන්තිය අනුව දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීමේදී දේපල පිරියත උපකරණ අයත් පන්තියම ප්‍රත්‍යාගණනය කල යුතු අතර තෝරාගත් අයිතමයන් කිහිපයක් පමණක් ප්‍රත්‍යාගණනය නොකල යුතු වුවද කාර්යාල උපකරණ හා ජංගම දුරකථන, යන්ත්‍ර සූත්‍ර,  ලී බඩු හා සවිකිරීම්, පරිගණක හා උපාංග, පරිගණක මෘදුකාංග යන වත්කම් පන්ති පහකට අයත් ගිණුම් නවයක 2023 දෙසැම්බර් 31 දිනට එකතු ශේෂය රු.245,194,377 ක් වූ අයිතමයන් වලින් වටිනාකම රු.86,478,373 ක් වූ අයිතමයන් සමාලෝචිත වර්ෂය තුලදී ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | ජංගම නොවන වත්කම්හි ඵලදායි ජීව කාලය තීරණය කිරීම සඳහා මණ්ඩලය මගින් කමිටුවක් පත්කල අතර එහිදී වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම සම්බන්ධයෙන් තීරණ ලබාදෙනලදී. 2023 වසරේ මණ්ඩලයේ සියළුම වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට සැලකිල්ලට භාජනය වුවද පරිගණක උපාංග, කාර්යාල උපකරණ හා ගෘහ භාණ්ඩ සම්බන්ධයෙන් කමිටුවේ තීරණය වූයේ 2023.01.01 දිනට ක්ෂය කර අවසන් වත්කම් පමණක් ප්‍රත්‍යාගණනය කිරීමය. මෙහිදී ප්‍රමාණාත්මකභාවය සැලකිල්ලට ගෙන කුඩා අගයක් ඇති විශාල අයිතම ප්‍රමාණයක් ප්‍රත්‍යාගණනය කිරීම ප්‍රායෝගික නොවීම යන කරුණු පදනම්වී ඇත. LKAS 1 සඳහන් පරිදි ප්‍රමාණාත්මක අගය (Materiality) සංකල්පය මෙහිදී භාවිතා කර ඇත.<br><br>තවද මේ වන විට භාවිතයට ගත නොහැකි වත්කම්, අබලි තත්වයේ පවතින හෝ අපහරණය කිරීමට ඇති වත්කම් වේ නම් එම වත්කම් ද ප්‍රත්‍යාගණනය කර ගිණුම් තුල පෙන්වීම හා ක්ෂය කිරීම ප්‍රායෝගිකව සුදුසු නොවන බැවින් ප්‍රත්‍යාගණනය නොකිරීමට කමිටුව මගින් තීරණය කර ඇත.<br><br>විගණනය මගින් පෙන්වා දී ඇති මෙම රු.86,478,373/-ක වටිනාකම මගින් පෙන්නුම් කරනුයේ 2023.12.31 දිනට ක්ෂය අවසන් නොමැති සහ භාවිතයට ගැනීමට නොහැකි තත්වයේ පවතින වත්කම්හි එකතුවකි. වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේ දී  සියළුම වත්කම් පන්ති ප්‍රත්‍යාගණනයට භාජනය කර ඇති අතර මෙම පෙන්වා දී ඇති රු.86,478,373/- අගය මණ්ඩලයේ මුළු වත්කම් අතුරින් 3% වැනි ප්‍රතිශතයක් බැවින් මෙසේ තවදුරටත් පිරිවැයට පවත්වාගෙනයාමට පියවරගෙන ඇත. මෙහිදී ප්‍රායෝගික තත්වය සැලකිල්ලට ගෙන ඇත. ගිණුම් පරිශීලකයාගේ තීරණයට විශාල බලපෑමක් නොකරන අගයක් නිරූපණය කිරීමට සංකීර්ණ නොවන ක්‍රම භාවිතාකර ඇත. |

| විගණකාධිපති වාර්තාවේ සඳහන් කරුණු | කළමණාකරණය විසින් ගනු ලැබූ පියවර |
|---|---|
| (ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24 හි 17 වන ඡේදය ප්‍රකාරව ආයතනයේ ප්‍රධාන කළමනාකරණ පුද්ගල කණ්ඩායම් ප්‍රතිලාභවල එකතුව කෙටි කාලීන සේවා ප්‍රතිලාභ, පශ්චාත් සේවා ප්‍රතිලාභ, වෙනත් දිගු කාලීන ප්‍රතිලාභ සහ සේවය අවසන්වීමේ ප්‍රතිලාභ වශයෙන් දැක්විය යුතු වුවද එලෙස කටයුතු කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ සිට විගණනය පෙන්වා දී ඇති පරිදි කටයුතු කරනු ලැබේ. |
| (ඉ) සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දින සිට ජුලි 05 දින දක්වා කාලය තුලදී ශනිදා වාසනා, ලග්න වාසනා, ජයෝදා, කප්රුක, අද කෝටිපති හා වාලම්පුරි යන ලොතරැයිපත් 06 හි විශේෂ දෙවැනි දිනුම් ඇදීම් සඳහා සහ ජුලි 06 දින සිට දෙසැම්බර් 31 දින  දක්වා කාලය තුලදී  ශනිදා වාසනා, ලග්න වාසනා, ජයෝදා, සුපර් බෝල්, කප්රුක, අද කෝටිපති, සුපිරි ධන සම්පත හා වාලම්පුරි යන ලොතරැයිපත් 08 හි "දෙවන වරම" හා "සෙකන්ඩ් චාන්ස්" දිනුම් ඇදීම් සඳහා ත්‍යාග මුදල් ලෙස ගෙවූ රු.761,885,800 ක මුදල සමාලෝචිත වර්ෂයේ ත්‍යාග වියදමක් ලෙස ගිණුම්ගත නොකර ත්‍යාග සංචිත ගිණුමට ගැලපීම නිසා සමාලෝචිත වර්ෂයේ එම ප්‍රමාණයෙන් ත්‍යාග වියදම අඩුවෙන් හා ලාභය වැඩියෙන් දක්වා තිබුණි. | රට තුළ පැවති ආර්ථික පසුගාමී තත්ත්වය හමුවේ ලොතරැයි කර්මාන්තයට අදාල අමුද්‍රව්‍ය මිල ගණන් ඉහළ යාම හා අදාල සේවා  මිල ගණන් ඉහළ යාම මත ටිකට්පතක ලාභාන්තිකයට සිදුවන අහිතකර බලපෑම පිළිබඳ සැලකිලිමත්ව මුදල් අමාත්‍යාංශය විසින් සංවර්ධන ලොතරැයි මණ්ඩලය හා ජාතික ලොතරැයි මණ්ඩලය යන ආයතන දෙකෙහිම ලොතරැයිපතක මිල රු.20 සිට රු.40 දක්වා ඉහළ දැමීම සුදුසු බවට ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන තිබූ අතර අදාල තීරණය මත 2023 ජූලි මස 06 වන දින සිට දිනුම් අදින ලොතරැයිපතක මිල රු.40 දක්වා ඉහළ දැමීම සිදු කරන ලදී.<br><br>අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ යන කාණ්ඩයට ගැනෙන ලොතරැයි ටිකට්පත් සඳහා ආර්ථික විද්‍යානුකූලව නම්‍ය ඉල්ලුම් තත්ත්වයක් පවතිනු ලබන බැවින් ලොතරැයිපතක මිල ඉහළ දමන ප්‍රමාණයට සාපේක්ෂව වැඩි ප්‍රතිශතයකින් ලොතරැයිපත් කෙරෙහි පවතින පාරිභෝගික ඉල්ලුම් පහළ යනු ලබන අතර ප්‍රායෝගිකව මීට ඉහත දී ලොතරැයි මිල පිරිවැටුම ඉහළ දැමීම සිදු කරන  අවස්ථාවලදී දැවැන්ත ලෙස ලොතරැයිපත් පිරිවැටුම පහළ යන ලදී.<br><br>එබැවින් 2023 ජූලි මස 06 දින සිට ලොතරැයිපතක විකුණුම් මිල ඉහළ දැමීමට සාපේක්ෂව  ලොතරැයිපත් කෙරෙහි ඇති පාරිභෝගික ඉල්ලුමේ සිදුවිය හැකි ප්‍රාමාණික පසුබෑම වළක්වා ගැනීමේ අරමුණින් දෙවන වරම හා සෙකන්ඩ් චාන්ස් ලෙස අමතර දිනුම් වාර පාරිභෝගිකයින්ට හඳුන්වාදීමේ උපායමාර්ගික ක්‍රමවේදයක් සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය යටතේ අනුගමනය කර ඇත. මේ තුළින් ලොතරැයිපත් වලට ඇති පාරිභෝගික ඉල්ලුම් අඩුවීමේ ප්‍රතිශතය පාලනය කර ගනිමින් මණ්ඩලයේ දෛනික පිරිවැටුම අඩුවීම නිසා ජනිත කරන දිනුම් ප්‍රමාණය අඩුවීම මත මහජනතාව ලොතරැයිවල දිනුම් අඩුකර ඇත යන මතය නැති කිරීමට මෙම උපාය මාර්ග අනුගමනය කිරීමෙන් යම්තාක් දුරකට එය පාලනය කර ගත හැකි විය.<br><br>ඒ අනුව ඉහත කී දෙවන වරම හා සෙකන්ඩ් චාන්ස් අමතර දිනුම් වාර හඳුන්වා දීම තුළින් මණ්ඩලය අනුගමනය කරනු ලැබූ උපායමාර්ගික තීරණයේ ඵලදායීතාවය ඉතා ඉහළ මට්ටමක පැවතිණ.<br><br>අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එක් එක් ලොතරැයිපත සඳහා පූර්ව අනුමත කර ඇති ත්‍යාග වියදම් ප්‍රතිශත මත මණ්ඩලය විසින් ත්‍යාග වියදම් ආදායම් ප්‍රකාශයට හර කරනු ලබන අතර දිනුම් ඇදීම තුළින් ජනිත වන ත්‍යාග වියදම හා  අධ්‍යක්ෂ මණ්ඩල  පූර්ව අනුමත ප්‍රතිශත මත ත්‍යාග වියදම යන දෙකෙහි වෙනස ත්‍යාග සංචිත ගිණුම තුළින් ගැළපීම සිදු වන අතර එලෙස ත්‍යාග සංචිත ගිණුමේ එකතුවන මුදල් ප්‍රමාණය, සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 18 (3) වගන්ති ප්‍රකාරව ඉන්පසුව පැවැත්වෙන සංවර්ධන ලොතරැයි වල ත්‍යාග ප්‍රදානය කිරීම සඳහා යොදාගනු ලැබිය යුතු ලෙස දක්වා ඇත. ඒ අනුව 2023 වර්ෂයේ දෙවන වරම හා සෙකන්ඩ් චාන්ස් දිනුම් අවස්ථා සඳහා ගෙවූ ත්‍යාග මුදල්  ද ත්‍යාග සංචිත ගිණුම මගින් ගෙවා ඇත. තවද ආරම්භයේ සිටම මෙලෙස ගිණුම් ගත කිරීම සිදු කර අවසාන ගිණුම් වලට ගලපා ඇති අතර ඒ පිළිබඳ ගැටළුවක් විගණන අංශය මගින් පෙන්වා දී නොමැති බව නිරීක්ෂණය කරමි.<br><br>මේ අනුව මණ්ඩලය, සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත ප්‍රකාරව ත්‍යාග සංචිත ගිණුම භාවිතා කර අමතර ත්‍යාග ලබා දීම සිදු කර ඇති අතර ත්‍යාග සංචිත ගිණුමේ එකතු වී තිබූ මුදල් ප්‍රමාණය මීට පෙර අවස්ථා වල දී ආදායම් ප්‍රකාශය තුළින් ගැලපීම් සිදු කර ඇති බැවින් නැවත වරක් වියදමක් ලෙස දැක්විය යුතු නොවන බව දැනුම් දෙමි. |

| විගණකාධිපති වාර්තාවේ සඳහන් කරුණු | කළමණාකරණය විසින් ගනු ලැබූ පියවර |
|---|---|
| (ඊ) සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ තොග ගණනය කිරීමේ ක්‍රමවේදය අනුව ඉදිරි වර්ෂයේ දිනුම් ඇදීම් සඳහා මුද්‍රණය කර දෙසැම්බර් 31 දිනට ගබඩාවට භාරදී ඇති ලොතරැයිපත් වල වටිනාකම අවසන් තොගය ලෙස හඳුනාගනු ලැබුවද 2024 ජනවාරි 01 දින සිට ජනවාරි 27 දින දක්වා කාලපරිච්ඡේදයේ දිනුම් ඇදීම් සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින ගබඩාවට භාරදී තිබූ ලොතරැයි පත් 4,605,000 ක වටිනාකම වූ රු.5,787,310 ක් අවසන් තොගයට ඇතුලත් කර නොතිබීම නිසා අවසන් තොගය සහ වෙළඳ ණය හිමියන් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | සැපයුම්කරුවන් වෙතින් ටිකට්පත් තොග මණ්ඩලයට ලද විගස එම ටිකට්පත් මණ්ඩලයේ තොගයක් ලෙස ගිණුම්ගත නොකරන අතර පළමුව එම ටිකට්පත් නියමිත පිරිවිතරයන්ට අනුකූලව පවතී ද යන්න අභ්‍යන්තර විගණන අංශය විසින් පරීක්ෂාකර බලා තහවුරුවක් ලබා දෙයි. ඉන්පසු අදාල ටිකට්පත් සඳහා GRN නිකුත් කරනු ලැබේ.<br><br>අදාල ටිකට්පත් නියමිත පිරිවිතරයන්ට අනුකූල නොවේනම් එම තොගයන් භාර ගැනීම ප්‍රතික්ෂේප කරනු ලබයි.<br><br>ඒ අනුව මණ්ඩලයට ලැබී ඇති ටිකට්පත් නියමිත පිරිවිතරයන්ට අනුකූල බවට සහතිකය ලැබීමෙන් (Quality Assurance check ) හා GRN නිකුත් කිරීමෙන් අනතුරුව එම ටිකට්පත් මණ්ඩලයට අයත් තොගයක් ලෙස ගිණුම් ගත කරනු ලබයි.<br><br>විගණන විමසුමේ සඳහන් ටිකට්පොත් 460,500 ක ප්‍රමාණය 2023/12/31 දිනට ගබඩාවට ලැබී තිබුණ ද එම ටිකට්පොත් තොග නියමිත පිරිවිතරයන්ට අනුකූලවන බවට සහතික කර GRN නිකුත් කර නොමැති බැවින් එම ටිකට්පොත් තොගය 2023/12/31 දිනට ගිණුම් ගතකර නොමැත.<br><br>කෙසේ වෙතත් අප විසින් 2023/12/31 දිනට සිදුකරනු ලැබූ වර්ෂ අවසාන තොග සමීක්ෂණය තුළ දී මෙම ටිකට්පොත් තොගය පරීක්ෂාකර බලා ගිණුම් ගත කර නොමැති ටිකට්පොත් තොග යටතේ වෙනම පෙන්වා දී ඇත. |
| (උ) සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සේවකයන් විශ්‍රාම යාමේදී හෝ සේවයෙන් ඉවත්වීමේදී ගෙවිය යුතු පාරිතෝෂිත ගෙවීම සඳහා රාජ්‍ය බැංකු දෙකක ආයෝජනය කර තිබූ ස්ථාවර තැන්පතු 06 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.6,619,629 ක පොලී ආදායම ශුද්ධ සේවක ප්‍රතිලාභ වගකීම ගණනය කිරීමේදී සැලකිල්ලට නොගෙන ජංගම වත්කම් යටතේ වූ ස්ථාවර තැන්පතු වටිනාකමට එකතුකර තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ ස්ථාවර තැන්පතු ශේෂය සහ සේවක ප්‍රතිලාභ වගකීම් ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | රු.6,619,629 ක පොලී ආදායම ලැබිය යුතු පොලී ආදායමක් වන අතර මණ්ඩලය විසින් පොලී ආදායම නැවත ස්ථාවර තැම්පතුවට එකතු කර ආයෝජනය කරනු නොලබන බැවින් ශුද්ධ සේවක ප්‍රතිලාභ වගකීම ගණනය කිරීමේදී සැලකිල්ලට නොගෙන ජංගම වත්කම් යටතේ වූ ස්ථාවර තැන්පතු වටිනාකමට එකතු කර ඇත. |
| (ඌ) ස.තො.ස ආයතනයෙන් 2009 වර්ෂයේ නිකුත් කර තිබූ වටිනාකම රු.592,500 ක් වූ ත්‍යාග වවුචර් පත් 123 ක් මූල්‍ය තත්ව ප්‍රකාශනයේ ත්‍යාග භාණ්ඩ අවසන් තොගය ලෙස ඇතුලත් කර තිබුණද මෙම වවුචර් පත් ලොතරැයි මණ්ඩලයට ලැබී සමාලෝචිත වර්ෂය අවසන් වන විට වර්ෂ 14 කට අධික කාලයක් ගතවී ඇති බැවින් සහ ඒ සඳහා මුදල් ලබාගැනීම සම්බන්ධව අවිනිශ්චිත තාවයක් තිබියදී ඒ සඳහා අවශ්‍ය ගැලපීම් සිදු නොකර මූල්‍ය තත්ව ප්‍රකාශනයේ ජංගම වත්කමක් ලෙස නිරූපනය කර තිබුණි. | රු.592,500/- ක් වටිනාකමකින් යුත් වවුචර් පත් 123 ක වටිනාකම නැවත අය කරගැනිම සම්බන්ධයෙන් අදාල අමාත්‍යංශය සහ ලංකා ස.තො.ස ආයතනය සමඟ සිදු කල සාකච්ඡා වල තීරණ අනුව එම වටිනාකම අය කර ගැනිමේ අවිනිශ්චිතතාවයක් නොපැවතිය අතර එම තීරණ කිහිපයක සාරංශයන් පහත පරිදි දක්විය හැකිය.<br><br>01. එම වවුචර්පත් සම්බන්ධයෙන් වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යංශයේ ලේකම්තුමිය දැනුවත් කර ඇති අතර අදාල පාර්ශව අතර ඇති වූ සාකච්ඡාවට අනුව 2021/04/05 සහ 2021/08/21 දිනැති ලිපි මගින් අදාල වවුචර්පත් වටිනාකම ආපසු ගෙවන ලෙස අමාත්‍යංශයේ ලේකම්තුමිය විසින් ලංකා ස.තො.ස ආයතනයට දන්වා ඇත.<br><br>02. 2022/05/24 දින අදාල වවුචර්පත් වටිනාකම නොගෙවීම සම්බන්ධයෙන් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිපියක් මගින් දැනුවත් කර ඇති අතර එම ආයතනය විසින් 2022/09/09 දින ලංකා ස.තො.ස ආයතනය යොමු කර ඇති ලිපියට අනුව දින 10 තුල අදාල වටිනාකම නිරවුල් කරන ලෙස දැනුවත් කර ඇත.<br><br>03 2023/01/16 දින ලිපිය මගින් වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යංශයේ අතිරේක ලේකම්තුමිය විසින් ඉහත කී වවුචර්පත් මාස 6 දක්වා නැවත සක්‍රීය කර ගැනිමට හෝ ඉහත වටිනාකමට සමාන භාණ්ඩ ලංකා ස.තො.ස ආයතනයෙන් ලබා දීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස දන්වා ඇත. |

| විගණකාධිපති වාර්තාවේ සඳහන් කරුණු | කළමණාකරණය විසින් ගනු ලැබූ පියවර |
|---|---|
| | 04 එම වවුචර් පත් 123 ක වටිනාකම නැවත අය කරගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කල අතර අප ආයතනයේ අධ්‍යක්ෂකවරයෙකු ලෙස කටයුතු කරනු ලබන වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යංශයේ ලේකම්තුමා විසින් සංවර්ධන ලොතරැයි මණ්ඩලය හා ලංකා ස.තො.ස ආයතනය යන දෙපාර්ශවයම රජයේ ආයතන බැවින් අදාල වවුචර්පත් නැවත සක්‍රිය කර ලබා දිය හැකි බව අප වෙත දැනුම් දෙන ලදී.<br><br>එමෙන්ම වෙළෙඳ අමාත්‍යාංශයේ ලේකම්තුමා විසින් අපටද පිටපතක් සහිතව 2024.01.02 දින ලිපිය මගින් අදාළ වවුචර්පත් නැවත සක්‍රීය කර ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කරන ලෙස ලංකා ස.තො.ස. ආයතනයේ සභාපතිතුමා දැනුවත්කර ඇත.<br><br>මෙවැනි තත්වයක් තුල එම වවුචර් පත් 123 ක වටිනාකම වන රු.592,500/- ක මුදල නැවත අය කර ගැනීමට හැකි බව ඉහත තීරණ අනුව නිරීක්ෂණය වන නිසා එම ශේෂය ජංගම වත්කමක් ලෙස මූල්‍ය ප්‍රකාශනයන් තුල පෙන්නුම් කරයි.<br><br>ස.තො.ස ආයතනය විසින් මෙම වවුචර්පත් නැවත සක්‍රිය කර දීමට නොහැකි බව ලිපියක් මගින් දන්වා ඇති බැවින් එම වවුචර්පත් ශේෂය තව දුරටත් ගිණුම් තුල පවත්වාගෙන යැම නිශ්ඵල කරුණක් බව අනාවරණය වන නිසා ගිණුම් වලින් ඉවත් කිරීම සම්බන්ධයෙන් විගණන හා කළමණාකරන කමිටුවේ උපදෙස් මත 2024 මැයි මස 20 දින පැවති සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කර ඇති අතර එම මුදල ගිණුම් වලින් ඉවත් කිරීම සඳහා අනුමැතිය හිමි වී ඇත. |
| (ඩ) සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ කෑම කාමරය , ගබඩා කාමරය සහ මායිම් බිත්ති අලුත්වැඩියා කිරීම සඳහා 2017 සහ 2018 වර්ෂවලදී දරන ලද රු.1,728,884 ක වියදම සිදුකර සමාලෝචිත වර්ෂය අවසන් වන විට වසර 06 කට අධික කාලයක් ගතවී තිබුණද අවශ්‍ය ගිණුම්කරණ ගැලපීම් සිදුනොකර දේපල පිරියත උපකරණ යටතේ කෙරීගෙන යන වැඩ ලෙස දක්වා තිබුණි. | මෙම විගණන විමසුමෙහි සඳහන් කෑම කාමරය, ගබඩා කාමරය, සහ මායිම් බිත්තිය අලුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් මෙතෙක් වැඩ අවසන් කර නොමැත. වත්කමක් ලෙස හඳුනාගැනීම සඳහා අදාල වත්කම ප්‍රතිලාභ ලැබෙන මට්ටමට නිමවී තිබිය යුතුය. එබැවින් 2023 දෙසැම්බර් 31 දින වන විටත් ඉහත ඉදිකිරීම් නිම වී නොතිබූ හෙයින් විගණන විමසුමෙහි සඳහන් අයිතම ප්‍රාග්ධනිත කර ක්ෂය කිරීමට කටයුතු යොදා නොතිබුණි |
| (ඪ) ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව සහ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම යන ආයතන දෙකට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව ගෙවිය යුතු මුදල පිළිවෙලින් රු.11,884,975 ක් සහ රු.4,735,627 ක් වුවද, එම ආයතන විසින් විගණනයට සෘජුවම තහවුරු කරන ලද මුදල පිළිවෙලින් රු.22,606,401 ක් සහ රු.2,754,832 ක් විය. | ගුවන් විදුලි සංස්ථාව, එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම යන ආයතන දෙක සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලය ගෙවිය යුතු වටිනාකම අතර රු.10,721,426/- සහ රු.1,980,795/- ක විචලතාවයක් පවතින අතර එම ශේෂ පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය කර ගැනිමට හැකි විය.<br><br>ගුවන් විදුලි සංස්ථාව හා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම අදාල මාධ්‍ය ආයතන විගණනයට සෘජුවම තහවුරු කල ශේෂය ලබා ගෙන ඇත්තේ එකතු කල අගය මත බදු (VAT) වටිනාකම ඇතුලත්ව වන අතර උපචිත වියදම ගණනය කරනුයේ බදු (VAT) වටිනාකම ඇතුලත් කර නොමැතිවය.<br><br>එමෙන්ම අදාල මාධ්‍ය ආයතන මෙම ශේෂය ගණනය කර ඇත්තේ 2023/12/31 දිනට එම ආයතන වෙත නොලැබුණු ඉන්වොයිස් වටිනාකම් පදනම් කර ගෙන වන අතර සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් ගෙවීම් කල නමුත් එම මාධ්‍ය ආයතන වෙත නොලැබුනු චෙක්පත් වටිනාකම් සඳහා ගැලපීම් සිදු කර (ගෙවීම් සිදු කලා සේ සලකා) උපචිත වියදම ගණනය කර ඇත.<br><br>එක්සත් ප්‍රවෘත්තිපත්‍ර සමාගම 2023/12/31 දිනට ඔවුන්ගේ උපචිත වියදම ගණනය කර ඇත්තේ සංවර්ධන ලොතරැයි මණ්ඩලය සමග සිදු කරනු ලබන සෘජු ප්‍රචාරන වියදම් සඳහා පමණක් වන අතර අදාල නියෝජිත ආයතන හරහා සිදු කල ප්‍රචාරන වියදම් වටිනාකම ඇතුලත් කර නොමැති බවට මණ්ඩලය වෙත දන්වා ඇත.<br><br>එබැවින් සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සැපයුම්කරුවන්ට ගෙවිය යුතු ශේෂය සහ එම ආයතනවල මූල්‍ය ප්‍රකාශන වල නිරූපනය කරන ශේෂය සැසඳීම ප්‍රයෝගික නොවන අතර මෙම ශේෂයන් අසමාන වීමට හැකියාවක් ඇත. |

| විගණකාධිපති වාර්තාවේ සඳහන් කරුණු | | | කළමණාකරණය විසින් ගනු ලැබූ පියවර |
|---|---|---|---|
| (ඔ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව කාර්යාල උපකරණ හා ජංගම දුරකථන ශේෂය, ලිබඩු හා සවිකිරීම් ශේෂය, පරිගණක උපාංග ශේෂය පිළිවෙලින් රු.43,416,368 ක්, රු.14,802,820 ක් හා රු. 57,425,324 ක් වුවද, ඊට අදාල උපලේඛණය අනුව එම ශේෂයන් පිළිවෙලින් රු. 43,353,012 ක්, රු. 14,881,156 ක් හා රු. 57,175,052 ක් විය. | | විගණන විමසුමෙහි (අංක PUR/F/DLB/2023/AQ-34) සඳහන් මෙම වෙනස 2024 වර්ෂයේ ගිණුම් තුල නිවැරදි කර ඇත. |
| **2.** | **වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව** | | |
| 2.2.2 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව. | | 2018 හා 2020 යන වර්ෂ වල සුපර්බෝල් සහ කෝටිපති ශනිදා ලොතරැයිපත් වල දිනුම් ඇදීමේ ත්‍යාග වශයෙන් මිලදී ගත් යතුරු පැදි 03 අපහරණය කර එම මුදල් ජනාධිපති අරමුදලට යොමු කිරීමට 2022 මැයි 31 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමැතිය හිමි විය.<br><br>නමුත් 2022.10.11 වන දින පැවති විගණන හා කළමණාකරණ කමිටු රැස්වීමේදී තීරණය වූයේ මෙම යතුරු පැදි තක්සේරු කර ජනාධිපති ලේකම් කාර්යාලයට ලබා දෙන ලෙසයි. ඒ අනුව ජනාධිපති ලේකම් කාර්යාලයට අදාළ විස්තර 2023.03.30 වන දින යොමු කළ අතර 2023 මැයි මාසයේදී එම යතුරු පැදි මිලදී ගැනීමට අපේක්ෂා කරන බව ජනාධිපති ලේකම් කාර්යාලයෙන් දැනුම් දී ඇති අතර 2023.05.22 වන දින බිල්පත් සමඟ අදාළ විස්තර ජනාධිපති ලේකම් කාර්යාලය වෙත යොමු කරන ලදී.<br><br>නමුත් ඊට පසුව ජනාධිපති ලේකම් කාර්යාලයෙන් කිසිදු ප්‍රතිචාරයක් නොදැක්වූ බැවින් නැවත 2023.11.21 දිනැතිව නැවත ලිපියක් යොමු කරමින් දැනුම් දෙන ලද්දේ එම යතුරු පැදි මිලදී ගැනීමට අපේක්ෂා කරන්නේ නම් 2023.12.01 වන දිනට ප්‍රථම මිලදී ගන්නා ලෙසයි.<br><br>නමුත් මේ සම්බන්ධව කිසිඳු ප්‍රතිචාරයක් 2024.01.31 වන දින වන විටත් ජනාධිපති ලේකම් කාර්යාලයෙන් නොලැබුණු බැවින් මෙම යතුරු පැදි 03 අපහරණය කර එම මුදල් ජනාධිපති අරමුදලට යොමු කිරීම සඳහා නැවත අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් 2024.02.21 වන දින පැවති 292 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කළ අතර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හිමි වී ඇත.<br><br>ඒ අනුව මෙම යතුරුපැදි 03 විධිමත් පරිදි නැවත තක්සේරු කිරීම සඳහා කමිටුවක් පත් කර ඇති අතර තක්සේරු කිරීමෙන් අනතුරුව ඉදිරි මාස 02ක කාලය තුළ විධිමත් අපහරණ ක්‍රියාවලියකට භාජනය කර එම අරමුදල් ජනාධිපති අරමුදලට යොමු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත. |
| | **නීතිරීති / විධානයට යොමුව** | **නිරීක්ෂණ** | |
| (අ) | 1997 අංක 20 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත | | |
| (i) | 17(5) වගන්තිය | ත්‍යාගලාභීන් හිමිකම් නොපෑ, මාස 06 ක කාලසීමාව ඉකුත් වූ ත්‍යාග සඳහා මිලදීගත් භාණ්ඩ විකිණීමෙන් ලැබෙන මුදල පළමු කොට අරමුදලටද, ඉන් පසුව ජනාධිපති අරමුදලටද බැරකල යුතු වුවත්, 2018 සහ 2020 වර්ෂයේදී ත්‍යාග වශයෙන් ලබාදීමට මිලදී ගත් එකතු වටිනාකම රු.779,750 ක්වූ යතුරු පැදි තුනක් අලෙවි කර එම පනත ප්‍රකාරව යෙදවීමට 2022 වර්ෂයේ මැයි 30 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබාදී තිබුණද, අදාල කටයුතු වර්තමානය වන විටත් සිදුකර නොතිබුණි. | |
| ii. | 19 (1) හා 19 (2) වගන්ති | නියමිත යැයි මේ පනතින් ප්‍රකාශිත හෝ බලය දී ඇති සියලුම් කාරණා සම්බන්ධයෙන් මණ්ඩලය විසින් රීති සෑදිය යුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි. | දැනට කෙටුම්පත් කරන ලද රීතීන් ඇතුලත් ලේඛණය අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කර ඇති අතර එහි පරිගණක පද්ධතියට අදාල රීතීන්, කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක අංශය මගින් තහවුරු කර ඇති අතර තවදුරටත් මණ්ඩලයේ අංශ අතර කටයුතු පිළිබඳ ඇතුලත් විය යුතු කරුණු ඇතුලත් කර සංශෝධනය කරන ලද කෙටුම්පත ඉදිරියේදී අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කිරීමට යෝජිතය. |
| (ආ) | 2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 දරන රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තු චක්‍රලේඛය | 2020 ජනවාරි 31 දිනට පෙර රාජ්‍ය සංස්ථා ඇතුළු රාජ්‍ය ආයතන www. promise.lk වෙබ් අඩවිය යටතේ හඳුන්වා දී ඇති විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රමවේදය (e-GP) යටතේ ලියාපදිංචි විය යුතු වුවත්, සංවර්ධන ලොතරැයි මණ්ඩලය මෙම ක්‍රමවේදය යටතේ ලියාපදිංචි වී නොතිබුණු බැවින්, ඒ අනුව ප්‍රසම්පාදන කටයුතු සිදු කර නොතිබුණි. | e-GP සඳහා මණ්ඩලය ලියාපදිංචි වී ඇති අතර, ඊට අදාල පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් සහභාගී කරවා ඇත. එහිදී ලබා දුන් උපදෙස් හා එම පද්ධතියේ මූලික පුහුණු ආදර්ශ ඉටු කිරීම ආරම්භ කර ඇත. |

| විගණකාධිපති වාර්තාවේ සඳහන් කරුණු | | | කළමණාකරණය විසින් ගනු ලැබූ පියවර |
|---|---|---|---|
| (ඇ)<br><br><br><br><br><br><br>(i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය<br><br>4.2.3 වගන්තිය සඳහා වූ 31 වැනි අතිරේකය | රු.මිලියන 1,328 ක ඇස්තමේන්තු වටිනාකමකට 2023 වර්ෂය සඳහා ලොතරැයි 08 ක මුද්‍රණ කටයුතු සිදුකිරීම හා සැපයීම සඳහා මුද්‍රණකරුවන් තෝරාගැනීමේ ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර සති 10 ක් තුල නිම කල යුතු වුවද ඒ සඳහා සති 65 ක කාලයක් ගත කර තිබුණි. | මෙම ප්‍රසම්පාදනයට අදාල ලංසු කැඳවීම පිළිබඳ තීරණය ප්‍රසම්පාදන කමිටුව විසින් 2022.08.15 දින ලබා දී තිබූ අතර ලංසු විවෘත කිරීම 2022.09.15 දින සිදු කර ඇත. ලංසු පැවරීම පිළිබඳව අවසන් ප්‍රසම්පාදන කමිටු තීරණය 2023.02.06 දින ලබා ඇති අතර ඒ දක්වා සම්පූර්ණ ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාලව ඇගයීම් කමිටු රැස්වීම් 03 ක් හා ප්‍රසම්පාදන කමිටු රැස්වීම් 04ක් පවත්වා ඇත. 2023.02.06 දිනැති ප්‍රසම්පාදන කමිටු තීරණය ලංසුකරුවන් වෙත නිවේදනය කිරීම හා අභියාචනය සලකා බැලීම, ලංසු පැවරීමට අදාල අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම යන කාර්යයන් නිමවීමෙන් පසු ලංසු පැවරීම 2023.04.21 දින සිදු කර ඇත.<br><br>ඒ අනුව, මෙම ප්‍රසම්පාදනය සඳහා සති 65ක කාලයක් ගතවී නොමැත. විගණනය විසින් දක්වා ඇති පරිදි මෙම ප්‍රසම්පාදනය සති 10ක් තුල නිමකල යුතුය යන්න නිවැරදි නොවේ. ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 4.2.3 (31) සංශෝධනය පරිදි, මෙම ප්‍රසම්පාදනයට අදාලව ලංසු ඉදිරිපත් කිරීම සඳහා ලංසුකරුවන්ට ලබා දිය හැකි උපරිම කාලය සති 10ක් වේ. ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 4.2.3 හි පිටු අංක 88 හි දක්වා ඇති ප්‍රසම්පාදන අදියරයන් සමස්ථ ප්‍රසම්පාදනයට අදාලව ඉටුකල යුතු අතර ඒ සදහා ගත කල හැකි උපරිම කාලය එහි දක්වා ඇත. ඒ අනුව මෙම ප්‍රසම්පාදනය සදහා සති 38ක කාලයක් ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුව ලබා දී ඇත.<br><br>ඒ අනුව එහි සති 38 ක කාලය තුල මෙම ප්‍රසම්පාදනය අවසන් කර ඇත. |
| (ii) | 2.9.2 වගන්තිය සඳහා වූ 32 වන අතිරේකය | ප්‍රසම්පාදන හා තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයන්ට ගෙවීම් කිරීමේදී සම්පූර්ණ දීමනාව ලබාගැනීමට නම් සති 10 ක කාලය තුල ප්‍රසම්පාදන කාර්යයන් අවසන් කල යුතු වුවද 2023 වර්ෂය සඳහා ලොතරැයි මුද්‍රණය කිරීමේ සැපයුම්කරුවන් තෝරාගැනීමේ ප්‍රසම්පාදන කාර්යය සඳහා සති 65 ක කාලයක් ගත කර තිබියදී අදාළ කමිටු සාමාජිකයන්ට මුළු දීමනාව වශයෙන් රු.345,000 ක් ගෙවා තිබුණි. | ප්‍රසම්පාදන කමිටු සඳහා ගෙවීම් කිරීමේදී අනුමත ප්‍රසම්පාදන කාල සටහනට අනුකූලව ප්‍රසම්පාදන කාර්යය ඉටු කර තිබේද යන්න සැලකිල්ලට ගෙන එම ගෙවීම් සිදු කරනු ලබයි.ඒ අනුව එකී අනුමත ප්‍රසම්පාදන කාල සටහනට අනුකූලව තාක්ෂණික ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව එකී කටයුතු ඉටු කිරීම මත එම දීමනා ගෙවීම් සිදුකර ඇත. විගණනය විසින් දක්වා ඇති පරිදි සති 10ක කාලයකින් ප්‍රසම්පාදන අවසන් කිරීම යන්න නිවැරදි ප්‍රකාශයක් නොවේ. |
| (iii) | 4.2.1 වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | 2023 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර තිබූ අතර රජයේ විගණන අංශය  සඳහා ඉදිරිපත් කර ඇත. එක් එක් ප්‍රසම්පාදන අයිතමයට අදාල අදියරයන් නිරන්තරයෙන් සංශෝධනය වන බැවින් සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුනි. |
| (ඈ) | 2022 ජනවාරි 18 දිනැති අංක 02/2022 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය | i) දුරකථන වියදම් සීමාව නොසලකා සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ නිලධාරීන් 11 දෙනෙකු සඳහා 2022 ජනවාරි සිට 2023 පෙබරවාරි දක්වා කාලපරිච්ඡේදයේ දුරකථන වියදම් දීමනාව ලෙස එකතුව රු.141,599 ක් වැඩියෙන් ගෙවා තිබුණි.<br><br>ii) දුරකථන වියදම් දීමනාව සඳහා හිමිකම් නොලබන නිලධාරීන් 53 කට එකතුව රු.1,200,064 ක් දුරකථන වියදම් දීමනාව ලෙස සමාලෝචිත වර්ෂය තුලදී ගෙවා තිබූ අතර ඒ සඳහා 2023 පෙබරවාරි 23 දිනැති අධ්‍යක්ෂක මණ්ඩල තිරණය පරිදි රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | දුරකථන වියදම් සීමාව අභිබවා ලබා ගත් රු.141,599/- දුරකථන ගාස්තුව අදාල කාර්ය මණ්ඩල සාමාජිකයින්ගෙන් මාසික වැටුපෙන් අඩු කර ගැනීමට කටයුතු කර ඇත.<br><br>රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් 2015 මැයි 25 දිනැති අංක 02/2015 දරණ චක්‍රලේඛයේ සඳහන් දුරකථන දීමනා සංශෝධනය වූ අතර සංශෝධිත සීමාවෙන් ඔබ්බට වැය වූ පිරිවැය ඒ ඒ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගෙන් 2022 පෙබරවාරි මස සිට කපා ගැනීමට අවශ්‍ය අනුමැතිය 2023 පෙබරවාරි 23 දින පැවති 275 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී හිමි විය.<br><br>මේ සම්බන්ධව 2023.12.12 දිනැතිව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට ලිපියක් යොමු කළ අතර ඒ සඳහා 2024.03.07 දිනැතිව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් ලිපියක් යොමු කල තිබූ අතර එම ලිපිය ප්‍රකාරව දුරකථන දීමනාව ලබා දීම සඳහා හා දුරකථන ලබාදීමේ ක්‍රමවේදය සම්බන්ධව නව ක්‍රමවේදයක් සකස් කර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන කටයුතු කරන ලෙස උපදෙස් ලබා දී තිබුණි. ඒ අනුව මේ සම්බන්ධව විධිමත් ක්‍රමවේද්‍යක් සකස් කර 2024.05.20 වන දින පැවති 294 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කල අතර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හිමි විය. ඒ අනුව මින් ඉදිරියට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් ලබා දී ඇති උපදෙස් ප්‍රකාරව සකස් කර ක්‍රමවේදය අනුව ක්‍රියා කරනු ලැබේ. |

<table>
<tr><th colspan="3">විගණකාධිපති වාර්තාවේ සඳහන් කරුණු</th><th>කළමණාකරණය විසින් ගනු ලැබූ පියවර</th></tr>
<tr><td>(ඉ)</td><td>රාජ්‍ය ව්‍යාපාර දෙපාර්ත මේන්තුවේ 2015 මැයි 25 දිනැති අංක PED/1/2015 දරන චක්‍රලේඛයේ 2.3 ඡේදය</td><td>නිල වාහන හිමිකම් නොමැති නිලධාරීන් පස් දෙනෙකු සඳහා නිල වාහන සපයා දී තිබූ අතර ඒ වෙනුවෙන් ඉන්ධන වියදම් ලෙස සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.2,913,410 ක වියදමක් දරා තිබුණි.</td><td>2023.07.09 දිනැතිව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් යොමු කර ඇති ලිපිය ප්‍රකාරව කටයුතු කිරීම සදහා ජාතික ලොතරැයි මණ්ඩලය අනුගමනය කරන ක්‍රමවේදයට සමාන ක්‍රමවේදයක් සංවර්ධන ලොතරැයි මණ්ඩලයද අනුග මනය කරමින් සහකාර සාමාන්‍යාධිකාරිවරුන්ට ප්‍රවාහන පහසුකම් ලබා දීමට අවශ්‍ය වන අනුමැතිය ලබා ගැනීම සඳහා 2024 මැයි මාසයේ 20 වන දින පැවැත්වෙන 294 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් යොමු කරන ලදී. ඒ අනුව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති උපදෙස් අනුව සකස් කල අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව සඳහා අනුමැතිය හිමි වූ අතර එම නව ක්‍රමවේදය 2024 ජූනි මස සිට ක්‍රියාත්මක කරනු ඇත.</td></tr>
<tr><td>(ඊ)</td><td>2016 මැයි 30 දිනැති අංක 04/2016 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය</td><td>නිල වාහන හිමිකමක් නොමැති නිලධාරිනියකට මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ මණ්ඩලය විසින් ලබාගත් මෝටර් රථයක් ලබාදී තිබූ අතර එම මෝටර් රථය සඳහා සමාලෝචිත වර්ෂයේදී මෙහෙයුම් කල්බදු කුලී ලෙස රු.2,028,000 ක් ගෙවා තිබුණි.</td><td>මණ්ඩලයේ මෝටර් රථවල පවතින හිඟතාවය හේතුවෙන් මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ මෝටර් රථ 03 ක් ලබා ගෙන ඇත. එම මෝටර් රථ අතුරින් මෝටර් රථ 02ක් සාමාන්‍යාධිකාරි හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයෙකුට අනුයුක්ත කර ඇති අතර අනෙක් මෝටර් රථය සහකාර සාමාන්‍යාධිකාරිවරයෙකුට අනුයුක්ත කර ඇත. මණ්ඩලයේ සංචිතයේ පැවති මෝටර් රථයක් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයෙකු සඳහා අනුයුක්ත කර ඇත. ඉදිරියේදී මෙම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයා වෙත මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ ලබාගත් වාහනය අනුයුක්ත කිරීමට කටයුතු කරනු ලැබේ. තවද ජාතික ලොතරැයි මණ්ඩලය අනුගමනය කරන ක්‍රමවේදයට සමාන ක්‍රමවේදයක් සකස් කර ඇති අතර එම ක්‍රමවේදයට කටයුතු කිරීම ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.</td></tr>
<tr><td colspan="3">2.3 වෙනත් විගණන නිරීක්ෂණ<br><br>(අ) සංවර්ධන ලොතරැයි මණ්ඩලය තුල ලොතරැයි මෙහෙයුම් හා කළමනාකරණ ක්‍රියාවලිය බාහිර සේවා සැපයුම් ආයතනයක් තුලින් සිදුවන බැවින් ලොතරැයි කළමනාකරණ මෘදුකාංග පද්ධතියක් නිර්මාණය කිරීම හා ස්ථාපනය කිරීම, කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සඳහා සුදුසු සැපයුම්කරුවකු තෝරාගැනීම සඳහා අවශ්‍ය ලංසු ලියවිලි පිළියෙල කිරීමේ කටයුතු 2020 ජූලි මස ආරම්භ කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් එම කටයුතු අවසන්වී නොතිබුණි. මේ නිසා 2020 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා මාසික සේවා ගාස්තු සියයට 68 ක වැඩිවීම් සහිතව සේවා ගිවිසුම් කාලය දීර්ඝ කරමින් තරඟකාරී ටෙන්ඩර් පරිපාටියෙන් බැහැරව මෘදුකාංග සේවා සැපයුම් සමාග මක් තෝරාගෙන ලොතරැයි මෙහෙයුම් හා කළමනාකරණ මෘදුකාංග සේවා ලබාගැනීම නිසා 2020 වර්ෂයේ සිට 2023 වර්ෂයේ අවසානය දක්වා රු.73,221,351 ක් ගෙවා තිබුණි.</td><td>මණ්ඩලයට ලොතරැයි කළමනාකරණ මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීම සදහා 2019 වර්ෂයේදී සිදු කල ප්‍රසම්පාදනයට අදාල විෂය පථය සංශෝධනය කොට නැවත ලංසු කැදවීමට 2020 වර්ෂයේදී අධ්‍යක්ෂක මණ්ඩලය තීරණය කර තිබුණි. ඒ අනුව මෙම ආයතනයට , සම්පූර්ණ වශයෙන් මණ්ඩලයට හිමිකාරීත්වය ලැබෙන පරිදි (With Source Cord) ලොතරැයි කළමනාකරණ මෘදුකාංග පද්ධතියක් නිර්මාණය කිරීම හා ඒ සදහා තෝරාගනු ලබන සැපයුම් ආයතනය විසින් මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කිරීමෙන් පසු දෛනිකව එහි මෙහෙයුම් ක්‍රියාවලිය ඉටු කිරීම මණ්ඩලයේ කාර්යය මණ්ඩලය සමඟ ඒකාබද්ධව සිදු කිරීම මෙම විෂය පථයට ඇතුලත් විය. ඒ අනුව එම මෘදුකාංග පද්ධතිය පිළිබදව මණ්ඩලයේ කාර්යය මණ්ඩලය, සේවා ආයතනයේ නිලධාරීන් සමඟ එක්ව කටයුතු කිරීමේදි එහි සියළුම ක්‍රියාවලීන් පිළිබදව මණ්ඩලයේ කාර්යය මණ්ඩලයට අවබෝධයක් ලැබෙන බැවින් එලෙස විෂය පථයට නිෂ්චය කර තිබුණි.<br><br>ඒ අනුව ඊට අදාලව ලංසු ලියවිලි කෙටුම්පත් කල අතර එහෙත් ඒ සදහා යෙදවිය යුතු මණ්ඩලයේ කාර්යය මණ්ඩලයක් මෙම ආයතනයේ දැනට නොමැති බැවින් මුලිකව අදාල මෙහෙයුම් ක්‍රියාවලිය සදහා අවශ්‍ය වන මානව සම්පත් නිශ්චය කොට ඒ සදහා සුදුසු කාර්යය මණ්ඩලය බදවා ගැනිම හා ඉන් අනතුරුව එම ක්‍රියාවලිය ආරම්භ කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත.<br><br>ඒ බැවින් ප්‍රසම්පාදන ක්‍රියාවලියන් මගින් තොරාගනු ලබන ආයතනයේ කාර්යය මණ්ඩලයේ ඉංජිනේරුවන් දෙදෙනෙකු වසර 02ක කාලයක් සේවා සැපයිම හා වසර දෙකෙන් පසු වසර 05ක් දක්වා කාලය සදහා අවශ්‍යතාවය මත සේවා දිර්ඝ කිරිමේ පහසුකම් තබාගනිමින් මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කිරීම සදහා හැකිවන සේ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ලංසු ලියවිලි කෙටුම්පත් කර තිබුණි.<br><br>තොරතුරු තාක්ෂණ අංශයේ දැනට සිටින කාර්යය මණ්ඩලය දෛනික සෙසු මෙහෙයුම් ක්‍රියාවලියට සම්බන්ධව කටයුතු කරන බැවින් එම කාර්ය මණ්ඩලය යෝජිත ලොතරැයි මෙහෙයුම් මෘදුකාංග පද්ධතියේ රාජකාරි කටයුතු සදහා යෙදවිය නොහැකි බැවින් මෙම නව අවශ්‍යතාවය සදහා ඒ අනුව නව නිලධාරින් බදවා ගැනිමට හදුනා ගෙන ඇත. ඒ අනුව අනුමත බදවා ගැනිමේ පටිපාටිය අනුව (IT Assistant) දෙදෙනෙකු බදවා ගැනිමට හැකියාව තිබූ බැවින් එවැනි නිලධාරින් දෙදෙනෙකු බදවා ගැනිමට 2021 වර්ෂයේදී විවෘත අයදුම්පත් කැදවන නමුත් ඒ සදහා අපේක්ෂිත සුදුසුකම් හා පළපුරුද්ද සහිත අයදුම්කරුවන් නොසිටි අතර එම කටයුත්තද සාර්ථක නොවිය.<br><br>විශේෂයෙන් තොරතුරු තාක්ෂණ වෙළදපලෙහි පවතින ඉහළ වැටුප් ප්‍රමාණය හේතු කොට ගෙන රාජ්‍ය අංශයේ පවතින වැටුප් ප්‍රමාණය සදහා තොරතුරු තාක්ෂණ වෘත්තිකයින් ආකර්ශණය කර ගැනිමට නොහැකි වී ඇත.</td></tr>
</table>

| විගණකාධිපති වාර්තාවේ සඳහන් කරුණු | කළමණාකරණය විසින් ගනු ලැබූ පියවර |
| --- | --- |
| | මෙම තත්වය තුල මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ අංශයේ කාර්යය මණ්ඩලය රහිතව මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කිරීමේ කාර්යයට අදාල ප්‍රසම්පාදන කටුයුතු ඉටු කිරීම නිශ්ඵල ක්‍රියාවක් වු බැවින් මුලික හා අත්‍යවශ්‍ය එම මානව සම්පත් අවශ්‍යතා නිශ්චය කර ගැනිමෙන් පසු මෙම මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කිරීමේ කටයුතු ඉටුකල යුතු බවට හදුනා ගන්නා ලදි. |
| | විශේෂයෙන් මණ්ඩලය දෛනිකව සිදු කෙරෙන ලොතරැයි මෙහෙයුම් ක්‍රියාවලියේදී මණ්ඩලය විසින් වරින් වර ලොතරැයි ටිකට්පත්වල ත්‍යාග රටාවේ වෙනස් කිරීම විශේෂ දිණුම් ඇදීමේ සිදු කිරීමට සිදුවු බැවින්, ඊට අදාලව මෘදුකාංග පද්ධතිය (Software Modification) කිරීම සදහා දෛනික මෙහෙයුම් ක්‍රියාවලියේ පැන නැගෙන දෝෂ නිවැරදී කිරීම සිදු කල යුතුව ඇත.<br><br>මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කලද, එවායේ (Source Cord) මණ්ඩලයට ලැබුණද එහි ව්‍යුහාත්මක වෙනස්කම් සරලව සිදු කල නොහැක. ඒ අනුව මණ්ඩලයේ කාර්යය මණ්ඩලයට මෙම මෘදුකාංග පද්ධතියේ ව්‍යුහය පිළිබදව අවබෝධයක් ලබා ගැනිම සදහා සාධාරණ කාලයක් ගතවනු ඇත. එහෙත් දෛනිකව සිදු කෙරෙන ලොතරැයි මෙහෙයුම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමට පහසුකම් ඇති කරලීය යුතුවේ.<br><br>එමෙන්ම 2023.02.14 දින තොරතුරු තාක්ෂණ කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල්ගේ මුලිකත්වයෙන් සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ නිලධාරී පුරප්පාඩු සහ නව තොරතුරු පද්ධතිය ක්‍රියාත්මක කිරීම පිළිබදව සාකච්ජා කරන ලදි. එහිදි මණ්ඩලයේ පවතින මෙම අවශ්‍යතාවය පිළිබදව දිර්ඝව සාකච්ජා කරන ලදි.<br><br>එම සාකච්ජාවේදීද දැනටමත් මණ්ඩලය විසින් ලංසු ලියවිලි කෙටුම්පත් කර ඇති ඉහත සදහන් මොඩලයට අතිරේඛව මුලික ආයෝජන අවමවන අයුරින් හා මණ්ඩලයේ ස්ථිර තොරතුරු තාක්ෂණ මානව සම්පත් අවම වශයෙන් යොදා ගන්නා ආකාරයේ මොඩලයක් පිළිබදවද නැවත අවධානය යොමු කරන ලෙසද උපදෙස් දෙන ලදි. එමෙන්ම එහිදිද පවතින තොරතුරු තාක්ෂණ වෘත්තියවේදීන්ගේ ඉහල වැටුප් පැවතිම මත මණ්ඩලයේ මෙහෙයුම් පිරිවැය ඉහල යාම පිළිබදව එවන් අපහසුතාවයක් පිළිබදව සාකච්ජා කරන ලදි.<br><br>එම කරුණ පිළිබදවද තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත නැවත දැක්වු අතර පසුව දිර්ඝ වශයෙන් එම කාරනා සහ සම්බන්ධයෙන් සාකච්ජාකරන ලද මෙම මෘදුකාංග පද්ධතියේ ස්වභාවය අනුව මුලික මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කිරිමෙන් අනතුරුව මණ්ඩලය විසින් අවස්ථානුකූලව සිදු කරනු ලබන ලොතරැයි අලෙවි ප්‍රවර්ධන වැඩසටහන්වලට අදාලව මෘදුකාංගමය නවීකරණය (Software Modification) සිදු කල යුතුව ඇත. එවැනි නවීකරණය (Software Modification) සිදු කිරීමේදී එම මෘදුකාංගයේ ව්‍යුහමය නවීකරණ කටයුතුවන බැවින් එවා සැපයුම් ආයතනය වෙතින්ම පමණක් සිදු කල යුතුව ඇත. එවන් අවස්ථාවලදී එම (Software Modification) කටයුතු අතිරේඛ පිරිවැය ඇස්තමේන්තුවකට ආදාලව සැපයුම් ආයතනය වෙතින්ම දිර්ඝකාලීනව ඉටුකරවා ගැනිම හා ලොතරැයි මෙහෙයුම් ක්‍රියාවලිය දෛනිකව සිදු කිරීම මණ්ඩලයේ කාර්යය මණ්ඩලය මඟින් සිදු කිරීමේ පදනම මත මෙම ව්‍යාපෘතිය ඉටු කිරීම යෝග්‍ය බවට අවසන් වශයෙන් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් විෂය පථයේ නිශ්චය කර ඇත. තොරා ගන්නා සැපයුම් ආයතනයේ සේවා සැපයීමේ බැදියාව පවත්වා ගෙන යාම වෙනුවෙන් වාර්ෂික නඩත්තු ගිවිසුමක්ද (Maintenance Agreement) එලැබිමද ඇතුලත් කර ඇත. |
| | ඊට අනුරූපීව නැවතත් ලංසු ලේඛණ පිලියෙල කල අතර මෙම කාර්යාලයට අදාලව මණ්ඩලයේ මානව සම්පත් අවශ්‍යතාවයද නිශ්චය කොට ඇත. එසේම යෝජිත මානව සම්පත්වල පිරිවැය සැලකිල්ලට ගෙන වර්ථමානයේ එම සේවාව පුද්ගලික සමාගමක් මඟින් ලබා ගන්නා බැවින් ඒකී පිරිවැය සමඟ මණ්ඩලයට එම නව කාර්යය මණ්ඩලය බදවා ගැනිමේදි දැරීමට සිදුවන පිරිවැයද සංසන්දනය කිරීමක් සිදු කර ඇත. ඒ අනුව මණ්ඩලයට එම කාර්යය මණ්ඩලය බදවා ගෙන සේවා ලබා ගැනිම පිරිවැය අතින් වාසිදායක බවට හදුනා ගෙන ඇත. |

| විගණකාධිපති වාර්තාවේ සඳහන් කරුණු | කළමණාකරණය විසින් ගනු ලැබූ පියවර |
|---|---|
| | ඒ අනුව මණ්ඩලයට නව ලොතරැයි කළමනාකරණ මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීම වෙනුවෙන් අවශ්‍ය කාර්යය මණ්ඩලය හදුනා ගෙන එම මානව සම්පත් අවශ්‍යතාවය අධ්‍යක්ෂක මණ්ඩලයේ අවධානයට ඉදිරිපත් කර ඇති අතර, එම කාර්ය මණ්ඩලය බඳවා ගැනිම සඳහා නැවත ඉදිරි පියවර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියට යටත්ව සිදු කිරීමට අධ්‍යක්ෂක මණ්ඩලය තීරණය කර ඇත.<br><br>එලෙස තොරතුරු තාක්ෂණ කාර්යය මණ්ඩලය බඳවා ගැනිමට අදාල මූලික අනුමැතීන් ලැබීමෙන් පසු සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලොතරැයි කළමනාකරණ මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කිරීමේ ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කරන බව දන්වමි.<br><br>ඉහත තත්වය තුල යෝජිත ලොතරැයි කළමනාකරණ මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කිරීමට අදාල කටයුතු ඉටුවී නොමැති අතර එම සේවාවන් දැනට මණ්ඩලයට සේවා සපයන (LMS Technologies PVT Limited) ආයතනය වෙතින් ලබා ගනු ලබයි.<br><br>කෙසේ වෙතත් ලොතරැයි කළමනාකරණ මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කිරීම හා මෙහෙයුම් කටයුතු සඳහා භාවිත කිරීම ඊට ගැලපෙන සුදුසුකම්ලත් තොරතුරු තාක්ෂණ වෘත්තීයවේදීන්ගෙන් සමන්විත සිදුකල යුතු කාර්යයක් බැවින් ඉහත විස්තර දක්වා ඇති පරිදි මීට අදාලව ඉදිරි කටයුතු සිදු කිරීමට බලාපොරොත්තුවන බව ද දන්වා සිටිමි. |
| (ආ) සංවර්ධන ලොතරැයි මණ්ඩලය සහ මෘදුකාංග සේවා සැපයුම් සමාගම අතර 2009 අගෝස්තු 18 දින ඇතිකරගත් ගිවිසුම ප්‍රකාරව මෘදුකාංග සේවා සැපයුම් සමාගම ලබාදෙන සේවාවන් සම්බන්ධ පද්ධති විගණනයක් සිදුකිරීමට මණ්ඩලයට බලය ලැබී තිබුණද මණ්ඩලය විසින් ඒ සම්බන්ධව සමාලෝචිත වර්ෂයේදී කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කිරීමට අදහස් කර ඇත. දැනට LMS මගින් ලබාගෙන ක්‍රියාත්මක වන තොරතුරු තාක්ෂණ පද්ධතිය වෙනුවට නව තොරතුරු තාක්ෂණ පද්ධතියක් ලබා ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුලින් තෝරා ගැනීමට මූලික කටයුතු මේ වන විටත් සිදු කර ඇති බැවින් හා තොරතුරු තාක්ෂණ පද්ධතිය විගණනය සඳහා දැරීමට සිදු වන විශාල පිරිවැය පිළිබඳ සලකා බලා ඉදිරියේදී මේ පිළිබඳව තීරණ ගැනීමට යෝජිතය. |
| (ඇ) අධ්‍යක්ෂක මණ්ඩලයේ සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරණ මෙහෙයුම් කාර්ය සංග්‍රහයේ 3.2 (V) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව අනුමත කරන ලද දිරිදීමනා ගෙවීමේ පටිපාටියකින් තොරව සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය තුලදී එකතුව රු.105,739,646 ක මුදලක් දිරි දීමනා ලෙස කාර්ය මණ්ඩලයට ගෙවා තිබුණි. | සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා දිරිදීමනාවක් ගෙවීම මණ්ඩලයේ ආරම්භයේ සිට සිදු කර ඇති අතර ආරම්භක අවස්ථාවන් වලදී මෙම දිරිදීමනා ප්‍රතිශතයන් හා ගෙවනු ලබන ආකාරයන් අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය යටතේ සිදු කර ඇත. වර්තමානයේ ගෙවනු ලබන දිරිදීමනාවේ ප්‍රතිශතය සඳහා විශේෂ අනුමැතියක් මුදල් අමාත්‍යාංශයෙන් 2016.04.17 දිනැති ලිපිය මගින් හිමි වී ඇත. මෙම මූලික ප්‍රතිශතය යටතේ සේවක කණ්ඩායම් අතර දිරිදීමනාව ගැලපුම් කිරීම බර තැබූ අනුපාතයක් මත සිදු කර ඇත. ඒ අනුව ගෙවන ලද දිරිදීමනාව රු.105,739,646/- මුදලක් වේ. මණ්ඩලය විසින් දිරිදීමනාව ගෙවීමේ ක්‍රමවේදය ඇතුලත් නව ක්‍රමවේදයක් සකස් කර 2024 මැයි 20 වන දින පැවති 294 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හිමි වූ අතර ඉදිරියේදී ඒ සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත. |
| (ඈ) සමාලෝචිත වර්ෂයේ රු.25,442,131,713 ක් වූ ලොතරැයි එකතුකල අගය මත බදු පසු විකුණුම් ආදායම පසුගිය වර්ෂයට සාපේක්ෂව රු.6,370,674,962 කින් හෙවත් සියයට 33 කින් වැඩිවී තිබූ නමුදු පසුගිය වර්ෂයේ ශුද්ධ ලාභ අනුපාතය වූ සියයට 17, සමාලෝචිත වර්ෂයේදී සියයට 14 දක්වා අඩුවී තිබුණි. 2022 වර්ෂයට සාපේක්ෂව බෙදාහැරීමේ පිරිවැය සියයට 49 කින් සහ පරිපාලන වියදම් සියයට 17 කින් වැඩිවීම මෙයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි. පසුගිය වර්ෂය හා සැසඳීමේදී එම වියදම් වර්ග දෙකේ වැඩිවීම රු.2,319,819,639 ක් විය. | 2022 වර්ෂයේ 8% ක මට්ටමක පැවති VAT බදු අනුපාතය 2023 වර්ෂයේ දී 18% දක්වා වර්ධනය වීම හා SSCL බද්ද හේතුවෙන් හා රට තුළ පැවති ආර්ථික අස්ථාවරත්වය හේතුවෙන් සිදු වූ අමු ද්‍රව්‍ය හා සේවා වල මිල ගණන් ඉහළ යාම මත 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ වියදම් වැඩිවීම හා ලාභාන්තිකය පහළ යාම සිදුවී ඇත. |

<table>
<tr><th>විගණකාධිපති වාර්තාවේ සඳහන් කරුණු</th><th>කළමණාකරණය විසින් ගනු ලැබූ පියවර</th></tr>
<tr><td>(ඉ) අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය මත සංවර්ධන ලොතරැයි මණ්ඩලය සඳහා ව්‍යාවසාය සම්පත් සැලසුම්කරණ (ERP) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට 2019 වර්ෂයේ සැලසුම් කර තිබුණි. මෙම ව්‍යාපෘතියේ පළමු අදියර ලෙස ගිණුම්කරණ මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීමේ කාර්යය 2020 වර්ෂයේ සිට සෑම වර්ෂයකම ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කර තිබුණද එම ප්‍රසම්පාදන කටයුතු සමාලෝචිත වර්ෂයේ අවසානය තෙක් ආරම්භ කර නොතිබුණි.</td><td>මෙම ඡේදයේ දක්වා ඇති පරිදි ආයතනය සඳහා ERP පද්ධතියක් ස්ථාපිත කිරීමට සැලසුම් කර තිබුනි. ඒ අනුව මණ්ඩලයේ සමස්ථ මෙහෙයුම් ක්‍රියාවලියට අදාල අවශ්‍යතාවය නිශ්චය කොට එක් එක් අංශ මට්ටමින් ඉටු කෙරෙන ක්‍රියාවලිය අධ්‍යනය කොට එහි විෂය පථය ඇතුලත් වාර්තාවක්ද පිළියෙල කර ඇත.පසුව මෙම ව්‍යාපෘතියේ පළමු අදියර ලෙස ගිණුම්කරණ මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීමට තීරණය කර තිබූ අතර එම කාර්යය 2023 වර්ෂයේදී ආතර් සී. ක්ලාක් මධ්‍යස්ථානය වෙත භාර දී තිබුනි. එහෙත් එම ආයතනය පසුව එම කාර්යය ඉටුකිරීම ප්‍රතික්ෂේප කර ඇති බැවින් මේ සඳහා නැවතත් තරඟකාරී ලංසු මිල ගණන් කැඳවා සුදුසු සැපයුම්කරුවෙකු තෝරා ගැනීමට කළමනාකාරීත්වය තීරණය කර ඇත.</td></tr>
<tr><td>(ඊ) මණ්ඩලය විසින් වොක්ෂෝල් වීදියේ අංක 234 දරන ගොඩනැගිල්ල 2006 ඔක්තෝබර් මාසයේ සිට කුලී පදනම මත ලබාගැනීම සඳහා එළඹුණු ගිවිසුම ඒකපාර්ශිකව කඩ කර තිබීම නිසා තැන්පතු මුදල ලෙස ගෙවූ රු.723,780 ක් හා එම වර්ෂයන් සඳහා ගෙවූ කුලී මුදලින් කොටසක් වන රු.4,976,220 ක් යන මුදල්වල එකතුව වන රු.5,700,000 ක් දැනට වර්ෂ 17 ක් මුළුල්ලේ අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.</td><td>වොක්ෂෝල් වීදියේ අංක 234 දරණ ගොඩනැගිල්ල කුලියට ගැනීමට අදාලව මණ්ඩලයට ලැබිය යුතු රු.5,700,000 ක මුදල අය කර ගැනීම සම්බන්ධව මුදල් අමාත්‍යාංශයේ කමිටුවක් පත් කර වාර්තාවක් ලබා ගත් අතර එම වාර්තාවේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ඉදිරි නීතිමය කටයුතු නීතිපති දෙපාර්තමේන්තුව විසින් සිදු කරගෙන යනු ලබයි. ඊට අදාල සියලු තොරතුරු මේ වන විට නීතිපති දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇත. අදාල තොරතුරු ලැබුණු බවටද නීතිපති දෙපාර්තමේන්තුව සනාථ කර ඇත. නමුත් මේ සම්බන්ධව ගෙන ඇති ක්‍රියාමාර්ග වල ප්‍රගතිය නීතිපති දෙපාර්තමේන්තුවෙන් නොලැබුණු බැවින් 2023.07.24 දිනැතිව නැවත ලිපියක් යොමු කරමින් නීතිපති දෙපාර්තමේන්තුවෙන් මේ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබදව විමසීමක් සිදු කර ලදී</td></tr>
<tr><td>(උ) 1990 වර්ෂයේ වෝඩ් පෙදෙසේ පුද්ගලයෙකු සමඟ ඇතිකරගෙන තිබූ කුලී ගිවිසුම ප්‍රකාරව රු.2,520,000 ක ගොඩනැගිලි කුලී තැන්පතු මුදලක් අයකර දෙන ලෙස ඉල්ලා අවුරුදු 23 කට පෙර ගොනුකර තිබූ නඩුවේ තීන්දුව 2016 ජනවාරි 11 දින ලැබී තිබුණි. අදාල මුදල අයකර ගන්නා ලෙස නඩු තීන්දුව ප්‍රකාශ වී වර්ෂ 07 කට ආසන්න කාලයක් ගත වී තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම මුදල අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.</td><td>එම්.ඒ.එම්.අමීන් මහතාගෙන් මෙම මුදල අය කර ගැනීම සඳහා වන අධිකරණ ක්‍රියාමාර්ගයේ අවසන් අදියරයේ පවතින බව රජයේ නීතිඥවරිය විසින් ලිඛිතව 2023.10.25 වන දින අප වෙත දන්වා ඇත.</td></tr>
<tr><td>(ඌ) 2023 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයහිමි ගිණුමේ රු.414,095,595 ක ශේෂයක් පැවති අතර එය තුල වසර 1 ත් 2 ත් අතර කාලයක් තුල පවතින රු.207,860 ක ශේෂයක්ද, වසර 3 ඉක්මවූ රු.2,800,000 ක ශේෂයක්ද විය. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ණය ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.</td><td>2023 දෙසැම්බර් 31 දිනට උපචිත වියදම් ගිණුමේ  වසර 1 ත් 2 ත් අතර කාලය තුළ පවතින රු. 207,860/- ක ශේෂය පහත සදහන් වියදම්වලින් සම න්විත වේ.
<table>
<tr><td>සරත් ජයතිලක</td><td>ඉංජිනේරු වෘත්තීය ගාස්තු</td><td>Rs. 45,000/-</td></tr>
<tr><td>Master Athletic Sri Lanka</td><td>Sponsor for Athletic Championship</td><td>Rs. 60,000/-</td></tr>
<tr><td>Dehiwala Zoo Welfare Association</td><td>Sponsor for Cricket Match</td><td>Rs 20,000/-</td></tr>
<tr><td>Parliamentary Service Assistant Friendship Association</td><td>Sponsor for Annual Meeting</td><td>Rs. 50,000/-</td></tr>
<tr><td>A.K.K.Engineering (Pvt) Ltd</td><td>ආයතනයේ ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීම සදහා ගෙවීමේ රදවාගත් මුදල</td><td>Rs. 32,860/-</td></tr>
<tr><td></td><td>එකතුව</td><td>Rs. 207,860/-</td></tr>
</table>
මෙම ශේෂයන්  ඉදිරියේ දී ගෙවීමට නියමිත බැවින් 2023 වර්ෂයේ අවසාන ගිණුම්වල වෙළඳ ණයහිමි ගිණුමේ ශේෂය තුළ ඇතුළත් කර ඇති අතර ගෙවීම් නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ.<br><br>වසර 3 ඉක්මවූ රු.2,800,000 ක ශේෂය වන්නේ සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ කාර්ය පරිපාටිය සකස් කිරීම සම්බන්ධව රංජිත් තේනුවර මහතාට ගෙවිය යුතු මුදල වේ. මෙම කාර්යයේ අවශ්‍ය සංශෝධන අවසන් කර නොමැති බැවින් මේ දක්වා ගෙවීම් අත්හිටුවා ඇත.</td></tr>
</table>

| විගණකාධිපති වාර්තාවේ සඳහන් කරුණු | කළමණාකරණය විසින් ගනු ලැබූ පියවර |
|---|---|
| (එ) දැනට ලෝකයේ පවත්නා තාක්ෂණික නැඹුරුව හා ලොතරැයි වෙළඳපොලේ පවත්නා තරඟකාරිත්වය සැලකිල්ලට ගෙන ලොතරැයි අලෙවිය ඩිජිටල් මාධ්‍ය භාවිතා කර සිදුකිරීම සඳහා ඩිජිටල් යෙදවුමක් DLB Sweep නමින් ආරම්භ කර SMS මාධ්‍ය හරහා E ලොතරැයි අලෙවි කිරීම, අලෙවි ප්‍රවර්ධනය ඇතුළු කාර්යයන් සඳහා 2023 වර්ෂයේ අයවැය මඟින් රු.57,625,000 ක මුදලක් උපයෝජනය කිරීමට සැලසුම් කර තිබුණද 2023 වර්ෂයේ E ලොතරැයි අලෙවි  ප්‍රවර්ධන කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණේ රු.1,643,873 ක මුදලක් පමණක් වූ අතර එය ඇස්තමේන්තුගත මුදලින් සියයට 3 ක් පමණ වැනි ඉතා පහළ ප්‍රතිශතයක් විය. | ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් මත මෙම යෙදවුම නිර්මාණය වූ බැවින් මෙම යෙදවුමට ඇතුළත් වීමේ යම් යම් ප්‍රායෝගික අපහසුතාවලට පාරිභෝගිකයාට මුහුණ දීමට සිදු වීම හේතුවෙන් මෙම යෙදවුම හරහා අලෙවිය සිදු කිරීමේ ගැටළු පැවතුනි. ඒ අනුව මෙම යෙදවුම ප්‍රවර්ධනය කිරීම සඳහා එම බාධක නිවැරදි කර පසුව ප්‍රවර්ධන කටයුතු සිදු කරන ලෙස 2022 සැප්තැම්බර් 28 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේදී ඒ වෙනුවෙන් ඉදිරිපත් කරන ලද 2022/09/2015 අංක දරණ පත්‍රිකාව මඟින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් උපදෙස් ලබා දී ඇත. ඒ බැවින් ප්‍රවර්ධන කටයුතු සඳහා වෙන් කර තිබූ වෙන් කිරීම් සම්පූර්ණයෙන් භාවිතා කිරීමට නොහැකි විය. |

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශය



| දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා | සටහන් | 2023<br>රු. | 2022<br>රු. |
|---|---|---|---|
| **ආදායම** | 01 | 25,442,131,713 | 19,071,456,751 |
| ටිකට්පත් පිරිවැය | 02 | 1,147,660,028 | 844,240,759 |
| ත්‍යාග ගෙවීම | 03 | 13,450,963,612 | 9,884,078,986 |
| දිනුම් ඇදීමේ පිරිවැය | 04 | 826,071,896 | 751,141,022 |
| **දළ ලාභය** | | 10,017,436,178 | 7,591,995,984 |
| වෙනත් ආදායම් | 05 | 434,981,322 | 320,846,644 |
| බෙදාහැරීමේ පිරිවැය | 06 | 6,704,738,408 | 4,487,324,271 |
| පරිපාලන වියදම් | 07 | 707,503,423 | 605,097,921 |
| **මෙහෙයුම් වියදම් වලින් පසු අතිරික්තය** | | 3,040,175,668 | 2,820,420,437 |
| මූල්‍ය පිරිවැය | 08 | 663,431 | 979,196 |
| ලබා නොගත් ත්‍යාග | | 476,784,240 | 447,150,260 |
| **බදු පෙර ලාභය** | | 3,516,296,477 | 3,266,591,501 |
| ආදායම් බදු | 09 | (106,210,247) | 55,904,459 |
| **ආදායම් බදු පසු ලාභය** | 10 | 3,622,506,725 | 3,210,687,041 |
| **වෙනත් විස්තීර්ණ ආදායම** | | | |
| සේවක ප්‍රතිලාභ සැලසුම් නැවත මිනුම් කිරීම මත ලාභ/පාඩු | 17.1 | (5,576,996) | 9,112,463 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | | 1,648,326,333 | 5,853,857 |
| **වසර සඳහා මුළු වෙනත් විස්තීර්ණ ආදායම** | | 5,265,256,062 | 3,225,653,361 |

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටියි. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

**ඩබ්.ඒ.වී.සී. සෝමරත්න**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)

**අජිත් ගුණරත්න නාරගල**
සභාපති/ප්‍රධාන විධායක නිලධාරී

**ජෙනට් ජයවර්ධන**
අධ්‍යක්ෂ

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා | සටහන් | 2023 රු. | 2022 රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | 11 | | |
| දේපල, පිරියත හා උපකරණ | | 2,703,367,049 | 1,082,575,630 |
| ප්‍රාග්ධන නොනිමි වැඩ | | 8,550,596 | 3,228,884 |
| **අස්පෘශ්‍ය වත්කම්** | 11 | 6,130,310 | 9,488,402 |
| **මුළු ජංගම නොවන වත්කම** | | 2,718,047,956 | 1,095,292,917 |
| | | | |
| **ජංගම වත්කම** | | | |
| තොග | 13 | 56,720,455 | 45,970,611 |
| වෙළෙඳ ණයගැතියෝ සහ වෙනත් ලැබිය යුතු | 14 | 207,964,715 | 163,480,972 |
| පූර්ව ගෙවීම් සහ තැන්පතු | 15 | 4,748,286 | 6,223,428 |
| ස්ථාවර තැන්පතු | 12 | 1,710,213,172 | 1,742,324,887 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | 16 | 767,981,019 | 557,240,367 |
| **මුළු ජංගම වත්කම්** | | 2,747,627,647 | 2,515,240,265 |
| **මුළු වත්කම** | | 5,465,675,603 | 3,610,533,182 |
| | | | |
| **ස්කන්ධය හා වගකීම්** | | | |
| **දායක කළ ප්‍රාග්ධනය** | | | |
| ජනාධිපති අරමුදල | | 2,200,000 | 2,200,000 |
| මහපොල භාර අරමුදල | | 2,200,000 | 2,200,000 |
| ත්‍යාග සංචිත ගිණුම | | 139,106,256 | 725,956,289 |
| ජනාධිපති අරමුදලට ගෙවිය යුතු | | 682,730,725 | 315,791,041 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | | 2,268,909,427 | 620,583,095 |
| සේවක ප්‍රතිලාභ සැලසුම් නැවත මිනුම් කිරීම මත ලාභ/(පාඩු) | | 6,259,359 | 11,836,354 |
| **මුළු ස්කන්ධය** | | 3,101,405,767 | 1,678,566,779 |
| | | | |
| **ජංගම නොවන වගකීම්** | | | |
| සේවක ප්‍රතිලාභ වගකීම් | 17 | 9,081,293 | (4,438,730) |
| ගෙවිය යුතු අලෙවි නියෝජිත සහ බෙදාහැරීමේ අලෙවි නියෝජිත තැන්පතු | 18 | 39,875,881 | 38,718,881 |
| **මුළු ජංගම නොවන වගකීම්** | | 48,957,174 | 34,280,151 |
| | | | |
| **ජංගම වගකීම්** | | | |
| වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතු | 19 | 690,726,582 | 771,026,177 |
| ගෙවිය යුතු ත්‍යාග | 20 | 1,456,785,350 | 1,003,306,515 |
| ගෙවිය යුතු ණය වව්චර් | | 167,800,730 | 123,353,560 |
| **මුළු ජංගම වගකීම්** | | 2,315,312,663 | 1,897,686,252 |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | 5,465,675,603 | 3,610,533,182 |

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටියි. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

**ඩබ්.ඒ.වී.සී. සෝමරත්න**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)

**අජිත් ගුණරත්න නාරගල**
සභාපති/ප්‍රධාන විධායක නිලධාරී

**ජෙනට් ජයවර්ධන**
අධ්‍යක්ෂ

# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා | සටහන් | 2023<br>රු. | 2022<br>රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහ** | | | |
| බදු පෙර ලාභය | | 3,516,296,477 | 3,266,591,501 |
| | | | |
| **ගැළපීම්** | | | |
| ස්ථාවර වත්කම් මත අගය ක්ෂය කිරීම | | 79,161,279 | 76,864,509 |
| ත්‍යාග සංචිත ගිණුම | | (586,850,033) | 277,824,641 |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | | 8,722,804 | 9,482,677 |
| ගෙවන ලද පාරිතෝෂික | | (6,884,568) | (1,330,145) |
| පොලී ආදායම | | (399,449,492) | (276,451,109) |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලැබුණු ලාභය | | (354,582) | (485,143) |
| ගෙවන ලද ආදායම් බදු | | (106,187,260) | |
| ජනාධිපති අරමුදලට ගෙවන ලද මුදල් | | (3,255,567,041) | (3,459,115,473) |
| **කාරක ප්‍රාග්ධන වෙනස් වීම්වලට පෙර මෙහෙයුම් ලාභය** | | (751,112,417) | (106,618,541) |
| | | | |
| **මෙහෙයුම් වත්කම්වල වැඩිවීම/අඩුවීම** | | | |
| බඩු තොග වැඩිවීම/අඩුවීම | | (10,749,844) | (2,868,343) |
| ණය ගැතියන් වැඩිවීම/අඩුවීම | | (57,711,291) | (8,696,537) |
| තැන්පතු සහ පෙර ගෙවීම් වැඩිවීම/අඩුවීම | | 1,475,142 | 4,918,515 |
| | | | |
| **මෙහෙයුම් වගකීම්වල වැඩිවීම/අඩුවීම** | | | |
| ණය හිමියන් වැඩිවීම/අඩුවීම | | 124,681,357 | 74,565,122 |
| ගෙවියයුතු ත්‍යාග වැඩිවීම/අඩුවීම | | 453,478,836 | 40,513,411 |
| ණය වවුචර් වැඩිවීම/ අඩුවීම | | 44,447,170 | (6,914,700) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් සිදු වූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | | (195,491,046) | (5,101,074) |
| | | | |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුළින් සිදු වූ මුදල් ප්‍රවාහ** | | | |
| කාර්ය මණ්ඩලයට ලබා දුන් ණය ලැබීම් | | 21,169,588 | 22,222,066 |
| කාර්ය මණ්ඩලයට ලබාදුන් ණය | | (7,288,747) | (26,564,736) |
| ස්ථාවර වත්කම් එකතු කිරීම් (දේපළ, පිරියත සහ උපකරණ) | | (46,909,193) | (7,942,228) |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලැබූ ලාභය | | 437,053 | 649,759 |
| පොලී ආදායම | | 399,449,492 | 276,451,109 |
| ස්ථාවර තැන්පත්වල ආයෝජන | | 38,216,505 | (603,534,878) |
| බෙදාහැරීමේ අලෙවි නියෝජිත තැන්පතු වල වැඩි වීම | | 1,157,000 | 1,054,000 |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුළින් සිදු වූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | | 406,231,698 | (337,664,908) |
| | | 210,740,651 | (342,765,983) |
| මුදල් සහ මුදල් හා සමාන දෑ වැඩිවීම/අඩුවීම | | 210,740,651 | (342,765,983) |
| වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ | | 557,240,367 | 900,006,350 |
| වර්ෂය අවසානයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ | 16 | 767,981,019 | 557,240,367 |
| | | | |
| බැංකුවේ ඇති මුදල — ලංකා බැංකුව | | 342,627,989 | 264,588,741 |
| මහජන බැංකුව | | 424,314,375 | 288,958,323 |
| සම්පත් බැංකුව | | | 3,139,750 |
| හැටන් නැෂනල් බැංකුව | | 1,029,250 | 544,150 |
| | | | |
| අත ඇති මුදල | | 9,404 | 9,404 |
| | | 767,981,019 | 557,240,367 |

# හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය



| | ජනාධිපති අරමුදල සහ මහපොල භාර අරමුදල | ත්‍යාග සංචිත ගිණුම | රඳවාගත් ඉපැයීම් | ප්‍රත්‍යාගණන සංචිතය | සේවක ප්‍රතිලාභ සැලසුම් නැවත මිනුම් කිරීම මත ලාභ/පාඩු | එකතුව |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 2022.01.01 දිනට ශේෂය | 4,400,000 | 448,131,648 | 564,219,474 | 614,729,237 | 2,723,892 | 1,634,204,250 |
| 2022 වර්ෂය තුළ එකතු කිරීම් | | 277,824,641 | 3,210,687,041 | 5,853,857 | 9,112,463 | 3,503,478,003 |
| ප්‍රත්‍යාගණන සංචිතය | | | | | | |
| ජනාධිපති අරමුදලට විසර්ජනය කිරීම 2022 | | | (3,459,115,473) | | | (3,459,115,473) |
| 2022.12.31 දිනට ශේෂය | 4,400,000 | 725,956,289 | 315,791,041 | 620,583,095 | 11,836,354 | 1,678,566,779 |
| 2023 වර්ෂය තුළ එකතු කිරීම් | | (586,850,033) | 3,622,506,725 | 1,648,326,333 | (5,576,996) | 4,678,406,029 |
| වර්ෂය සඳහා ජනාධිපති අරමුදලට ගෙවීම් | | | (3,255,567,041) | | | (3,255,567,041) |
| 2023.12.31 දිනට ශේෂය | 4,400,000 | 139,106,255 | 682,730,725 | 2,268,909,427 | 6,259,359 | 3,101,405,767 |

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

## 1. වාර්තාකරණ ආයතනය

සංවර්ධන ලොතරැයි මණ්ඩලය 1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත යටතේ සංස්ථාගත කරන ලදී. මණ්ඩලයේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය අංක 356, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත, යුනියන් පෙදෙස, කොළඹ 02 වේ. මෙම වර්ෂය තුළ දී මණ්ඩලයේ ප්‍රධානතම ක්‍රියාකාරකම වූයේ ලොතරැයි අලෙවි කිරීමයි.

## 2. සකස් කිරීමේ පදනම

### 2.1. අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද, මෙහි මින් මතු SLFRS/LKAS යනුවෙන් හඳුවන්වනු ලබන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ ශ්‍රී ලංකා රජයේ මුදල් රෙගුලාසි වල සහ පරිපාලන රෙගුලාසි වල සඳහන් නියමයන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

### 2.2. මිනුම් කිරීමේ පදනම

ස්ථාවර තැන්පතු මත ආයෝජන (සාධාරණ අගයට මනින ලද), ඉඩම් හා ගොඩනැගිලි (ප්‍රත්‍යාගණනය කළ වටිනාකම්), සහ පාරිතෝෂික සඳහා වෙන්කිරීම් (පාරිතෝෂික සූත්‍රය භාවිතයෙන් ගණනය කළ සහ නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන අගයට හඳුනාගත්) හැරෙන්නට මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනමින් සකස් කර ඇත.

### 2.3. මුදල් ඒකකය

ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇති සියුලම මූල්‍ය තොරතුරු ආසන්න රුපියලට වටයා ඇත.

### 2.4. නිකුත් කිරීම සඳහා අවසර ලබා දුන් දිනය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට 2024 පෙබරවාරි 21 වැනි දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමැතිය දී ඇත.

### 2.5 ඇස්තමේන්තු හා විනිශ්චයන් යොදා ගැනීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති කරනු ලබන වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් ප්‍රමාණයන්ට බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කළ යුතු වේ. විනිශ්චයන් සහ ඇස්තමේන්තු ඓතිහාසික අත්දැකීම් සහ පවතින වාතාවරණයන් යටතේ සාධාරණ යැයි විශ්වාස කෙරෙන අපේක්ෂාවන් ද ඇතුළු අනෙකුත් සාධක මත පදනම්ව සිදු කර ඇත. එබැවින් සැබෑ ප්‍රතිඵල මෙම විනිශ්චයන් හා ඇස්තමේන්තු වලට වඩා වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු සහ පාදක වී ඇති උපකල්පන අඛණ්ඩ පදනමකින් සමාලෝචනය කරනු ලැබේ. ඇස්තමේන්තු සංශෝධනය කරනු ලබන කාල පරිච්ඡේදය තුළ සහ එය බලපාන ඕනෑම අනාගත කාල පරිච්ඡේදයක් තුළ ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා වන සංශෝධන හඳුනා ගනු ලැබේ.

### 2.6. ප්‍රමාණවත් බව හා සමාහරණය

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ට අනුකූලව සෑම සමාන අයිතම වර්ගයක් ම මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ. ස්වභාවයෙන් හෝ කාර්යයෙන් අසමාන අයිතම ද ප්‍රමාණාත්මක නම් ඒවා වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ. හඳුනාගන්නා ලද ප්‍රමාණයන් හිලව් කිරීම සඳහා නීත්‍යානුකූලව හිලව් කළ හැකි අයිතියක් ඇති විට සහ ශුද්ධ පදනමකින් පියවීම සඳහා හෝ එක විට වත්කම උපලබ්ධි කර වගකීම පියවීමට අභිප්‍රායයක් ඇති විට පමණක් මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් හිලව් කර ශුද්ධ අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාර්තා කරනු ලැබේ. කිසියම් ගිණුම්කරණ ප්‍රමිතියක් හෝ අර්ථ නිරූපණයක් මගින් නියම කර හෝ අවසර දී ඇත්තේ නම් මිස, සහ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල විශේෂිත වශයෙන් අනාවරණය කර ඇති පරිදි, ආදායම සහ වියදම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි හිලව් නොකරනු ලැබේ.

### 2.7. ආදායම් බදු

මණ්ඩලය ආදායම් බදු වලට සහ එකතු කළ අගය මත බද්ද, SSCL හා රඳවාගැනීමේ බද්ද ඇතුළු අනෙකුත් බදු වලට යටත් වේ. මූල්‍ය ප්‍රකාශනවල ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අනුගත කර ගැනීම පිළිපැදීම පිළිබඳ බදු මාර්ගෝපදේශ නිකුත් කරන තුරු ප්‍රවර්තන සහ අනෙකුත් බදු සඳහා වන මුළු ප්‍රතිපාදන පිළිබඳව සහ බදු පැනවීමේ කාර්යය සඳහා බදු අය කළ හැකි ලාභය පිළිබඳව තීරණය කිරීම සඳහා සැලකිය යුතු විනිශ්චයක් අවශ්‍ය විය. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන අවස්ථාවේදී බදු නීති අදාළවීම පිළිබඳ අර්ථ නිරූපනයට අදාළ අවිනිශ්චිතතාවයන් පවතී. 2023 දෙසැම්බර් 31 දිනට, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ හිඟව පවතින ආදායම් බදු සහ වැට් බදු තක්සේරු තුනක් ඇත. මණ්ඩලය අභියාචන ඉදිරිපත් කර විරෝධය දක්වා ඇත. එකී තක්සේරු කිරීම් වලින් විශාල වගකීමක් පැන නොනගිනු ඇති බව මණ්ඩලයේ මතය වේ.

තක්සේරු අංක. 0201617002 සහ නඩු අංක TAC/IT/065/2021 සම්බන්ධයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ මෑතකාලීන බදු තක්සේරුව සාර්ථකව විසඳා ගෙන ඇත. සංවර්ධන ලොතරැයි මණ්ඩලය සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව අන්‍යෝන්‍යව පිළිගතහැකි එකඟතාවයකට ලඟාවූ අතර අවසාන තීරණය 2024.01.23 දින අභියාචන කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇත. එකඟතාවය අවසන් කිරීම සඳහා, මණ්ඩලය රු.44,463,941.00ක එක් වරක ගෙවීමක් සිදුකරන ලද අතර, මෙම නඩුව සම්බන්ධයෙන් වැඩිදුර වගකීම් තවදුරටත් නොමැත.

### 2.8. අඛණ්ඩ භාවය

පූර්වේක්ෂ අනාගතයේදී ව්‍යාපාර කටයුතු කරගෙන යාමට මණ්ඩලය සතුව සම්පත් ඇති බවට මණ්ඩලය සෑහීමකට පත්වේ. තවද, ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස මණ්ඩලයට අඛණ්ඩව පැවතීමේ හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇති විය හැකි ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයන් පිළිබඳව මණ්ඩලය නොදන්නා අතර මණ්ඩලය ඈවර කිරීමට හෝ එහි මෙහෙයුම් නතර කිරීමට මණ්ඩලය අදහස් නොකරයි. එම නිසා, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම අඛණ්ඩ භාවය පදනම් කර ගෙන අඛණ්ඩව සිදු කරනු ලැබේ.

## 3. වැදගත් වන ගිණුම්කරණ ප්‍රතිපත්ති.

### 3.1. දේපළ, පිරියත සහ උපකරණ

#### 3.1.1. හඳුනා ගැනීම සහ මැනීම

දේපළ, පිරියත සහ උපකරණ යනු සේවා සැපයීම සඳහා හෝ පරිපාලන කාර්යයන් සඳහා තබා ඇති ස්පෘශ්‍ය අයිතම වන අතර ඒවා එක් කාල පරිච්ඡේදයකට වඩා වැඩි ගණනක් තුළ භාවිතා කිරීමට අපේක්ෂා කෙරේ.

##### අ. හඳුනා ගැනීම

වත්කම් හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ මණ්ඩලය වෙත ගලා ඒමේ හැකියාව තිබේ නම් සහ වත්කමෙහි

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි නම් ඒවා දේපළ, පිරියත සහ උපකරණ හඳුනා ගනු ලැබේ.

**ආ. දේපළ, පිරියත සහ උපකරණවල ප්‍රයෝජනවත් ජීවිත කාලය හා ප්‍රත්‍යාගණනය**

සෑම වාර්තාකරණ දිනයක දී ම මණ්ඩලය වත්කම්වල අවශේෂ්‍ය වටිනාකම්, ප්‍රයෝජනවත් ජීවිත කාල සහ අගය ක්ෂය කිරීමේ ක්‍රම සමාලෝචනය කරයි. මෙම අගයන්, අනුපාත සහ ක්‍රම තක්සේරු කිරීමේදී කළමනාකාරිත්වයේ විනිශ්චය ක්‍රියාත්මක කරනු ලබන අතර, එබැවින් ඒවා අවිනිශ්චිතතාවයකට භාජනය වේ. මණ්ඩලය 2023 දී විස්තීර්ණ සමාලෝචනයක් සහ වත්කම් ප්‍රත්‍යාගණනයක් පවත්වන ලදී.

**ඇ. මැනීම**

දේපළ, පිරියත සහ උපකරණ අයිතම සමුච්චිත ක්ෂයවීම් අඩු කර පිරිවැයට හෝ තක්සේරු කළ අගයට සඳහන් කරනු ලැබේ.

වත්කම් අත්පත් කර ගැනීම සඳහා සෘජුවම අදාළ වන වියදම් පිරිවැය යන්නට ඇතුළත් වේ. ස්වයංව ඉදිකරන ලද වත්කම්වල පිරිවැයට එම ඉදිකිරීම සඳහා යොදා ගත් ද්‍රව්‍යවල සහ සෘජු ශ්‍රමයෙහි පිරිවැය, එම වත්කම එහි අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියාත්මක තත්ත්වයකට ගෙන ඒමට සෘජුවම ආරෝපණය කළ හැකි අනෙකුත් වියදම් සහ භාණ්ඩ කොටස් වලට ගලවා ඉවත් කර ඒවා පිහිටා තිබූ භූමිය යලි යථා තත්ත්වයට පත් කිරීමේ පිරිවැය ඇතුළත් වේ.

වත්කම් වලින් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ යථා තත්ත්වයට පත් කිරීම හෝ පවත්වාගෙන යාම සඳහා දේපළ, පිරියත සහ උපකරණ අළුත්වැඩියා කිරීම හෝ නඩත්තු

කිරීම සඳහා දරනු ලබන වියදම් එම වියදම් දරනු ලැබූ විට වියදමක් ලෙස හඳුනා ගෙන ඇත.

**ඈ. පසුකාලීන වියදම**

ප්‍රධාන පරීක්ෂා කිරීමේ සහ අලුත්වැඩියා වියදම් ද ඇතුළුව වෙන වෙනම ගිණුම් ගත කර ඇති දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක උපාංග යක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දරනු ලබන වියදම ප්‍රාග්ධනීත කරනු ලැබේ. යම් දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක කොටසක අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ මණ්ඩලයට ගලා ඒමේ හැකියාව තිබේ නම් සහ එහි පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි නම්, එම අයිතම කොටස ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය අයිතමයේ ධාරණ අගයෙහි හඳුනාගෙන ඇත. ප්‍රතිස්ථාපනය කරනු ලැබූ කොටසෙහි ධාරණ අගය ඉවත් කර ඇත. දේපළ, පිරියත සහ උපකරණවල එදිනෙදා සේවා පිරිවැය දරන ලද පිරිවැයක් ලෙස ලාභයෙහි හෝ අලාභයෙහි හඳුනාගනී.

**ඉ. ක්ෂය කිරීම**

දේපළ, පිරියත සහ උපකරණ අයිතමවල සෑම කොටසකම ඇස්තමේන්තු කළ ප්‍රයෝජනවත් ජීවිත කාලය මත අගය ක්ෂය කිරීම සරල මාර්ග පදනමක් මත ලාභයෙහි හෝ අලාභයෙහි හඳුනා ගනු ලැබේ. වත්කම්වල ඇස්තමේන්තු කළ ප්‍රයෝජනවත් ජීවිත කාලය පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| ගොඩනැගිලි/මැදිරිය | 10% |
| ලීබඩු සහ සවිකිරීම් | 25% |
| කාර්යාල උපකරණ | 25% |
| යන්ත්‍රසූත්‍ර | 12.50% |
| මෝටර් වාහන/ත්‍රිරෝද රථ | 20% |
| පරිගණක සහ උපාංග | 33.33% |
| සන්නාම කරන ලද අලෙවි කුටි | 16.66% |
| යතුරුපැදි | 25% |
| යෙදවුම් මෘදුකාංග | 33.33% |
| ජංගම දුරකථන | 50% |

වත්කමක් භාවිතයට ගත හැකිවන දිනයේ සිට එම වත්කම බැහැර කරන දිනය දක්වා හෝ ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා මණ්ඩලය ක්ෂය කිරීම සිදු කරයි.

යම් අස්පෘශ්‍ය වත්කමකට ආරෝපණය කළ හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ මණ්ඩලයට ගලා ඒම සිදු විය හැකි නම් සහ එම වත්කමෙහි පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි නම් එවැනි අස්පෘශ්‍ය වත්කමක් හඳුනා ගනු ලැබේ. අදාළ දෘඩාංගයට සංකලිත ලෙස සම්බන්ධ නොවන, පැහැදිලිව හඳුනාගත හැකි, විශ්වාසනීය ලෙස මැනිය හැකි සහ අනාගත ආර්ථික ප්‍රතිලාභ ගෙන දීමට හේතු විය හැකි, මණ්ඩලය විසින් භාවිතා කරනු ලැබීමට බලය ලබා දී ඇති සියලුම පරිගණක මෘදුකාංග වල දරන ලද පිරිවැය ශේෂ පත්‍රයේ අස්පෘශ්‍ය වත්කම් කාණ්ඩය යටතේ ඇතුළත් කර, සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානිකරණ පාඩු අඩු කළ පිරිවැයට ඉදිරියට ගෙන යනු ලැබේ.

**ඊ. දේපළ, පිරියත සහ උපකරණ ඉවත්කිරීම**

දේපළ, පිරියත සහ උපකරණ බැහැර කිරීම මත හෝ එහි භාවිතය හෝ බැහැර කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා කළ නොහැකි විට ඉවත් කළ යුතුය (දේපළ, පිරියත සහ උපකරණ ඉවත් කිරීම). බැහැර කිරීමෙන් ලද මුදල් සහ බැහැර කරන දිනයට වත්කමේ ධාරණ අගය අතර වෙනස පරිදි ලාභයක් හෝ අලාභයක් හඳුනා ගනී. මෙම ලාභය හෝ අලාභය ලාභාලාභ ගිණුමට ඇතුළත් කරන අතර - බැහැර කිරීමේන් ලද මුදල ආදායමක් ලෙස හඳුනා නොගත යුතුය.

## 3.2. භාණ්ඩ තොග

බඩු තොගවල පිරිවැයට එම තොග අත්පත් කර ගැනීම සඳහා දරන ලද වියදම් සහ ඒවා පවතින ස්ථානයට හා තත්ත්වයට ගෙන ඒම සඳහා දරන ලද අනෙකුත් වියදම් ඇතුළත් වේ. ඒ අනුව, ටිකට්පත් තොග වල පිරිවැය පහත දක්වා ඇති පරිදි ගණනය කරනු ලැබේ:

| | |
|---|---|
| ලග්න වාසනාව | සත්‍ය පිරිවැයට |
| ශනිදා | සත්‍ය පිරිවැයට |
| ජයෝදා | සත්‍ය පිරිවැයට |
| ක්ෂණික | සත්‍ය පිරිවැයට |
| කෝටිපතිකප්රුක | සත්‍ය පිරිවැයට |
| සංවර්ධන වාසනාව | සත්‍ය පිරිවැයට |
| සුපර් බෝල් | සත්‍ය පිරිවැයට |
| අද කෝටිපති | සත්‍ය පිරිවැයට |
| සුපිරි ධන සම්පත | සත්‍ය පිරිවැයට |
| සසිරි | සත්‍ය පිරිවැයට |

අනෙකුත් තොග අයිතම පිරිවැය කිරීම සඳහා පෙර පිවිසි පෙර නිකුතු පදනම යොදා ගෙන ඇත.

## 3.3. වගකීම් සහ ප්‍රතිපාදන

### 3.3.1. වගකීම්

ශේෂ පත්‍රයේ ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කර ඇත්තේ ඉල්ලූ විට ගෙවීමට නියමිතව ඇති හෝ ශේෂ පත්‍ර දිනයේ සිට වසරක් ඇතුළත ගෙවිය යුතු වන වගකීම් වේ. ජංගම නොවන වගකීම් වන්නේ ශේෂ පත්‍ර දිනයේ සිට වසරකට පසු ගෙවිය යුතු ශේෂයන් වේ.

**3.3.2. ප්‍රතිපාදන**

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස මණ්ඩලයට විශ්වාසනීය ලෙස ඇස්තමේන්තු කළ හැකි වර්තමාන නෛතික හෝ සම්මුතික බැඳීමක් ඇත් නම්, සහ එම වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලා යාමක් අවශ්‍ය විය හැකි නම් ඒ සඳහා ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ.

**මණ්ඩලය විසින් සහ මණ්ඩලයට නඩු පැවරීම්**

**අ. නඩු අංක** WP/HCCA/COL/160/2004/F1 -

මණ්ඩලය එම්.ඒ.එම්. අමීන් මහතාට එරෙහිව නඩු පවරා ඇත. අධිකරණය මණ්ඩලයට පක්ෂව තීන්දුව ලබා දී ඇත. නීතිපති දෙපාර්තමේන්තුව එකී පුද්ගලයාගෙ න් රු. 2,520,000 මුදල අයකර ගැනීමට පියවර ගෙන ඇත. මෙම චූදිතයා මියගොස් ඇති බැවින්, මියගිය පුද්ගලයා වෙනුවට ඔහුගේ පුතා සහ බිරිඳ ඇතුළත් කිරීමට උසාවියේ ලියවිලි ගොණු කර ඇත. මෙම නඩුව දැනට අසමින් පවතී.

**ආ.2. නඩු අංක:** DMR/04781/2021 -

PB-6024 දරන වාහනය නැතිවීම නිසා සිදුවූ හානිය අය කර ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත. මෙම නඩුව දැනට අසමින් පවතී.

**ඇ.නඩු අංකः** A72/2022-

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ මාණ්ඩලික නිලධාරින්ගේ සංගමය විසින් එහි සාමාජිකයින්ට හිවාඩු දීමනාව ගෙවීමේ වසර 19ක් පැරණි ක්‍රමය වෙනස් කිරීම මගින් ඇති වූ මැසිවිල්ල සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස් ජනරාල් වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත. මාණ්ඩලික නිලධාරින්ගේ සංගමයට පක්ෂව තීන්දුව ලබා දී ඇත. අවශ්‍ය ප්‍රතිපාදන සිදු කර ඇත.

කෙසේවෙතත්, මණ්ඩලය තීන්දුවට එරෙහිව අභියාචනා කිරීමට තීරණය කර ඇත.

**ඈ.නඩු අංක :** DMR/00875/21

බෙදාහැරීම් නියෝජිත, ගුණසේන රන්කොත්ගේ මහතාට අයත් හිඟ මුදල හේතුවෙන් රු.2,000,000ක බැංකු ඇප මුදල් ඉල්ලීම නොගෙවීම මත උකුවෙල සණස බැංකුවට එරෙහිව මණ්ඩලය නඩුවක් පවරා ඇත. 2023 නොවැම්බර් 30 නිකුත්කළ තීන්දුව මණ්ඩලයට පක්ෂව ලැබී ඇත.

**3.3.3. ත්‍යාග සඳහා වෙන් කිරීම**

මණ්ඩලය විසින් ස්ථාපිත පූර්ව නිශ්චිත අනුපාත මත පදනම් වී ත්‍යාග පිරි නමන ලදී. දිනා නොගත් ත්‍යාග සඳහා බැර කිරීම පිණිස සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතෙහි සඳහන් නියමය ප්‍රකාරව මණ්ඩලය ත්‍යාග සංචිත ගිණුමක් පවත්වා ගෙන යයි. ත්‍යාග සංචිත ගිණුම් භාවිතා කළ හැක්කේ පසු කාලසීමාවලදී ත්‍යාග ගෙවීමේ කාර්යය සඳහා පමණකි.

**3.4. සේවක ප්‍රතිලාභ**

**(අ) නිර්වචිත දායක සැලසුම්**

නිර්වචිත දායක සැලැස්මක් යනු සේවා නියුක්තියෙන් පසු කාලීන සැලැස්මක් වන අතර, ඒ යටතේ ආයතනයක් වෙනත් ආයතනයකට ස්ථාවර දායක මුදලක් ගෙවන අතර, එයට අමතරව තවදුරටත් මුදලක් ගෙවීමට නීතිමය හෝ සම්මුතික බැඳීමක් එම ආයතනයට නැත. නිර්වචිත දායක සැලසුම් වලට නියමිත දායකත්වය ගෙවීම් සඳහා වන බැඳීම් සේවකයින් විසින් අදාළ සේවාවන් සපයනු ලබන කාල සීමාව තුළ දී ලාභය හා අලාභයේ වියදම් ලෙස හඳුනා ගනු ලැබේ.

**සේවක අර්ථසාධක අරමුදල**

එක් එක් සේවකයාගේ වැටුපෙන් මණ්ඩලය සහ අදාළ සේවකයා විසින් පිළිවෙලින් 15% සහ 10% බැගින් දායක මුදල් ගෙවනු ලැබේ. එකී අර්ථසාධක අරමුදල ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලැබේ.

**සේවා නියුක්තයන්ගේ භාර අරමුදල**

මණ්ඩලය එක් එක් සේවකයාගේ වැටුපෙන් 3% ක් සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට

දායක මුදල් ලෙස ගෙවයි. නිර්වචිත දායක සැලසුම් සඳහා වන දායක මුදල් දරන ලද වියදමක් ලෙස ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගනු ලැබේ.

**ආ නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් විශ්‍රාම පාරිතෝෂිකය**

නිර්වචිත ප්‍රතිලාභ සැලැස්මක් යනු නිර්වචිත දායක සැලැස්මක් නොවන පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ සැලැස්මකි.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 හි 57 වැනි ඡේදය අනුව, භාණ්ඩ අලෙවි කිරීමේ හෝ සේවා සැපයීමේ නිරතව සිටින රාජ්‍ය සංස්ථා විසින් සුදුසුකම් ලත් ආයුගණකවරයෙකු හෝ පාරිතෝෂික සූත්‍ර ක්‍රමය භාවිතා කිරීම තෝරා ගත හැකිය. එමනිසා මණ්ඩලය පාරිතෝෂික වගකීම ගණනය කිරීම සඳහා පාරිතෝෂික සූත්‍ර ක්‍රමයක් භාවිතා කරයි. වර්තමාන වෙළෙඳපොල වාතාවරණය සහ ආවේනික අවිනිශ්චිතතාවන් අනුව, පාරිතෝෂික වෙන්කිරීම ගණනය කිරීම සඳහා නිවැරදි උපකල්පන ස්ථාපිත කිරීමේදී මණ්ඩලය අභියෝග පිළිගනී, මෙවැනි අභියෝග හමුවේ, පාරිතෝෂික වගකීම තීරණය කිරීමේදී මණ්ඩලය විචක්ෂණ සහ යුක්තිසහගත උපකල්පන යොදා ගෙන ඇත. කෙසේ වෙතත්, 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ සේවකයකු සම්බන්ධ පාරිතෝෂික වගකීම පැන නගින්නේ එම සේවකයා වසර 5 ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසුව පමණි. ලැබෙන යම් ලාභ හෝ අලාභ වහාම ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගනු ලැබේ. පාරිතෝෂික අරමුදල බාහිර වශයෙන් අරමුදල් සපයනු ලැබ ඇත. පාරිතෝෂික ප්‍රතිපාදන වලින් සහ අරමුදලෙන් ඇති වන ශුද්ධ බලපෑම ගිණුම්වලට සටහන යටතේ පෙන්වා ඇත.

**3.5. ප්‍රාග්ධන බැඳීම් සහ අවිනිශ්චිතතාවයන්**

අවිනිශ්චිත වගකීම් යනු ආර්ථික ප්‍රතිලාභ හුවමාරු වීමේ හව්‍යතාවයක් නොමැති හෝ විශ්වාසනීය ලෙස මැනිය නොහැකි අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ වර්තමාන බැඳීම් මගින් පමණක් පැවැත්ම තහවුරු කළ හැකි බැඳීම් වේ. මණ්ඩලයේ ප්‍රාග්ධන බැඳීම සහ අවිනිශ්චිත වගකීම් මූල්‍ය ප්‍රකාශනවල අදාළ සටහන් මගින් අනාවරණය කරනු ලැබේ.

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

**3.6. ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදුවීම්**

ශේෂ පත්‍ර දිනයෙන් පසුව සිදුවූ සිදුවීම්වල ප්‍රමාණාත්මක බව සලකා බලා අවශ්‍ය තැන්හිදී මූල්‍ය ප්‍රකාශනවල සුදුසු ගැලපීම් සහ වෙන් කිරීම් සිදුකර ඇත.

මණ්ඩලය 2023 ජූලි 6 දින සිට ක්‍රියාත්මකව රු. 20 සිට රු. 40 දක්වා මිල වැඩි කරමින් ලොතරැයි ටිකට්පත් සඳහා මිල වැඩිවීමක් ක්‍රියාත්මක කරන ලදී. මෙම තීරණය වෙනස්වන වෙළෙඳපොල තත්ත්වයන්ට ගැලපීමට සහ මණ්ඩලයේ මෙහෙයුම්වල දිගුකාලීන තිරසාරභාවය සහතික කිරීමට ගනු ලැබීය. විකුණුම් පරිමාව මත වියහැකි බලපෑම අවම කිරීමට සහ මිලදී ගන්නන්ගේ සහභාගිත්වය වැඩි කිරීමට, මණ්ඩලය ප්‍රතික්‍රියාමාර්ග රාශියක් ක්‍රියාත්මක කර ඇත. මේවාට වැඩිකළ ත්‍යාග ව්‍යුහ: මිලදී ගන්නන්ගේ ආකර්ෂණය හා වටිනාකම් කොටස වැඩි කිරීමට පවතින ලොතරැයි දිනුම් ඇදීම් සඳහා වෙන්කළ මුදල් ත්‍යාග වැඩි කිරීම ඇතුළත් විය. අමතර අතිරේක යෝජනා ක්‍රම වන්නේ: මිලදී ගන්නන්ට විකල්ප දිනුම් අවස්ථා පිරිනැමීමට සහ පෙළඹවීම වැඩි කිරීමට පවතින දිනුම් ඇදීම් සමඟ නව, තාවකාලික ත්‍යාග යෝජනා ක්‍රම හඳුන්වාදීමයි. ක්ෂේත්‍රය පදනම් අලෙවිකරණ කටයුතු: මෙයට ඉලක්කගත වැඩසටහන් තුළින් ප්‍රවර්ධන උත්සාහයන් වැඩි කිරීම සහ අනාගත ගනුදෙනුකරුවන් සමඟ සෘජුව සම්බන්ධවීමට ප්‍රධාන විකුණුම් ප්‍රදේශ සක්‍රීය කිරීම් සහ යාවත්කළ ටිකට් මිල සහ ප්‍රතිශෝධිත ත්‍යාග පිරිනැමීම් පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීම ඇතුළත් විය.

මණ්ඩලය මිල වැඩිවීමේ බලපෑම සහ ප්‍රතික්‍රියාමාර්ගවල ඵලදායිත්වය අඛණ්ඩව නියාමනය කරයි.

**3.7. මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 7 - මුදල් ප්‍රවාහ ප්‍රකාශය යටතේ දක්වා ඇති පරිදි, වක්‍ර ක්‍රමය භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර ඇත. මුදල් සහ මුදල් හා සමාන දෑ අත ඇති මුදල් සහ බැංකුවේ ඇති මුදල් වල ශුද්ධ අගයෙන් සමන්විත වේ.

**3.8. අංශමය තොරතුරු**

කළමනාකරණ කාර්යයන් සඳහා, මණ්ඩලය විසින් නිෂ්පාදන මත පදනම්ව මෙහෙයුම් කාණ්ඩ දහයක් සකස් කර ඇත. සම්පත් වෙන් කිරීම පිළිබඳ තීරණ ගැනීමේ සහ කාර්යසාධනය තක්සේරු කිරීමේ කාර්යයන් සඳහා කළමනාකාරිත්වය මණ්ඩලයේ නිෂ්පාදනවල මෙහෙයුම් ප්‍රතිඵල වෙන වෙනම අධීක්ෂණය කරනු ලබයි. මෙහෙයුම් ලාභ හෝ අලාභ මත පදනම්ව ඛණ්ඩවල කාර්ය සාධනය ඇගයීම සිදු කරනු ලැබේ.

**4. ආදායම් ප්‍රකාශ.**

**4.1. ආදායම් හඳුනා ගැනීම**

ආර්ථික ප්‍රතිලාභ මණ්ඩලය වෙත ගලා ඒමට ඉඩ ඇතිතාක්දුරට සහ ආදායම හා ඒ හා සම්බන්ධයෙන් දරන ලද හෝ දැරීමට ඇති පිරිවැය විශ්වසනීයව මැනිය හැකිතාක් දුරට ආදායම හඳුනා ගනු ලැබේ. ලැබුණු හෝ ලැබිය යුතු ප්‍රතිෂ්ඨාවේ සාධාරණ වටිනාකමට ආදායම මනිනු ලැබේ. පොළී ආදායම සහ අනෙකුත් ආදායම් උපචිත පදනමක් මත හඳුනා ගනු ලැබේ.

**4.2. වියදම**

ව්‍යාපාරය පවත්වාගෙන යාමේ දී සහ දේපළ, පිරියත සහ උපකරණ කාර්යක්ෂමව නඩත්තු කිරීමේදී දරන ලද සියලු වියදම් වර්ෂය සඳහා ලාභය ගණනය කිරීමේදී ආදායමට අය කර ඇත. ආදායම් ප්‍රකාශනය ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා, වියදමෙහි ක්‍රියාකාරිත්වය නැමති ක්‍රමය මගින් මණ්ඩලයේ කාර්යසාධනයේ අංග සාධාරණ ලෙස ඉදිරිපත් කරන බව මණ්ඩලයේ මතය වේ. එබැවින් එම ඉදිරිපත් කිරීමේ ක්‍රමය අනුගමනය කරනු ලැබේ. ව්‍යාපාරය සිදු කර ගෙන යාම සඳහා හෝ ව්‍යාපාරයේ ඉපැයීම් ධාරිතාවය ඉහළ නැංවීම සඳහා හෝ ස්ථිර ස්වභාවයක වත්කම් අත්පත් කර ගැනීම, පුළුල් කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා දරනු ලබන වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ. අළුත්වැඩියා කිරීම් සහ නැවත අළුත් කිරීම් ඒ සඳහා වියදම දරන ලද වර්ෂය තුළ ආදායමට අය කර ඇත.

**5. මූල්‍ය වත්කම්.**

**5.1. මූලික හඳුනා ගැනීම**

සියලුම මූල්‍ය වත්කම් වෙළෙඳ දිනයේදී එනම් මණ්ඩලය උපකරණයේ ගිවිසුම්ගත විධිවිධානවල පාර්ශවකරුවෙකු බවට පත්වන දිනයෙහි දී මූලිකව හඳුනා ගනු ලැබේ. 'විධිමත් ක්‍රමයේ වෙළෙඳාම්' සාමාන්‍යයෙන් වෙළෙඳපොළ තුළ නියාමනය හෝ සම්ප්‍රදායය මගින් ස්ථාපිත වී ඇති කාල රාමුව තුළ වත්කම් භාර දීම අවශ්‍ය කරන මූල්‍ය වත්කම් මිලදී ගැනීම හෝ විකිණීම මෙයට අයත් වේ. මූලික හඳුනා ගැනීමේදී මූල්‍ය උපකරණ වර්ගීකරණය කිරීම ඒවායෙහි කාර්යය සහ ලක්ෂණ මත සහ කළමනාකාරිත්වය විසින් ඒවා අත්පත් කර ගනු ලැබීමේ අභිප්‍රාය මත රඳා පවතී. ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමට වාර්තා කර ඇති මූල්‍ය වත්කම් සහ මූල්‍යමය වගකීම් හැරෙන්නට, සියලු ම මූල්‍ය උපකරණ මූලිකව ගනුදෙනු පිරිවැය ද ඇතුළුව ඒවායෙහි සාධාරණ වටිනාකමට මනිනු ලැබේ.

**5.2. පසුකාලීනව මැනීම.**

ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමට ඇති මූල්‍ය වත්කම්, කල්පිරීම දක්වා තබා ගෙන ඇති ආයෝජන, ණය සහ ලැබිය යුතු දෑ, සහ විකිණීම සඳහා තිබෙන මූල්‍ය වත්කම් යන කාණ්ඩවලට වර්ගීකරණය කර පසුකාලීනව මැනීම.

**5.2.1. කල්පිරීම දක්වා තබාගෙන තිබෙන මූල්‍ය වත්කම් (HTM)**

ස්ථාවර තැන්පතු වල තිබෙන ආයෝජන කල්පිරීම දක්වා තබාගෙන තිබෙන මූල්‍ය ආයෝජන යටතේ වර්ගීකරණය කර ඇත. ස්ථාවර කල්පිරීමේ කාලයන් ඇති මූල්‍ය වත්කම් කල්පිරීම දක්වා තබාගෙන සිටීමට මණ්ඩලයට ධනාත්මක අභිප්‍රායයක් සහ හැකියාවක් ඇති විට එම වත්කම් කල්පිරීම දක්වා තබාගෙන ඇති මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. මූලික මිනුමෙන් පසුව, කල්පිරීම දක්වා තබාගෙන ඇති ආයෝජන ක්‍රමක්ෂය කළ පිරිවැයට මනිනු ලැබේ.

**5.2.2. මුදල් සහ බැංකු ශේෂ**

මුදල් සහ බැංකු ශේෂ අතැති මුදල් සහ බැංකුවේ ඇති ශේෂ ලෙස නිර්වචනය කරනු ලැබේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි කාර්යය සඳහා, මුදල් සහ මුදල් හා සමාන දෑ අතැති මුදල් සහ බැංකුවල ඇති මුදල් වලින් සමන්විත වේ. කෙටි කල්පිරීම් කාලයන් සහිත ආයෝජන, එනම් අත්පත් කර ගත් දිනයේ සිට මාස තුනක් හෝ එයට අඩු කල්පිරීමේ කාලයන් සහිත ආයෝජන ද මුදල් හා සමාන දෑ ලෙස සලකනු ලැබේ.

### 5.2.2. මූල්‍ය අවදානම් කළමනාකරණය

මණ්ඩලයේ ක්‍රියාකාරකම් විවිධ වූ මූල්‍ය අවදානම් ගණනාවකට නිරාවරණය වෙයි; ණය අවදානම, ද්‍රවශීලතා අවදානම සහ වෙළඳපොළ අවදානම එම අවදානම් වේ.

සේවාවක් ලබන්නෙකු හෝ මූල්‍ය උපකරණයක ප්‍රතිපාර්ශ්වය එහි ගිවිසුම්ගත බැඳීම් ඉටුකිරීමට අපොහොසත් වුව හොත් මණ්ඩලයට ඇතිවිය හැකි මූල්‍ය අලාභය ණය අවදානම වේ. ණය අවදානම අවම කිරීම සඳහා රජයට අයත් බැංකු ආයතන වල ස්ථාවර තැන්පතු තබා ඇත.

මණ්ඩලයේ කීර්තිනාමයට පිළිගත නොහැකි මට්ටමේ හානියක් සිදු නොවන පරිදි ස්වකීය වගකීම් ඉටුකිරීම සඳහා ප්‍රමාණවත් ද්‍රවශීලතාවයක් සැමවිටම පවතින බව සහතික කිරීම මගින් මණ්ඩලය ද්‍රවශීලතා අවදානම කළමනාකරණය කරයි. ස්ථාවර තැන්පතු කෙටි කාලීනව රජයට අයත් බැංකු ආයතන වල තබා ඇත.

වෙළෙඳපොළ අවදානම යනු මණ්ඩලයේ ආදායමට හෝ මණ්ඩලය විසින් තබා ගෙන ඇති මූල්‍ය උපකරණවල වටිනාකමට බලපෑ හැකි පරිදි පොලී අනුපාත වෙනස් වීමේ අවදානම වේ. මණ්ඩලය ප්‍රතිලාභ උපරිම කරගනිමින් වෙළෙඳපොළ අවදානම් නිරාවරණය නිතිපතා කළමනාකරණය කර පාලනය කරයි.

## 6. සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය 1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත යටතේ ස්ථාපනය කරන ලදී. පනතට අනුව, එහි අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වේ.

1. මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව අරමුදලෙහි සභාපති හෝ ඔහුගේ නියෝජිතයෙක්.
2. ජනාධිපති ලේකම් හෝ ඔහුගේ නියෝජිතයෙක් .
3. අමාත්‍යාවරයාගේ අමාත්‍යංශයේ ලේකම් හෝ ඔහුගේ නියෝජිතයෙක් .
4. අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන තවත් සාමාජිකයින් දෙදෙනෙන්.

අධ්‍යක්ෂ මණ්ඩලය ආයතනයේ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය ලෙස සලකනු ලැබේ. වර්ෂය තුළ කිසිදු අධ්‍යක්ෂවරයෙකුට මණ්ඩලය සමග එළඹ ඇති ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජු හෝ වක්‍රාකාර බැඳියාවක් නොපවතී.

# අංශමය වාර්තාව

සටහන 01 -I- අංශමය වාර්තාව

රු.

| | ශනිදා | ලග්න වාසනාව | ජයෝදා | සුපර් බෝල් | කප්රුක | සංවර්ධන වාසනාව | අද කෝටිපති | සසිරි | වාලම්පුරි | ලකී ට්‍රීඩම් | සුපිරි ධන සම්පත් | ක්ෂණික | එකතුව 2023 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| විකුණුම් | 3,731,564,960 | 6,920,745,360 | 628,550,520 | 3,348,357,160 | 5,309,903,480 | 511,732,400 | 4,208,361,920 | 859,426,360 | 181,163,400 | 72,165,000 | 525,235,120 | 310,974,500 | 26,608,180,180 |
| බදු - වැට්, 8% | 163,528,117 | 303,287,352 | 27544926.61 | 146,734,828 | 232,695,538 | 22,425,614 | 184,422,758 | 37,662,583 | 7,939,111 | 3,162,482 | 23,017,343 | 13,627,814 | 1,166,048,467 |
| **ආදායම** | 3,568,036,843 | 6,617,458,008 | 601,005,593 | 3,201,622,332 | 5,077,207,942 | 489,306,786 | 4,023,939,162 | 821,763,777 | 173,224,289 | 69,002,518 | 502,217,777 | 297,346,686 | 25,442,131,713 |
| විකුණුම් පිරිවැය | 178,812,788 | 276,197,717 | 34,028,801 | 138,059,941 | 204,182,182 | 30,762,149 | 169,657,228 | 46,667,838 | 10,183,822 | 3,028,333 | 20,308,515 | 35,770,712 | 1,147,660,028 |
| තෑගි | 1,862,998,174 | 3,647,300,158 | 313,461,709 | 1,650,954,415 | 2,626,018,818 | 253,566,148 | 2,073,987,603 | 423,267,482 | 102,603,658 | 40,721,250 | 305,949,457 | 150,134,740 | 13,450,963,612 |
| දිනුම් ඇදීම් පිරිවැය | 138,712,479 | 138,295,182 | 38,144,968 | 135,242,230 | 136,773,568 | 29,343,221 | 139,359,261 | 49,948,746 | 1,254,155 | 309,931 | 18,688,155 | 826,071,896 | |
| **දළ ලාභය** | 1,387,513,402 | 2,555,664,951 | 215,370,116 | 1,277,365,746 | 2,110,233,374 | 175,635,267 | 1,640,935,070 | 301,879,711 | 59,182,653 | 24,943,003 | 157,271,650 | 111,441,234 | 10,017,436,178 |
| | | | | | | | | | | | | | |
| එකතුකිරීම් - වෙනත් ආදායම් | 61,002,333 | 113,137,950 | 10,275,326 | 54,737,784 | 86,804,465 | 8,365,624 | 68,796,844 | 14,049,605 | 2,961,597 | 1,179,728 | 8,586,362 | 5,083,704 | 434,981,322 |
| ප්‍රචාරණ වියදම් | 27,593,349 | 29,083,022 | 16,376,326 | 27,499,640 | 38,229,452 | - | 42,723,499 | 21,351,000 | 470,713 | 458,200 | 15,595,951 | 567,500 | 219,948,650 |
| අලෙවිකරණ හා බොදාහැරීමේ වියදම් | 133,993,479 | 325,848,463 | 22,048,937 | 121,199,405 | 203,021,407 | 17,574,977 | 152,569,859 | 30,255,279 | 11,641,751 | 4,812,438 | 29,123,958 | 9,504,323 | 1,061,594,277 |
| බාහිර ප්‍රචාරන, ආයතනික හා වෙනත් | 13,869,134 | 25,722,384 | 2,336,138 | 12,444,863 | 19,735,357 | 1,901,960 | 15,641,249 | 3,194,236 | 673,331 | 268,216 | 1,952,145 | 1,155,801 | 98,894,815 |
| අලෙවි නියෝජිත කොමිස් | 699,668,430 | 1,297,639,755 | 117,853,223 | 627,816,968 | 995,606,903 | 95,949,825 | 789,067,860 | 161,142,443 | 33,968,138 | 13,530,938 | 98,481,585 | 58,304,494 | 4,989,030,559 |
| බෙදා හැරීමේ කොමිස් | 46,600,065 | 86,441,727 | 7,849,062 | 41,813,255 | 66,304,930 | 6,390,408 | 52,558,088 | 10,733,330 | 2,258,738 | 901,388 | 6,559,590 | 2,275,500 | 330,686,077 |
| පරිපාලන හා | | | | | | | | | | | | | |
| මූල්‍ය වියදම් | 99,314,218 | 184,193,073 | 16,728,639 | 89,115,285 | 141,321,113 | 13,619,568 | 112,003,993 | 22,873,314 | 4,821,597 | 1,920,645 | 13,978,938 | 8,276,471 | 708,166,853 |
| අලෙවිකරණය ආශ්‍රිත | | | | | | | | | | | | | |
| වියදම් | 642,870 | 1,192,299 | 108,286 | 576,852 | 914,785 | 88,161 | 725,012 | 148,061 | 31,211 | 12,433 | 90,487 | 53,574 | 4,584,030 |
| එකතු කළා - ලබා නොගත් තෑගි | 67,499,480 | 136,973,320 | 10,692,200 | 65,781,120 | 88,366,060 | 12,451,060 | 80,158,340 | 9,636,260 | 3,800,100 | 1,426,300 | 476,784,240 | | |
| **බදු පෙර ලාභය** | 494,333,670 | 855,655,498 | 53,037,032 | 477,418,384 | 820,269,953 | 60,927,053 | 624,600,695 | 75,867,913 | 12,078,872 | 5,644,776 | 75,358 | 36,387,274 | 3,516,296,477 |
| ආදායම් බදු | (14,895,060) | (27,625,117) | (2,508,947) | (13,365,433) | (21,195,217) | (2,042,651) | (16,798,261) | (3,430,520) | (723,139) | (288,057) | (2,096,549) | (1,241,298) | (106,210,247) |
| . | | | | | | | | | | | | | |
| **බදු පසු ලාභය** | 509,228,730 | 883,280,614 | 55,545,979 | 490,783,817 | 841,465,170 | 62,969,704 | 641,398,956 | 79,298,433 | 12,802,011 | 5,932,832 | 2,171,907 | 37,628,572 | 3,622,506,725 |
| | | | | | | | | | | | | | |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | | | | | | | | | | | |
| සේවක ප්‍රතිලාභ සැලැස්ම, ආයුගණක | | | | | | | | | | | | | |
| ලාභ/පාඩු | (782,125) | (1,450,568) | (131,742) | (701,806) | (1,112,940) | (107,258) | (882,060) | (180,133) | (37,971) | (15,126) | (110,088) | (65,179) | (5,576,996) |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | 231,163,377 | 428,727,058 | 38,937,513 | 207,424,380 | 328,938,457 | 31,700,852 | 260,700,045 | 53,239,834 | 11,222,729 | 4,470,485 | 32,537,320 | 19,264,281 | 1,648,326,333 |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | 739,609,982 | 1,310,557,105 | 94,351,750 | 697,506,391 | 1,169,290,687 | 94,563,299 | 901,216,941 | 132,358,134 | 23,986,769 | 10,388,192 | 34,599,140 | 56,827,674 | 5,265,256,062 |

# අවසන් ගිණුම් පිළිබඳ සටහන

| දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා | 2023<br>රු. | 2022<br>රු. |
|---|---|---|
| **සටහන 01 - ආදායම** | | |
| **දළ විකුණුම්** | | |
| ශනිදා | 3,731,564,960 | 2,964,985,180 |
| ලග්න වාසනාව | 6,920,745,360 | 6,082,730,660 |
| ජයෝදා | 628,550,520 | 443,139,000 |
| ක්ෂණික | 310,974,500 | 328,404,000 |
| සුපර් බෝල් | 3,348,357,160 | 2,462,517,960 |
| කප්රුක | 5,310,120,680 | 3,084,497,240 |
| සංවර්ධන වාසනාව | 511,732,400 | 406,092,200 |
| අද කෝටිපති | 4,208,361,920 | 3,301,557,840 |
| සසිරි | 859,426,360 | 621,807,460 |
| වාලම්පුරි | 181,163,400 | 58,799,000 |
| ලකී ෆ්‍රීඩම් | 72,165,000 | |
| සුපිරි ධන සම්පත | 525,235,120 | |
| **මුළු විකුණුම්** | 26,608,397,380 | 19,754,530,540 |
| | | |
| අඩුකළා - ආපසු එවුම් | 217,200 | |
| **ශුද්ධ මුළු විකුණුම්** | 26,608,180,180 | 19,754,530,540 |
| අඩුකළා - වැට් බදු | 1,166,048,467 | 683,073,789 |
| **බදු පසු ආදායම** | 25,442,131,713 | 19,071,456,751 |

| | 2023<br>රු. | 2022<br>රු. |
|---|---|---|
| **සටහන 02 - ටිකට්පත් පිරිවැය** | | |
| ක්ෂණික | 35,770,712 | 22,619,963 |
| ශනිදා | 178,812,788 | 122,797,000 |
| ලග්න වාසනාව | 276,197,717 | 251,574,619 |
| ජයෝදා | 34,028,801 | 21,374,530 |
| සුපර් බෝල් | 138,059,941 | 102,908,489 |
| කප්රුක | 204,182,182 | 133,196,763 |
| සංවර්ධන වාසනාව | 30,762,149 | 19,369,623 |
| අද කෝටිපති | 169,657,228 | 138,361,598 |
| සසිරි | 46,667,838 | 29,953,256 |
| වාලම්පුරි | 10,183,822 | 2,084,919 |
| ලකී ෆ්‍රීඩම් | 3,028,333 | - |
| සුපිරි ධන සම්පත | 20,308,515 | - |
| | 1,147,660,028 | 844,240,759 |

| | 2023<br>රු. | 2022<br>රු. |
|---|---|---|
| **සටහන 03 - ත්‍යාග ගෙවීම** | | |
| ශනිදා | 1,862,998,174 | 1,482,492,790 |
| ලග්න වාසනාව | 3,647,300,158 | 3,041,366,030 |
| ක්ෂණික | 150,134,740 | 166,900,666 |
| ජයෝදා | 313,461,709 | 221,569,700 |
| සුපර් බෝල් | 1,650,954,415 | 1,231,258,980 |
| කප්රුක | 2,626,018,818 | 1,542,249,320 |
| සංවර්ධන වාසනාව | 253,566,148 | 203,046,100 |

# අවසන් ගිණුම් පිළිබඳ සටහන

| | 2023<br>රු. | 2022<br>රු. |
|---|---|---|
| අද කෝටිපති | 2,073,987,603 | 1,650,779,120 |
| සසිරි | 423,267,482 | 310,903,730 |
| වාලම්පුරි | 102,603,658 | 33,512,550 |
| ලකී ෆ්‍රීඩම් | 40,721,250 | - |
| සුපිරි ධන සම්පත | 305,949,457 | - |
| | 13,450,963,612 | 9,884,078,986 |

| | 2023<br>රු. | 2022<br>රු. |
|---|---|---|
| **සටහන 04 - දිනුම් ඇදීමේ පිරිවැය** | | |
| ශනිදා | 138,712,479 | 128,022,943 |
| ලග්න වාසනාව | 138,295,182 | 126,005,977 |
| ජයෝදා | 38,144,968 | 31,846,689 |
| සුපර් බෝල් | 135,242,230 | 126,809,443 |
| කප්රුක | 136,773,568 | 126,043,594 |
| සංවර්ධන වාසනාව | 29,343,221 | 33,472,365 |
| අද කෝටිපති | 139,359,261 | 128,014,607 |
| සසිරි | 49,948,746 | 50,593,890 |
| වාලම්පුරි | 1,254,155 | 331,513 |
| ලකී ෆ්‍රීඩම් | 309,931 | - |
| සුපිරි ධන සම්පත | 18,688,155 | - |
| | 826,071,896 | 751,141,022 |

| | 2023<br>රු. | 2022<br>රු. |
|---|---|---|
| **සටහන 05 - වෙනත් ආදායම්** | | |
| සම්පත් බැංකුව ප්‍රතිමිලදී ගැනීම් පොළී | - | 2,006 |
| ලියාපදිංචි ගාස්තු | 30,750 | 21,750 |
| කාර්ය මණ්ඩල ණය පොළිය | 2,874,577 | 3,310,165 |
| විවිධ ලැබීම් | 1,095,870 | 4,746,706 |
| ආයෝජන පොළිය ලැබීම් | 357,336,147 | 233,746,005 |
| ආපසු නොගෙවන තැන්පතු | 1,175,100 | 1,222,238 |
| ආපසු නොවිවූ ටිකට්පත් අවලංගු කිරීම මත දඩ | 88,335 | 316,300 |
| ස්වීප් ගිණුම් පොළිය | 19,905,634 | 25,797,746 |
| සත්දින වීක්ෂණ ගිණුම් පොළිය | 19,333,133 | 13,595,186 |
| ටිකට් තීරු පටි ආදායම | 1,520,770 | 3,972,344 |
| අයිතම බැහැර කිරීම | 14,037 | 46,020 |
| කුලී ආදායම් - බස් රථය | 1,031,493 | 536,382 |
| වියදම් ආපසු ලිවීම | 20,574,901 | 13,793,093 |
| බැහැර කරන ලද ප්‍රවර්ධන සහ ත්‍යාග අයිතම විකිණීම මත ලාභය | - | 8,440,470 |
| පරිගණක හා උපාංග විකිණීම මත ලාභය | 259,501 | - |
| මෝටර් සයිකලය විකිණීම මත ලාභය | - | 439,700 |
| ගෘහභාණ්ඩ සහ සවිකිරීම් විකිණීම මත ලාභය | 38,494 | 23,772 |
| ජංගම දුරකථනය විකිණීම මත ලාභය | 86,327 | 21,671 |
| බෙදාහරින්නන්ගේ අඩු කිරීම් | 8,743,210 | 9,975,498 |
| බෙදාහරින්නන්ගේ ලැබීම් කපා හැරීම | 350,562 | - |
| මාස හයට වැඩි චෙක්පත් ආපසු ලිවීම් | 522,482 | 839,591 |
| **මුළු වෙනත් ආදායම්** | 434,981,322 | 320,846,644 |

| දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා | 2023<br>රු. | 2022<br>රු. |
|---|---|---|
| **සටහන 06 - බෙදුහැරීමේ වියදම්** | | |
| **සටහන 06 -I -වෙළෙඳ ප්‍රචාරණය** | | |
| ශනිදා | 27,593,349 | 22,415,406 |
| ලග්න වාසනාව | 29,083,022 | 25,072,727 |
| ජයෝදා | 16,376,326 | 3,467,793 |
| ක්ෂණික | 567,500 | 170,000 |
| සුපර් බෝල් | 27,499,640 | 20,453,385 |
| කප්රුක | 38,229,452 | 31,454,873 |
| සංවර්ධන වාසනාව | - | 2,096,891 |
| අද කෝටිපති | 42,723,499 | 20,522,232 |
| සසිරි | 21,351,000 | 157,225 |
| වාලම්පුරි | 470,713 | 3,200,713 |
| ලකී ෆ්‍රීඩම් | 458,200 | - |
| සුපිරි ධන සම්පත | 15,595,951 | - |
| ආයතනික සහ වෙනත් | 89,052,830 | 47,390,764 |
| බාහිර ප්‍රචාරණය | 9,800,000 | - |
| වෙබ් වෙළඳ ප්‍රචාරණය | 41,985 | 111,271 |
| | 318,843,466 | 176,513,280 |
| **සටහන 06 - II -අලෙවිකරණය සම්බන්ධ ක්‍රියාකාරකම්** | | |
| සභාපතිතුමන්ගේ වැය ශීර්ෂය | - | 920,000 |
| සමරු තිළිණ සහ බැනර් | 4,125,000 | 3,100,000 |
| අලෙවිකරණය සම්බන්ධ වෙනත් වියදම් | 459,030 | 66,545 |
| | 4,584,030 | 4,086,545 |

| | 2023<br>රු. | 2022<br>රු. |
|---|---|---|
| **සටහන 06 - III - විකිණීම සහ බෙදා හැරීමේ වියදම්** | | |
| සමාජ ආරක්ෂණ දායකත්ව බදු - 2.5% | 511,488,326 | 103,087,049 |
| අලෙවි වියදම් | 171,517,326 | 89,364,361 |
| වෙනත් අලෙවි සහ බෙදා හැරීම් (ස්කෑන් කිරීම/වලංගුකරණය) | 11,678,721 | 11,248,176 |
| ප්‍රවාහනය | 36,215,087 | 27,346,925 |
| වාහන සන්නාමකරණ | 1,130,127 | - |
| වෙළඳුන් සහ බෙදාහරින්නන් අභිප්‍රේරණය කිරීමේ පිරිවැය | 305,970,890 | 120,247,878 |
| SO/ASPO දිරි දීමනා | 4,096,003 | 3,330,317 |
| ප්‍රවර්ධන වාහන වියදම් | 1,608,585 | 1,536,197 |
| වාහන කුලියට ගැනීම - ප්‍රවේශ පත්‍ර අලෙවි කිරීම | 93,750 | 525,000 |
| එළිමහන් අවස්ථා / වාර්ෂික ප්‍රවර්ධන කැලැන්ඩරය | 8,263,440 | 473,500 |
| බෙදාහරින්නන්ගේ අලෙවි කාර්ය මණ්ඩලය සඳහා දිරි දීමනා | 2,162,550 | 1,292,040 |
| කොවිඩ් 19 - අලෙවි නියෝජිත ගෙවීම් | - | 190,000 |
| රක්ෂණ වාරික- | 481,559 | 167,184 |
| දිනුම් ඇදීම් යන්ත්‍ර නඩත්තු | 1,869,610 | 1,127,375 |
| ප්‍රචාරක වාහන ප්‍රවර්ධන වියදම් | 4,298,495 | 475,019 |
| ඉවතලන ද්‍රව්‍ය පාඩු | 249,307 | 114,027 |
| මාකුඹුර අලෙවි කුටිය කුලී | 72,000 | 112,000 |
| සිල්ලර සාප්පු වියදම් හරහා විකිණීම | 398,500 | - |
| | 1,061,594,277 | 360,637,049 |

# අවසන් ගිණුම් පිළිබඳ සටහන

| දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා | 2023<br>රු. | 2022<br>රු. |
|---|---|---|
| **සටහන 06 - IV - කොමිස්** | | |
| **අලෙවි නියෝජිත කොමිස් (1)** | | |
| ශනිදා | 699,668,430 | 555,934,721 |
| ලග්න වාසනාව | 1,297,639,755 | 1,140,511,999 |
| ජයෝදා | 117,853,223 | 83,088,563 |
| ක්ෂණික | 58,304,494 | 58,871,625 |
| සුපර් බෝල් | 627,816,968 | 461,722,118 |
| කප්රුක | 995,606,903 | 578,343,233 |
| සංවර්ධන වාසනාව | 95,949,825 | 76,142,288 |
| අද කෝටිපති | 789,067,860 | 619,042,095 |
| සසිරි | 161,142,443 | 116,588,899 |
| වාලම්පුරි | 33,968,138 | 11,024,813 |
| ලකී ෆ්‍රීඩම් | 13,530,938 | |
| සුපිරි ධන සම්පත | 98,481,585 | |
| | 4,989,030,559 | 3,701,270,351 |
| **බෙදාහැරීමේ අලෙවි නියෝජිත කොමිස්** | | |
| ශනිදා | 46,600,065 | 36,967,377 |
| ලග්න වාසනාව | 86,441,727 | 75,855,611 |
| ජයෝදා | 7,849,062 | 5,526,695 |
| ක්ෂණික | 2,275,500 | 2,582,980 |
| සුපර් බෝල් | 41,813,255 | 30,702,677 |
| කප්රුක | 66,304,930 | 38,459,757 |
| සංවර්ධන වාසනාව | 6,390,408 | 5,065,520 |
| අද කෝටිපති | 52,558,088 | 41,163,846 |
| සසිරි | 10,733,330 | 7,758,703 |
| වාලම්පුරි | 2,258,738 | 733,881 |
| ලකී ෆ්‍රීඩම් | 901,388 | |
| සුපිරි ධන සම්පත | 6,559,590 | |
| | 330,686,077 | 244,817,047 |
| | 6,704,738,408 | 4,487,324,271 |

| | 2023<br>රු. | 2022<br>රු. |
|---|---|---|
| **සටහන 07 - පරිපාලන වියදම්** | | |
| කාර්ය මණ්ඩල පිරිවැය | 470,633,011 | 421,675,524 |
| ක්ෂයවීම් | 46,098,384 | 42,364,540 |
| වෙනත් පරිපාලන වියදම් | 190,772,028 | 141,057,857 |
| | 707,503,423 | 605,097,921 |

| | 2023<br>Rs. | 2022<br>රු. |
|---|---|---|
| **සටහන 08 - මූල්‍ය වියදම්** | | |
| බැංකු ගාස්තු - සාමාන්‍ය | 618,431 | 948,746 |
| බැංකු ගාස්තු - ත්‍යාග | 45,000 | 30,450 |
| මුළු මූල්‍ය වියදම් | 663,431 | 979,196 |

| දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා | 2023<br>රු. | 2022<br>රු. |
|---|---|---|
| **සටහන 09 - ආදායම් බදු** | | |
| වසර සඳහා බදු පෙර වියදම මත ආදායම | 3,516,296,477 | 3,266,591,501 |
| ආදායම් බදු ගෙවීමට යටත් නොවන ආදායම | (3,516,296,477) | (3,062,338,167) |
| **බදු ගෙවීමට යටත් වන ආදායම** | - | 204,253,333 |
| | | |
| බදු වියදම | - | 61,276,000 |
| පෙර වර්ෂ සඳහා වැඩිපුර බදු ප්‍රතිපාදන | (106,210,247) | (5,371,541) |
| **වසර සඳහා අයකිරීම /(ආපසු හැරවීම)** | (106,210,247) | 55,904,459 |

| | 2023<br>රු. | 2022<br>රු. |
|---|---|---|
| **සටහන 10 - ජනාධිපති අරමුදලට දායකත්වය** | | |
| ආදායම් බදු ගෙවූ පසු ලාභය | 3,622,506,725 | 3,210,687,041 |
| **ජනාධිපති අරමුදලට ප්‍රේෂණය කළ හැකි අතිරික්තය** | 3,622,506,725 | 3,210,687,041 |
| | | |
| වර්ෂය සඳහා ජනාධිපති අරමුදලට ගෙවූ මුදල | 2,939,776,000 | 2,894,896,000 |
| **ජනාධිපති අරමුදලට ගෙවිය යුතු මුළු මුදල** | 682,730,725 | 315,791,041 |

# අවසන් ගිණුම් පිළිබඳ සටහන

## සටහන 11 - ස්ථාවර වත්කම

| | ඉඩම් | ගොඩනැගිලි | ප්‍රාග්ධන නොනිමි වැඩ | මෝටර් වාහන/ ත්‍රිරෝද රථ/මෝටර් බයිසිකල් | යන්ත්‍රසූත්‍ර | කාර්යාල උපකරණ සහ ජංගම දුරකථන | පරිගණක සහ උපාංග | ලීබඩු සහ සවිකිරීම් | සන්නාම කළ වෙළඳ කුටි | පරිගණක මෘදුකාංග | වෙබ්අඩවි සංවර්ධනය | ජාල පද්ධතිය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 10% | | 20%,25% | 12.50% | 25% 50% | 33.33% | 25% | 16.66% | 33.33% | 33.33% | 33.33% | |
| **පිරිවැය** | | | | | | | | | | | | | |
| 2023.01.01 දිනට ශේෂය | 855,500,000 | 110,276,250 | 3,228,884 | 136,639,338 | 145,327,057 | 31,189,634 | 60,095,976 | 14,914,903 | 8,735,946 | 39,567,788 | 989,655 | 1,774,092 | 1,408,239,523 |
| වර්ෂය තුළ එකතුකිරීම් | | | 6,371,712 | | - | 20,011,518 | 23,326,508 | 1,333,939 | 443,578 | 3,235,200 | | - | 54,722,455 |
| ප්‍රත්‍යාගණනය | 1,358,250,000 | 23,587,500 | | 52,683,662 | (45,598,375) | (1,308,817) | (17,066,238) | (328,584) | | (6,813,852) | (742,241) | | 1,362,663,056 |
| වර්ෂය තුළ බැහැරකිරීම් | | | (1,050,000) | - | | (5,365,513) | (9,957,868) | (1,368,447) | (8,735,946) | (6,184,199) | | | (32,661,974) |
| නිවැරදි කිරීම | | (183,750) | | | 16,250 | (1,110,455) | 1,026,946 | 251,009 | | | | | - |
| | 2,213,750,000 | 133,680,000 | 8,550,596 | 189,323,000 | 99,744,932 | 43,416,367 | 57,425,324 | 14,802,820 | 443,578 | 29,804,937 | 247,414 | 1,774,092 | 2,792,963,061 |
| **ක්ෂයකිරීම** | | | | | | | | | | | | | |
| 2023.01.01 දිනට ශේෂය | | 44,048,230 | | 58,495,101 | 79,947,495 | 21,528,890 | 54,310,271 | 13,037,540 | 8,735,946 | 30,682,771 | 989,655 | 1,170,707 | 312,946,606 |
| ප්‍රත්‍යාගණනය | | (54,993,596) | | (76,015,132.37) | (89,090,468.89) | (8,550,674.43) | (37,257,335) | (9,681,280) | | (9,085,136) | (989,655) | | (285,663,277) |
| වර්ෂය සඳහා ක්ෂය | | 11,027,625 | | 25,615,031 | 16,767,883 | 7,203,029 | 8,257,338 | 1,144,962 | 33,420 | 8,696,032 | | 415,958 | 79,161,279 |
| බැහැර කිරීම සඳහා ක්ෂය කිරීම | | | | | | (5,299,600) | (9,941,311) | (1,368,447) | (8,735,946) | (6,184,199) | | | (31,529,503) |
| මාරුකිරීම | | (82,260) | | | 16,250 | (1,308,184) | 978,675 | 395,519 | | | | | |
| | - | 0 | - | 8,095,000 | 7,641,159 | 13,573,461 | 16,347,639 | 3,528,293 | 33,420 | 24,109,468 | - | 1,586,665 | 74,915,105 |
| 2023.12.31 දිනට ශුද්ධ පොත් ශේෂය | 2,213,750,000 | 133,680,000 | 8,550,596 | 181,228,000 | 92,103,773 | 29,842,907 | 41,077,685 | 11,274,527 | 410,157 | 5,695,469 | 247,414 | 187,427 | 2,718,047,956 |

| දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා | 2023<br>රු. | 2022<br>රු. |
|---|---|---|
| **සටහන 12 - කල්පිරීම දක්වා තබාගෙන ඇති මූල්‍ය වත්කම්** | | |
| ස්ථාවර තැන්පතු - ලංකා බැංකුව / මහජන බැංකුව | 1,619,710,571 | 1,644,481,371 |
| අලෙවි නියෝජිත තැන්පතු - | 90,502,602 | 97,843,516 |
| **මුළු ස්ථාවර තැන්පතු** | 1,710,213,172 | 1,742,324,887 |

| | 2023<br>රු. | 2022<br>රු.. |
|---|---|---|
| **සටහන 13 - භාණ්ඩ තොග** | | |
| **13.1 - ටිකට් පත් තොගය** | | |
| ශනිදා | 1,862,179 | 1,472,005 |
| ලග්න වාසනාව | 4,917,438 | 2,775,781 |
| ජයෝදා | 475,914 | 1,666,753 |
| ක්ෂණික | 25,725,606 | 597,038 |
| සුපර් බෝල් | 1,638,360 | 1,815,473 |
| කප්රුක | 3,237,053 | 6,508,658 |
| සංවර්ධන වාසනාව | - | 636,525 |
| අද කෝටිපති | 2,506,248 | 2,158,941 |
| සසිරි | 239,408 | 2,165,364 |
| වාලම්පුරි | - | 2,689,549 |
| සුපිරි ධන සම්පත | 1,293,038 | |
| **මුළු ටිකට් තොග** | 41,895,243 | 22,486,086 |
| | | |
| **13.2 - වෙනත් තොග** | | |
| ලිපි ද්‍රව්‍ය තොගය | 11,514,474 | 16,573,906 |
| ප්‍රවර්ධන අයිතම තොගය | 1,884,716 | 4,686,519 |
| ත්‍යාග අයිතම තොගය | 1,426,023 | 1,619,078 |
| වෙනත් අයිතම තොග | - | 365,760 |
| ලග්න වාසනා තේ කෝප්ප කට්ටල තොගය | - | 239,262 |
| **වෙනත් තොග එකතුව** | 14,825,212 | 23,484,525 |
| | 56,720,455 | 45,970,611 |

| | 2023<br>රු. | 2022<br>රු. |
|---|---|---|
| **සටහන 14 - වෙළඳ ණයගැතියෝ සහ වෙනත් ලැබිය යුතු** | | |
| ලැබිය යුතු | 9,288,899 | 9,120,678 |
| ණයගැතියෝ - බෙදාහරින්නන් | 70,671,391 | 74,251,312 |
| කාර්ය මණ්ඩලයට ලබා දුන් ණය | 62,065,748 | 75,946,589 |
| උත්සව අත්තිකාරම් | 5,000 | 6,250 |
| ආපසු ගෙවිය යුතු තැන්පතුව | 1,979,114 | 1,579,114 |
| ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සඳහා සුරැකුම් තැන්පතුව (ඇපය) | 1,800,000 | 1,800,000 |
| ස්ථාවර තැන්පතු රඳවා ගැනීමේ බදු බැර | 29,456,011 | 9,627,265 |
| ආදායම් බදු බැර | 653,294 | - |
| එකතුකළ අගය මත බදු බැර | 592,787 | - |
| සුපිරි ධන සම්පත සංවර්ධන පිරිවැය | 40,302,708 | - |
| | 216,814,951 | 172,331,208 |
| අඩුකලා : බොල් ණය සඳහා වෙන් කිරීම් | 8,850,236 | 8,850,236 |
| | 207,964,715 | 163,480,972 |

# අවසන් ගිණුම් පිළිබඳ සටහන

| දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා | 2023<br>රු. | 2022<br>රු. |
|---|---|---|
| | | |
| **සටහන 15 - පෙරගෙවීම් හා තැන්පතු** | | |
| පෙරගෙවුම් | 4,210,225 | 2,290,890 |
| අත්තිකාරම් - අභ්‍යන්තර | 335,261 | 103,011 |
| අත්තිකාරම් - බාහිර | 202,800 | 3,829,527 |
| | 4,748,286 | 6,223,428 |

| | 2023<br>රු. | 2022<br>රු. |
|---|---|---|
| | | |
| **සටහන 16 - මුදල් සහ මුදල් හා සමාන දෑ** | | |
| **බැංකු ශේෂ** | | |
| ලංකා බැංකුව - සාමාන්‍ය ලැබීම් | 176,885,582 | 131,427,543 |
| ලංකා බැංකුව - සාමාන්‍ය - දින 7 | 91,027,021 | 84,059,723 |
| ලංකා බැංකුව - ත්‍යාග | 41,494,877 | 7,261,579 |
| සම්පත් බැංකුව | - | 3,139,750 |
| මහජන බැංකුව | 352,443 | 326,420 |
| ස්වීප් ගිණුම | 422,638,932 | 287,541,203 |
| ප්‍රතිම්ලදී ගැනීම්-සම්පත් බැංකුව | 17,809,654 | 30,968,718 |
| ලංකා බැංකුව- සාමාන්‍ය ගෙවීම් | 996,500 | 997,500 |
| ලංකා බැංකුව | 100,000 | 100,000 |
| ලංකා බැංකුව - 84401075 | 14,414,355 | 9,873,679 |
| මහජන බැංකුව 014-1-002-7-0010010 | 1,223,000 | 990,700 |
| හැටන් නැෂනල් බැංකුව 003010525941 | 4,900 | 4,900 |
| හැටන් නැෂනල් බැංකුව 3010534602 | 1,024,350 | 539,250 |
| | 767,971,615 | 557,230,963 |
| සං.ලො.ම. ආපදා සහන අරමුදල | 9,404 | 9,404 |
| | 9,404 | 9,404 |
| | 767,981,019 | 557,240,367 |

| දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා | 2023 රු. | 2022 රු. |
|---|---|---|
| | | |
| **සටහන 17 - සේවක ප්‍රතිලාභ වගකීම්** | | |
| වර්ෂය ආරම්භයේදී ශේෂය | 56,988,160 | 57,948,091 |
| වර්ෂය තුළ වෙන් කරන ලද ප්‍රතිපාදන | 14,299,799 | 370,214 |
| වර්ෂය තුළ ගෙවීම් | (6,884,568) | (1,330,145) |
| **වර්ෂය අවසානයේ දී ශේෂය** | 64,403,392 | 56,988,160 |
| | | |
| පාරිතෝෂික අරමුදල සඳහා ස්ථාවර තැන්පතුව | 55,322,099 | 61,426,890 |
| **ශුද්ධ ශේෂය** | 9,081,293 | (4,438,730) |
| | | |
| **සටහන 17-1- වසර තුළ වෙන්කරන ලද ප්‍රතිපාදන** | | |
| පොළී පිරිවැය | 4,582,631 | 5,680,527 |
| ජංගම සේවා පිරිවැය | 4,140,173 | 3,802,150 |
| | 8,722,804 | 9,482,677 |
| හඳුනාගත් ශුද්ධ අයුගණක (ලාභ(/පාඩු) | 5,576,996 | (9,112,463) |
| **වර්ෂය තුළ වෙන් කරන ලද මුළු ප්‍රතිපාදන** | 14,299,799 | 370,214 |
| | | |
| **සටහන 17-2- විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය** | | |
| වට්ටම් අනුපාතය | 9.00% | 10.00% |
| වැටුප් වැඩි කිරීම් අනුපාතය | 5% | 5% |
| විශ්‍රාම ගන්නා වයස | 60 | 62 |

වර්ෂය අවසානයේ සේවක ප්‍රතිලාභ වගකීමට සමාන ස්ථාවර තැන්පතුවක් පවත්වාගෙන ගොස් ඇතග

| | 2023 රු. | 2022 රු. |
|---|---|---|
| | | |
| **සටහන 18- ගෙවිය යුතු අලෙවි නියෝජිත සහ බෙදාහැරීම් අලෙවි නියෝජිත** | | |
| ගෙවිය යුතු අලෙවි නියෝජිත තැන්පතු | 35,475,881 | 34,418,881 |
| ගෙවිය යුතු බෙදාහැරීමේ අලෙවි නියෝජිත තැන්පතු | 4,400,000 | 4,300,000 |
| **ගෙවිය යුතු මුළු අලෙවි නියෝජිත සහ බෙදාහැරීමේ අලෙවි නියෝජිත තැන්පතු** | 39,875,881 | 38,718,881 |

# අවසන් ගිණුම් පිළිබඳ සටහන

| දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා | 2023<br>රු. | 2022<br>රු. |
|---|---|---|
| **සටහන 19- වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතු** | | |
| වෙළෙඳ ණය හිමියෝ | 414,095,595 | 361,518,639 |
| අලෙවි නියෝජිත ලබා දුන් අත්තිකාරම් | 671,765 | 671,735 |
| බෙදාහැරීමේ අලෙවි නියෝජිතයන්ට ලබා දුන් අත්තිකාරම් | 65,748,664 | 41,374,642 |
| ගෙවිය යුතු වැට් බදු | 80,850,854 | 60,187,471 |
| සමාජ ආරක්ෂක දායකත්වයී ගෙවිය යුතු බදු | 48,319,916 | 37,039,920 |
| ගෙවිය යුතු බෙදා හැරීමේ අලෙවි නියෝජිතයන්ගේ කොමිස් සහ වලංගු කිරීම් | 31,160,047 | 23,609,041 |
| ගෙවිය යුතු රඳවා ගැනීමේ බද්ද | 26,164,771 | 13,471,731 |
| ගෙවිය යුතු අලෙවි නියෝජිතයන්ගේ සහ බෙදාහරින්නන්ගේ ඉලක්ක | 8,265,387 | 8,855,294 |
| සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ශුභසාධනය | 56,700 | - |
| සේවක වැටුප් අඩුකිරීම් වලින් අලෙවි නියෝජිතයන්ට ගෙවිය යුතු | 25,200 | - |
| ගෙවිය යුතු සේ.අ.අ./සේ.නි.භා.අ. | 3,326,514 | 3,148,224 |
| පොදු සේවක සංගමය | - | 59,000 |
| ආපසු ගෙවිය යුතු ආරක්ෂක තැන්පතු | 1,160,000 | 1,160,000 |
| ගෙවියයුතු ආදායම් බදු සඳහා වෙන් කිරීම් | - | 57,977,908 |
| ආදායම් බදු සඳහා වෙන් කිරීම් (2019) | - | 3,463,533 |
| අලෙවි කුටි සඳහා බෙදාහරින්නන්ට ගෙවිය යුතු | 11,140 | 18,840 |
| ආදායම් බදු සඳහා වෙන් කිරීම් (2016) | | 150,302,773 |
| වැට් බදු සඳහා වෙන් කිරීම් (2016) | 4,651,659 | 4,651,659 |
| වැට් බදු සඳහා වෙන් කිරීම් (2019) | 389,421 | |
| මුද්දර බද්ද | 37,175 | 38,050 |
| ගෙවිය යුතු මාස හය පැරණි චෙක්පත | 196,095 | - |
| රූපවාහිනී නිවේදක ඇඳුමට වැඩිපුර අඩුකරගැනීම් | 170,180 | 388,830 |
| ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු | 1,821,805 | 2,842,501 |
| ගෙවිය යුතු ඊ-ලොතරැයි තැන්පතු | 588,165 | 103,065 |
| රඳවාගැනීම | 3,015,530 | 143,321 |
| **මුළු ණය හිමියෝ** | 690,726,582 | 771,026,177 |

| | 2023<br>රු. | 2022<br>රු. |
|---|---|---|
| **සටහන 20 - ගෙවිය යුතු ත්‍යාග** | | |
| ගෙවිය යුතු ත්‍යාග | 1,344,193,430 | 988,393,015 |
| **ගෙවිය යුතු ත්‍යාග සඳහා වෙන් කිරීම් - දිනා නොගත් දිනුම් ඇදීම්** | | |
| ශනිදා | 16,404,500 | - |
| ජයෝදා | 1,515,740 | - |
| ලග්න වාසනාව | 35,457,700 | - |
| සුපර් බෝල් | 10,749,200 | 3,943,500 |
| කප්රුක | 27,488,580 | 9,810,000 |
| අද කෝටිපති | 18,576,200 | 1,160,000 |
| සුපිරි ධන සම්පත | 2,400,000 | |
| **ගෙවිය යුතු මුළු ත්‍යාග** | 112,591,920 | 14,913,500 |
| | 1,456,785,350 | 1,003,306,515 |

# දස වසරක සාරාංශය

| | 2023 (රු. '000) | 2022 (රු. '000) | 2021 (රු. '000) | 2020 (රු. '000) | 2019 (රු. '000) | 2018 (රු. '000) | 2017 (රු. '000) | 2016 (රු. '000) | 2015 (රු. '000) | 2014 (රු. '000) |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **මෙහෙයුම් ප්‍රතිඵල** | | | | | | | | | | |
| ආදායම | 25,442,132 | 19,071,457 | 15,364,398 | 15,033,029 | 17,065,414 | 15,854,856 | 13,981,500 | 14,759,875 | 11,874,659 | 12,271,477 |
| ටිකට්පත් පිරිවැය | 1,147,660 | 844,241 | 433,523 | 451,308 | 460,097 | 402,323 | 387,697 | 444,990 | 325,360 | 378,157 |
| ත්‍යාග ගෙවීම | 13,450,964 | 9,884,079 | 7,865,640 | 7,702,515 | 8,903,494 | 8,296,413 | 7,263,437 | 7,755,659 | 6,150,951 | 6,211,302 |
| පරිපාලන වියදම් | 707,503 | 605,098 | 536,791 | 506,927 | 541,800 | 463,619 | 419,811 | 382,655 | 332,597 | 347,408 |
| බෙදාහැරීමේ පිරිවැය | 6,704,738 | 4,487,324 | 3,484,492 | 3,357,266 | 4,219,037 | 3,950,410 | 3,541,284 | 3,561,410 | 2,728,440 | 3,067,688 |
| මෙහෙයම් වියදම්වලින් පසු අතිරික්තය | 3,040,176 | 2,820,420 | 2,612,235 | 2,663,353 | 2,550,732 | 2,368,138 | 2,034,129 | 2,412,020 | 2,134,322 | 2,145,085 |
| **හිමිකම්** | | | | | | | | | | |
| ජනාධිපති අරමුදල | 2,200 | 2,200 | 2,200 | 2,200 | 2,200 | 2,200 | 2,200 | 2,200 | 2,200 | 2,200 |
| මහපොල භාර අරමුදල | 2,200 | 2,200 | 2,200 | 2,200 | 2,200 | 2,200 | 2,200 | 2,200 | 2,200 | 2,200 |
| ජනාධිපති අරමුදලට ගෙවිය-යුතු | 682,731 | 315,791 | 564,219 | 685,860 | 477,793 | 237,466 | 107,862 | 52,633 | 99,010 | 250,598 |
| ත්‍යාග සංචිත ගිණුම | 139,106 | 725,956 | 448,132 | 698,559 | 1,103,197 | 971,046 | 810,029 | 805,435 | 934,026 | 877,036 |
| **වගකීම්** | | | | | | | | | | |
| ජංගම නොවන වගකීම් | 48,957 | 34,280 | 37,656 | 40,027 | 36,110 | 35,395 | 38,180 | 1,318,429 | 1,615,846 | 223,288 |
| ජංගම වගකීම් | 2,315,313 | 1,897,686 | 1,733,768 | 1,209,938 | 1,484,836 | 1,414,220 | 1,722,249 | 1,237,896 | 846,842 | 581,768 |
| **වත්කම්** | | | | | | | | | | |
| ජංගම නොවන වත්කම් | 2,718,048 | 1,095,293 | 1,158,676 | 1,236,649 | 1,252,626 | 721,352 | 670,526 | 1,372,755 | 1,537,875 | 1,594,826 |
| ජංගම වත්කම් | 2,747,628 | 2,515,240 | 2,246,952 | 2,013,724 | 2,429,225 | 1,941,174 | 2,012,195 | 684,044 | 405,087 | 342,264 |

# සටහන්